SINHALI - 207

# ක්‍රිස්තියානි මුස්ලිම් සංවාදයක්

වෛද්‍යාචාර්ය

## එච්. එම්. බාගිල් එම්. ඩී.

සිංහල පරිවර්තකය

එස්. එම්. මන්සූර්

The Co-operative office for Call & foreigners Guidance at Sultan

**The Co-operative Office for Call & foreigners Guidance at Sultanah**
Under the supervision of Ministry of Islamic Affairs and Endowment and Call and Guidance
Tel. 4240077 Fax 4251005 P.O. Box 92675 Riyadh 11663 E-mail: Sultanah22@hotmail.com

# ක්‍රිස්තියානි මුස්ලිම් සංවාදයක්

වෛද්‍යාචාර්ය

එච්. එම්. බාගිල් එම්. ඩී.

සිංහල පරිවර්තකය

එස්. එම්. මන්සූර්

ප්‍රකාශනය

කැඳවීමේ හා මග පෙන්වීමේ සහයෝගී කාර්යාලය

අල් බදීයාහ් - සමාජ ඒකකය

රියාද්

සවුදි අරාබියාව

*මෙම*
*සිංහල අනුවාදයෙ හි*
*සඳහන් වන*
*සියලු ම බයිබල් වාක්‍ය*
*උපුටා ගනු ලැබුවේ,*
*ශ්‍රී ලංකාවේ*
*කොළඹ - 3 ගාලු පාරේ*
*අංක 293 දරන ස්ථානයෙ හි පිහිටි*
*'ශ්‍රී ලංකා බයිබල් සමාගම' විසින්*
*වර්ෂ 1938 හි දී*
*ප්‍රකාශනයට පත් කළ*
*'ශුද්ධ බයිබලය' මගින් ය.*

**CHRISTIAN - MUSLIM DIALOGUE**
BY
**H. M. BAAGIL M. D.**

SINHALA TRANSLATION:
BY
**S. M. MANSOOR**

*PUBLISHED:*
BY
**THE COOPERATIVE OFFICE FOR CALL & GUIDANCE**
AT AL - BADIAH
P. O. BOX 24932, RIYADH - 11456, K. S. A.
T' PHONE: 433 0888, 433 0470
FAX: 430 1122

මනුෂ්‍යයිනි !
ඔබත් ඔබට පෙරාතුව සිටියවුනුත් මැවූ
ඒ ස්වාමියා (අල්ලාහ්) ට අවනතවන්න.
මෙලෙසින් පමණකි
ඔබට ඔබ ව බේරාගත හැක්කේ.
ඔබට පොළොව යහනාවක් හා
අහස වියනක් කෙළේ ඔහු ය. තව ද,
ඔබගේ පෝෂණය සඳහා
සෑම ආහාර වර්ගයක් ම වැඩීම සඳහා
අහසින් වැසි වස්සවන්නේ ඔහු ය.
එබැවින්, ඔබ මෙය (පැහැදිලි ව) දත් විට,
අල්ලාහ් සමග සම තැන් ගැනීමට
සමානයන් සාද නොගත යුතුයි.

සත්‍යය අසත්‍යය සමග මුසුකොට
අවුල් නොකරන්න.
දැන දැන ම
සත්‍යය වසන් නොකරන්න.

කෙනෙකුට තව කෙනෙකුගෙන්
පිහිටක් පැතිය නොහැකි,
කෙනෙකුට තව කෙනෙකු වෙනුවෙන්
මැදිහත් වීමක් කළ නොහැකි,
කිසිම වන්දියක්
කෙනෙකුගෙන් භාර නොගනු ලබන,
වැරදිකරුවන්ට
කිසි ම අතකින් සරණක් නොලැබෙන
දිනය ගැන සිතා
ඉන් ආරක්ෂා වීමට සූදනම් වන්න.

*අල් කුර්ආන්, සූරා අල් බකරා, වාක්‍ය 21-22, 42 හා 48.*

## සත්‍යය වෙත නැඹුරු වූ හදවතකින් ....

**කුඩා කල පටන්**
**ක්‍රිස්තියානි ඇදහීම් අනුව හැදුණු වැඩුණු**
**මම ඇමරිකානුවෙක්මි.**
**එක ම දෙවියන් වූ අල්ලාහ් සොයා**
**මගේ ආධ්‍යාත්මික ගමන ආරම්භ කිරීමට පෙර,**
**මම බොහෝ සේ වැරදි ව හැසුරුණු කෙනෙක්මි.**
**එකල් හි මෙම "ක්‍රිස්තියානි - මුස්ලිම් සංවාදයක්" නම් වූ**
**අගනා පොතේ මුල් පිටපත ලදිමි.**
**එය එක් වතාවක් දෙවතාවක් නොව නැවත නැවතත්**
**කීප වතාවක් ම කියවූයෙමි; එහි ඇති අදහස් අනුව වාද විවාද කළෙමි.**
**අවසානයේ දී, මෙහි අඩංගු කරුණු පිළිබඳ ව සෑහෙන දැනුමක් ද**
**ශුද්ධ වූ බයිබලයේ "කිංග් ජේම්ස්" අනුවාදයෙන් හා**
**ශුද්ධ වූ කුර්ආනයෙන්**
**උපුටාගත් වාක්‍ය රැසක් ගැන දැනුමක් ද ලබා ගතිමි.**

**දැන්, ඉස්ලාමය ගැන මනා අවබෝධයක් ලත් මා**
**එය මුළු හදවතින් ම පිළිගත් බවට සාක්ෂි දරමි:**

**"අෂ්හදු අන්ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීකලහු**
**ව අෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු ව රසූලුහු"**

මෙහි තේරුම මෙය යි:
**"අල්ලාහ් හැර (නැමදීමට, අවනත වීමට, නීති සම්පාදනය කිරීමට)**
**වෙන දෙවි කෙනෙක් නැත; මුහම්මද් සල්ලල්ලාහු අලෛහි ව සල්ලම් තුමා**
**අල්ලාහ්ගේ දසයෙක් හා වක්තෘවරයෙක් වෙයි."**

**මෙම මූලික වූත්, ඉතා පැහැදිලි වූත් සාක්ෂිය**
**මුළු මානව සංහතිය ම පිළිගෙන, කවද හෝ**
**අල්ලාහ්ට අවනත වන බව මම ස්ථිරව ම විශ්වාස කරමි.**

කෙටියෙන් හා කියවීමට ඉතා පහසුවෙන් සකසා ඇති මෙම පොත් පිංචය, ලොව වෙසෙන සෑම කෙනෙක් ම කියවනවා ඇතැ යි මම බලාපොරොත්තු වෙමි. තව ද, ශාන්තිය ගෙනදෙන සත්‍ය මාර්ගයක් සොයමින් සිටින බොහෝ දෙනා, මෙය කියවා ඉස්ලාමය පිළිගන්නා බව ද මම මුළු හදවතින් ම විශ්වාස කරමි.

***රෝයි අර්ල් ජෝන්සන්***

මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන් ......

# හැඳින්වීම

'ක්‍රිස්තියානි - මුස්ලිම් සංවාදයක්' යන අගනා පොතේ මුල් පිටපත කියවීමටත්, සත්‍යය අවබෝධ කරදෙන සාක්ෂිවලින් සමන්විත මෙයට හැඳින්වීමක් ලිවීමටත්, අවස්ථාව සලසා දුන් අල්ලාහ්ට පමණකි ප්‍රශංසා සියල්ල හිමිවන්නේ.

එක් කලෙක, බොහෝ දෙනෙක් සත්‍ය බව විශ්වාස කළ (අදත් විශ්වාස කරන) බොහෝ කරුණු කෙරෙහි අභියෝගයක් දක්වන සාක්ෂි රැසක් මෙම පොතෙහි අඩංගු වී ඇත. එම සාක්ෂි, ආගම් යංසන්දනය කරමින් සත්‍යය සොයා යන සියලු දෙනාම මවිතයට පත්කරන සුළු ය.

වෛද්‍යාචාර්ය හසන් එම්. බාගිල් තුමාගේ මෙම කෘතිය, ඔහුගේ පර්යේෂණවලින් ලබාගත් සත්‍ය කරුණු හා ඒ අනුව ගත් තීරණයන් කෙටියෙන් හා පැහැදිලි ව ගෙන දක්වයි. ආචාර්ය බාගිල් තුමා වසර හතරකට අධික කාලයක් කිතු දහම හා බයිබලය ගැන ගැඹුරු පර්යේෂණයක් පවත්වා ඇත. එයින් එතුමා ලත් කරුණු හා විස්තර අපමණය.

ප්‍රධාන වශයෙන්, ක්‍රිස්තු භක්තිකයින් තම ප්‍රධාන විශ්වාසිත (ත්‍රිත්වය, යේසුස් වහන්සේගේ දේවත්වය වැනි) කරුණුවල භේද වනවා පමණක් නොව, ක්‍රිස්තියානි සභාවේ අනේක ප්‍රතිපත්ති බයිබලයේ අදහස් සමග ගැටෙන බව හෝ බයිබලය අනේක තැන් හි එයට ම පටහැනි වන බව හෝ, ඔවුහු නොදැන සිටින බවත් ආචාර්ය බාගිල් තුමා සැකයෙන් තොර ව දැන ගත්තේ ය. තව ද, එතුමා තමාගේ පර්යේෂණ පවත්වාගෙන ගිය එම කාලය තුළ ක්‍රිස්තියානි පාදිලිවරුන් හා බැතිමතුන් සමග බොහෝ විට සාකච්ඡාවන් පැවැත්වූයේ ය: සංවාදයන් හි යෙදුනේ ය. මෙම කෘතිය සකස් කිරීමට ඒවායෙන් ලැබුණු රුකුල හා උනන්දුව කිව නොහැකි තරම් ය.

බයිබලය මනා සිහිබුද්ධියෙන් යුතු ව කියවන කෙනෙක් - යේසුස් වහන්සේ තමා දෙවි කෙනෙකු බව කිසිවිටෙක නොකී බවත්, උන්වහන්සේ කුරුසියේ මරණයට පත් නොවූ බවත්, උන්වහන්සේ පැවැත් වූ ප්‍රාතිහාර්‍යය වෙනත් වක්තෘවරුන් විසින් පමණක් නොව මිථ්‍යා දෘෂ්ටිකයින් විසින් පවා පවත්වා ඇති බවත්, උන්වහන්සේ ම වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාගේ පැමිණීම පිළිබඳ අනාවැකි පවසා ඇති බවත් දැනගන්නාවිට පුදුමයට පත්වනවාට සැක නැත. මෙම කරුණු ඇතුළු ව තවත් කරුණු රාශියක් බයිබලයේ සාක්ෂි ඇති ව, සවිස්තර ව මෙම පොතෙ හි ගෙන දක්වා ඇත.

එකිනෙකට පටහැනි වූ මෙම කරුණු මනාව දැනගන්නා කෙනෙකුගේ සිතෙහි 'බයිබලය දේව ග්‍රන්ථයක් ද?' යන ප්‍රශ්නය මතුවෙනවාට කිසිදු සැකයක් නැත. ආචාර්ය බාගිල් තුමාගේ උත්සාහය වන්නේ කිතු බැතිමතුන් අපහාස කිරීම නොවෙයි:

යේසුස් වහන්සේ හා උන්වහන්සේගේ අනුශාසනා සමච්චලයකට භාජනය කිරීම ද නොවෙයි. එවැනි චේතනාවන්ගෙන් අල්ලාහ් අප සැම බේරා ගනිත්වා !

නියත වශයෙන් ම ආචාර්ය බාගිල් තුමා කල්පනා කොට ඇත්තේ, අප කාටත් යහපතක් කිරීමට මිස අයුක්තියක් කිරීමට නොවන බව එතුමාගේ මෙම පොත කියවන යමෙක් වටහාගන්නවා ඇත. එතුමාගේ ප්‍රයත්නය වනුයේ දෙවියන්ට හා ඔහුගේ වක්තෘවරුන්ට විරුද්ධ ව නගා ඇති චෝදනා ද, ඔවුන් ගැන දක්වා ඇති වැරදි අදහස් ද, ඔවුන් වටා ගොතා ඇති අමූලික බොරු ද, ඔවුන් ව අපහාස කිරීමට යොදගත් පාපකාරී ක්‍රියා බවත්, ඒවා නිසා දෙවියන්ගේ කෝපයට ලක්වන බවත් පෙන්වා දී, එවැනි ක්‍රියාවන් හි යෙදෙන්නන් යහමගට කැඳවීම ය.

'ක්‍රිස්තියානි - මුස්ලිම් සංවාදයක්' නමැති මෙම පොත ඉහත සඳහන් කරුණු පිළිබඳ ඉස්ලාමීය ආකල්පය කුමක් ද 'යි පැහැදිලි කරයි. තව ද, යේසුස් වහන්සේට වර්ෂ 600 ට පසු ව පැමිණි අවසාන වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාට අනාවරණය වූ අල් කුර්ආනය, යේසුස් වහන්සේ ගෙන ආ දේව පණිවුඩයෙ හි දැනුවත් ව හෝ නොදැනුවත් ව හෝ ඇතුල් වී ඇති වැරදි, කෙසේ නිවැරදි කරන්නේ ද යන්න ද මනාව පැහැදිලි කරයි.

මෙම පොත මුස්ලිම්වරුන්ට මෙන් ම කිතු බැතිමතුන්ට ද ඉතා වටිනා ඥානාගාරයක් වෙයි. විශේෂයෙන්, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආගම් දෙක අතර ඇති වෙනස හා සත්‍යතාවය දැනගැනීම පිණිස සාකච්ඡාවන් හි යෙදෙන්නන් හට අවශ්‍ය කරුණු ගෙනදෙන අගනා වස්තුවක් වෙයි. මුස්ලිම්වරුන්, කිතු බැතිමතුන් ඉස්ලාමය වෙත කැඳවීමට කරන ප්‍රයත්නයන් හි මෙම පොත කාර්ය සාධක උපකරණයක් වනවා ඇත. ඉන් ෂා අල්ලාහ් !

කිතු බැතිමතුන් විවෘත සිතකින් යුතු ව මෙම පොත කියවන්නේ නම්, ඇත්ත වශයෙන් ම බයිබලය උගන්වන කරුණු මොනවා ද? යේසුස් වහන්සේ දේශනා කළේ මොනවා ද? යන්න වටහා ගන්නවා ඇත. මුස්ලිම් නොවන අය මෙම පොත කියවූ විට ඔවුන් සත්‍යය වටහා ගෙන, 'ඇත්තේ එක ම දෙවියෙකි: ඔහු අල්ලාහ් ය: මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දසයා හා වක්තෘවරයාණන් යැ'යි මුවින් පවසා මුස්ලිම් වන බව මුස්ලිම්වරයෙකු වශයෙන් මම ස්ථිරව ම විශ්වාස කරමි.

අසත්‍ය අන්ධකාරය පළවා හැර, සත්‍ය ආලෝකය ලබාදීමට ආචාර්ය බාගිල් තුමා ගත් මෙම ප්‍රයත්නය අල්ලාහ් පිළිගනිත්වා! එතුමාට ඉතා උසස් තිළිණ හා දයාදයන් පිරිනමත් වා!

*අල්ලාහ්ගේ අනුග්‍රහය හා ආශිර්වාදය අප සියලු දෙනාට ම ලැබේවා!*

**• මුහම්මද් ඒ නුබ්**

## කර්තෘ කථා කරයි .....

මහා කාරුණික අති දයාන්විත
අල්ලාහ්ගේ නාමයෙන් ......

මම
ක්‍රිස්තියානි පාදිලිවරුන් හා
එම ආගමේ වෙනත් බැතිමතුන් සමග
පැවැත් වූ සංවාද සමහරකින්
ලද ප්‍රතිඵලයකි
මෙම පොත් පිංචය.

අප පැවැත් වූ එම සංවාද
ආචාර සම්පන්නව හා
ප්‍රිය උපදවන අන්දමින්
තිබුණු අතර
ඒවා හි සහභාගි වූ සියලු දෙනාට ම
ඉතාමත් ප්‍රයෝජනවත් ව ද තිබුණේ ය.
විශේෂයෙන් කිවයුතු කරුණක් නම්
එම සංවාදයන් හි සහභාගි වූ
කිසි ම කිතු බැතිමතෙකුගේ
ආගමික හැඟීම් පෑරෙන අන්දමින්
එකකුදු අදහසක් ඒවා හි නොවීම ය.

මෙම පොත් පිංචය
සිතිවිලි පුබුදු කරවන සුළු ය:
කිතු දහමට අභියෝගයක් ය:
ආගම් සංසන්දනය කරමින්
සත්‍යය සොයා යන
සහෝදර සහෝදරියන්ට
අගනා අත්පොතක් ය.

**එච්. එම්. බාගිල් එම්. ඩී.**

වර්ෂ 1984 ජනවාරි මාසය.

# පෙරවදන

මිනිසා ලබා ඇති සම්පත්වලින් බුද්ධිය තරම් වටිනා තව එකක් මේ මිහිපිට නොමැත. මෙම බුද්ධිය තුළින් ඔහු ලොව ඇති අනෙක් ජීවීන්ගෙන් වෙන් වී ඉතාමත් උතුම්, විශිෂ්ට තැනක් ලබා සිටියි. මිනිසා මෙසා විශාල බුද්ධියක් ලබා ඇත්තේ නිකමට නොවන බවත්, යන්නන් වාලේ යන්නටවත් නොවන බවත් අපි වටහාගත යුතු ය.

අපි අලුයම නින්දෙන් අවදි වූ විනාඩිය පටන් නැවතත් නින්දට යන අවස්ථාව දක්වා ම නොයෙකුත් කාර්යයන් හි නියුතු වන්නෙමු. එම කාර්ය ජීවිතයේ නොයෙක් ක්ෂේත්‍රයන්ට අදළ ඒවා වේ. මෙම කාර්ය සියල්ලෙහි ම අපගේ වටිනා බුද්ධිය ප්‍රයෝජනවත් කරගෙන යහමග යෑම අවශ්‍යයි. එසේ නැතිව බුද්ධිය පැත්තකට දමා තමන් සිතූ පරිදි කටයුතු කිරීම හෝ අන් අයගේ අදහස් අන්ධයන් මෙන් සිතට ගෙන ගමන් කිරීම හෝ මෝඩකමකි: බුද්ධියට නිගා කිරීමකි. අද සිදු වී තිබෙන්නේ මෙයයි. බුද්ධිය තුට්ටුවකටවත් ගණන් නොගෙන අනුන්ගේ අදහස් ඔස්සේ අඳුර කරා යාම මිනිසාගේ සිරිතක් වී ඇත. මෙයින්, අසහනය, අධර්මිෂ්ඨකම, විෂමාචාරය වැනි දේ රජ කරයි.

බටහිර ක්‍රිස්තියානි ලොවෙ හි ඇති වූ විද්‍යාත්මක දියුණු ව නිසාම ඔවුන්ගේ ආගමික, සංස්කෘතික අදහස් හා මගපෙන්වීම් හරි ද, වැරදි ද යන්න පරීක්ෂා නොකොට පිළිගෙන, ලොව ඒ මාර්ගයේ යන්නේ ය: ඔවුන්ගේ අඩ නිරුවත් ඇඳුම් අපගේ තරුණ තරුණියන් ලබාගත් විශේෂ වරප්‍රසාද මෙන් තකා , ඒවා ඇඳ තෘප්තිමත් වන්නේය.

මෙවැනි අවධියක මහාචාර්‍ය බාගිල් තුමාගේ මෙම කුඩා පොත සෑම මිනිසෙකුගේ ම බුද්ධියට තට්ටු කරයි. කිතු දහමේ හා එම දහම අදහන්නන්ගේ ඇදහීම්වල ඇති වැරදි නිසියාකාර ව, සාක්ෂි ඇති ව මෙහි පහද දෙයි. මෙම පොත විවෘත සිතකින් යුතු ව කියවීම ද, මෙහි ඇති කරුණු ගැන හුදකලාව ඉඳ කල්පනා කිරීම ද, සත්‍යය වැටහුණ කල එය සිත් සතුටින් පිළිගෙන ඒ අනුව තම ජීවිතය හැඩගස්වා ගැනීම ද ඉතා යෝග්‍ය වන්නේ ය: බුද්ධියට තැනක් දුන්නා බඳු ය.

මෙම පොත සිංහල භාෂාවෙන් පරිවර්තනය කරදුන් ශ්‍රී ලාංකික එස්. එම්. මන්සූර් මහතාටත්, මෙයට නන් අයුරින් සහාය දුන් එම්. යූ. එම්. රහ්බි මහතා සහ ෆරිනා රයිසුල් ඉස්ලාම් මහත්මියටත්, මෙය මේ තරම් යහපත් ලෙසට මුද්‍රණය කිරීම සඳහා අකුරු 'ටයිප් සෙට්' කරදුන් එම්. එම්. රෆියුද්දීන් මහතාටත් අල්ලාහ්ගේ ආශිර්වාද හා අනුග්‍රහය සැමද ලැබේවායි ප්‍රාර්ථනා කරමු. මෙම පොත කියවන සෑම කෙනෙකුගේ ම සිතේ ඇති වැරදි මත දුරු වී ඔවුනට මෙලොව යහමග ද එලොව අල්ලාහ් ගේ තෘප්තිය ද ලැබේවා යි ද ප්‍රාර්ථනා කරමු.

- ප්‍රකාශකයෝ -

තැ. පෙ. අංක 24932
රියාද් - 11456, සවුදි අරාබියාව
1995 - 03 - 25

# ඇතුල් පිටුවල .......

## සංවාදය

1. කිතු බැතිමතෙකුගේ හා මුස්ලිම් වරයෙකුගේ පළමු හමුව ...... 1
2. ශුද්ධ වූ බයිබලය ? ........................................ 24
3. ත්‍රිත්වය කාගේ නිපැයුමක් ද? ........................................ 41
4. යේසුස් වහන්සේ දෙවිකෙනෙක් ? ........................................ 51
5. යේසුස් වහන්සේ දේව පුත්‍රයෙක් ? ........................................ 65
6. යේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලැබුවේ ද? .............. 72
7. පාපෝච්චාරණය සහ මුල් පාපය ........................................ 82

## බයිබලයෙහි සඳහන් වන මුහම්මද් (සල්) තුමා

1. ආශිර්වාද ලත් ඉස්මායෙල් සහ ඊසාක් දෙදෙනා .................... 86
2. වක්තෘවරයෙක් පිළිබඳ වූ යෙරෙමියාගේ මිම්ම ........................ 94
3. ෂිලෝ (SHILOH) පැමිණෙන තෙක් ........................................ 95
4. බක්කා යනු මක්කාව වේ ! ........................................ 96
5. මගේ කීර්තිය ලොවට දන්වන මාළිගය ........................................ 97
6. කොටළුවන්ගේ රථය සහ ඔටුවන්ගේ රථය ........................................ 99
7. මෝසෙස් ට සමාන වූ වක්තෘවරයා ........................................ 102
8. මගේ මෙහෙකරුවා, පණිවිඩකාරයා සහ තෝරා ගනු ලැබූ තැනැත්තා ........................................ 106
9. දවිත් රජු ඔහු ව ඇමතුවේ 'මාගේ ස්වාමීනී' යනු ය ............ 111
10. ඒ වක්තෘවරයා ඔබ ද? ........................................ 112
11. ශුද්ධ වූ ආත්මයෙන් සහ ගින්නෙන් බව්තීස්ම කිරීම .............. 113
12. ස්වර්ග රාජ්‍යයේ කුඩා තැනැත්තා ........................................ 113
13. සමාදානය කරන්නෝ ආශිර්වාද ලද්දෝ ය ........................................ 114
14. සැනසුම ගෙන දෙන්නා ........................................ 115
15. වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාට අනාවරණය වූ දේව වාක්‍ය ........................................ 120

මෙම පොතෙ හි ඇති අධෝ ලිපි සියල්ල සිංහල පරිවර්තක
එස්. එම්. මන්සූර් මහතා විසින් ලියන ලද ඒවා වෙයි.

# 1

# කිතු බැතිමතෙකුගේ හා මුස්ලිම්වරයෙකුගේ පළමු හමුව!

**කිතු බැතිමතා*** : පසුගිය අවුරුදු දහය තුළ ක්‍රිස්තියානීන් හා මුස්ලිම්වරුන් අතර ඔවුනොවුන්ගේ ඇදහීම් පිළිබඳ ව නොයෙකුත් සංවාදයන් පැවතී ඇත. මීට හේතුව කුමක් ද?

**මුස් ලිම්වරයා**** : අපගේ දෙපාර්ශ්වයට ම පොදු වූ කරුණු රාශියක් තිබීම මීට හේතු වන බව මම සිතමි. මෙලොවට වක්තෘවරුන් බොහෝ දෙනෙක් එවූ එක ම මැවුම්කාරයා කෙරෙහි අපි විශ්වාසය තබන්නෙමු: යේසුස් වහන්සේ ආශිර්වාද ලත් "මෙසායා"[1] (Messaih) ලෙසත්, දෙවියන්ගේ වචනයක් ලෙසත් විශ්වාසය තබන්නෙමු. එහෙත්, යුදෙව්වන් මෙම කරුණු විශ්වාස නොකරති.

අල් කුර්ආනය මෙසේ පවසයි:

> **"මලාඉකාවරු පැවසූ හ: මර්යම්! නියත වශයෙන් අල්ලාහ් තමන්ගෙන් වූ වචනයකින් ඔබට (පුතෙක් ලැබීම ට ඇති බව) ශුභාරංචියක් පවසයි. ඔහුගේ නම මසීහ්, මර්යම්ගේ පුත් ඊසා යනු වේ. ඔහු මෙලොවෙහි ද එලොවෙහි ද ගෞරවයෙන් යුතු වූ ද, (දෙවියන්ට ඉතා) සමීපවූවන්ගෙන් කෙනෙක්ව ද සිටියි."[2]**

මුස්ලිම්වරුන් හා ක්‍රිස්තියානින් අතර යුරෝපය, කැනඩාව, ඇමරිකාව, හා ඕස්ට්‍රේලියාව ආදී රටවල සාකච්ඡා පවත්වා ඇත. වැටිකන් නුවර[3] (ක්‍රිස්තියානි) ශාස්ත්‍රඥයින් හා ඊජිප්තුවේ මුස්ලිම් විශාරදයින් 1970 දී රෝමයේදීත්, 1974 හා 1978 දී (ඊජිප්තුවේ අගනුවර වූ) කයිරෝවෙහිදීත් සාකච්ඡා පැවැත්වූහ. එමෙන්ම වැටිකන් නුවර ශාස්ත්‍රඥයින් සවුදි අරාබියාවේ මුස්ලිම් විශාරදයින් සමග 1974 දී රෝමයේ සාකච්ඡා කළ හ. (ශ්‍රී ලංකාවේ අගනුවර වූ) කොළඹ ද නොයෙකුත් සංවාද පැවැත් වූ අතර, ඉස්ලාමීය ඇදහිම් විස්තර කරන මෙන් මුස්ලිම්වරුන් විටින් විට ක්‍රිස්තියානි දේවස්ථාන වෙත කැඳවනු ලැබූ හ.

---

* මින් ඉදිරියට **කිතු බැතිමතා** යන්න **කි. බැ** යනුවෙන් සඳහන් වෙයි.

** මින් ඉදිරියට **මුස්ලිම්වරයා** යන්න **මුස්** යනුවෙන් සඳහන් වෙයි.

1. මෙසායා (**Messaih**): අරාබි භාෂාවෙන් **මසීහ්** නම් වේ.
2. අල්කුර්ආන් 3 : 45
3. වැටිකන් නුවර: රෝමයේ පාප් තුමාගේ රාජ්‍යය මෙනමින් හැඳින්වේ.

**ක්‍රි. බැ:** ක්‍රිස්තියානි ආගම වර්ෂ 2000 ක් පමණ පැරණි ය.. ඉස්ලාමය වර්ෂ 1400 කින් පමණ පැරණිය. එසේ නම් දැන් පවත්වන මෙම සංවාදයන් ශත වර්ෂ ගණනාවකට පෙර නොපැවැත්වූයේ ඇයි දැ'යි කිව හැකි ද?

**මුස් :** මුස්ලිම්වරුන් අධික ලෙස වෙසෙන ආසියාතික හා අප්‍රිකානු රටවල් ගණනාවක් පසුගිය ශත වර්ෂ තුන හතරක් ම බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ඕලන්දය, බෙල්ජියම, ස්පාඤ්ඤය හා පෘතුගීසිය වැනි රටවල් වලට යටත්ව තිබුණි. එම අවස්ථාවේ ක්‍රිස්තියානි මිෂනාරි වලට අයත් බොහෝ ආක්‍රමිකයින් නොයෙකුත් උපක්‍රම යොදමින් ද, දුගී දුප්පත් මුස්ලිම්වරුන්ට වෛද්‍ය ප්‍රතිකාර, ඇඳුම්, ආහාර පානාදිය, රැකියා වැනි දේ සපයා උදව් උපකාර කිරීමෙන් ද තම ආගමට හරවා ගැනීමට දැඩි ලෙස උත්සාහ කළ හ. නමුත් මුස්ලිම්වරුන්ගෙන් ඉතා ටික දෙනෙකි ඔවුන්ගේ ආගමට හැරුනේ. සමහරු ක්‍රිස්තියානි ආගමෙන් තමන්ට ශිෂ්ඨාචාරය සහ අධ්‍යාපනික දියුණුව ලැබුණු බවට වැරදි මතයක් ඇති කරගෙන එම ආගම කරා ගිය හ. ඇත්ත වශයෙන් ම යුරෝපයේ දේවස්ථානය (ක්‍රිස්තියානි මහා සභාව) හා රජය වෙන වෙන ම ක්‍රියාකාරී වන අන්දමින් වෙන් කිරීමෙන් පසුව ය, ඔවුන් අදහස් කරන මෙම දියුණුව ලැබුවේ.

දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසු, ආසියාතික හා අප්‍රිකානු රටවල්හි විසූ මුස්ලිම්වරුන් බොහෝ දෙනෙක් බටහිරට ගොස් පදිංචි වූහ මොවුනතර කම්කරුවන් හා වෘත්තිය රැකියාවන් කරන අය බොහෝ දෙනෙක් සිටියහ. මෙම පදිංචි වීම මුස්ලිම්වරුන් ක්‍රිස්තියානි ජනතාව සමග ඉතා සමීප වූ සම්බන්ධතාවයන් ඇති කර ගැනීමට හේතු විය. මේ අතර මුස්ලිම් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් විශාල පිරිසක් ද බටහිරට ඉස්ලාමය හඳුන්වා දීමෙ හි දැඩි උනන්දුවෙන් ක්‍රියාකරන්නට වූහ.

**ක්‍රි. බැ :** මෙකල, මෙවැනි සංවාද අධික ලෙස පැවැත්වීමට වෙනත් හේතු තිබේ ද?

**මුස්.** :මෙම දෙපාර්ශ්වය ම තම තමන්ගේ ආගම්වලට අන් අය හරවා ගැනීමේ තරඟකාරිත්වයෙන් යුතුව ක්‍රියාකළ මුත්, ඉස්ලාමය ප්‍රත්‍යක්ෂව බැලීමට කිතු බැතිමතුන් වැඩි වැඩියෙන් උනන්දු වූ නිසාත්, එකිනෙකා අන් මතයන්ට විරුද්ධව ක්‍රියා නොකරන තත්ත්වයක් උදා වූ නිසාත් මොවුනතර පවතින පරතරය ක්‍රමානුකූලව අඩු වී ගෙන එන බවයි මම අදහස් කරන්නේ. මුහම්මද් "රැවටිලිකාරයෙක්, " කාර්යක්ෂම නොවූ තැනැත්තෙක්", මී මැස්මොර රෝගියෙක්", යනුවෙන් ක්‍රිස්තියානි ගුරුවරයෙක් නිතර නිතර කී බව මට තවමත් මතකයි. දැන්, මෙලෙස ඉස්ලාමයට නින්දා අපහාස කරන ලේඛකයින් ඇත්තේ සුළු කොටසක් බව ඔබට වැටහෙයි.

මුස්ලිම්වරුන් වන අපි, යුදෙව්වන්ට, මිත්‍යා දෘෂ්ටිකයන්ට ද වඩා කිතු බැතිමතුන්, අපට ළංවුවන් බව නිසැකව මම විශ්වාසය තබා ඇත්තෙමු.

අල් කුර්ආනය මෙසේ පවසයි.

> **"නියත වශයෙන් ම යුදෙව්වන් හා මිත්‍යා දෘෂ්ටිකයින් මුඃමින්වරුන්ට (ඉස්ලාමය අදහන්නන්ට) දැඩි ලෙස වෛර කරන්නන් ලෙස (නබිතුමාණෙනි) ඔබ දකින්නේ ය. නියත වශයෙන් ම අපි ක්‍රිස්ත යානීන් වෙමු"යි පවසන්නන් මුඃමින්වරුන්ට ස්නේහයෙන් ඉතා සමීපවූවන් ලෙස (නබිතුමාණෙනි) ඔබ දකින්නේ ය. මන්දයත්, ඔවුනතර භක්තිමත් උගතුන් ද තාපසවරුන් ද සිටිති. තව ද, ඔවුහු අහංකාර වන්නේ ද නැත."[4]**

ඉතිහාසයේ පළමු වරට, ඉෂ්මායෙල්ගේ පුත්‍රයා වූ කේදර්ගේ මාර්ගයෙන් ඉෂ්මායෙල්ගේ පරම්පරාවේ පැවත එන කෙනෙකු ලෙස මුහම්මද් (සල්) තුමා පිළිගන්නා තරම්, සමහර ක්‍රිස්තියානි ආගමික කොටස් අති විශාල ලෙස දියුණු වී ඇත.

**ඇමරිකාවේ පිහිටි ප්රෙස්බිටේරියන් (Presbytetian ) දේවස්ථාන ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලයේ අනුග්‍රහයෙන් වර්ෂ 1980 දී ප්‍රකාශනය කරනු ලැබූ ඩේවිස් බයිබල් ශබ්ද කෝෂයේ (The Davis Dictionary**

---

4. අල්කුර්ආන් 5 : 82

5. ඉෂ්මායෙල් : ඉස්මාඊල් (අලෛ) වක්තෘවරයා ය.

**of the Bible)** හි කේදර් යනු ඉෂ්මායෙල්ගේ පරම්පරාවේ ඇති වූ ගෝත්‍රයක් ය.[6] කේදර්ගේ ජනයින් ලෙස හඳුන්වනු ලැබුවන් (ඉෂ්මායෙල්ගේ පුත්‍රයා වූ) කේදර්ගේ පරම්පරාවෙන් පැවත එන්නෝ ය. අවසායේ දී මුහම්මද් ඉපදුණේද ඔවුන්ගේ මෙම ගෝත්‍රයේ ය." සමස්ත ලෝක බයිබල් විශ්ව කෝෂය **(The International Standard Bible Encyclopedia)** ඒ. එස්. ෆුල්ටන් (A. S. Fulton) පැවසූ බව මෙසේ සඳහන් කරයි. "ඉෂ්මායෙල්ගේ ගෝත්‍රයන් අතර කේදර්ගේ ගෝත්‍රය ඉතා වැදගත් එකක් විය යුතුය. එහෙයින්, පසු කලෙක මෙම නව කාන්තාරයේ තිබුණු සෑම ගෝත්‍රයකට ම යෙදුණි. කේදර්[7] නම් වූ මෙම ගෝත්‍රය වෙතින් ඉෂ්මායෙල්ගේ පරම්පරාවේ කෙනෙකු ලෙස පසු කලෙක මුහම්මද් උපත ලැබූ බව වංශ පරම්පරා ගැන දැනුම ලත් මුස්ලිම්වරු ඔප්පු කරති."

**ස්මිත්ගේ බයිබල් ශබ්ද කෝෂය (Smith's Bible Dictionary)** මෙසේ සඳහන් කරයි. ඉෂ්මායෙල්ගේ දෙවෙනි පුත්‍රයා කේදර් ය.[8] මෙම කේදර්ගේ ගෝත්‍රයෙන් පැවත ආ ඉතාමත් කීර්තිමත් කුරෙෂ් කුලයෙ හි මුහම්මද් උපත ලැබීය. මෙනයින් එතුමා ආබ්‍රහම්ගේ පරම්පරාවේ කෙනෙකු වූ හ. හිජාස් හි විසූ අරාබීන් බනී හර්බ් (රණ ශූරයෝ) නමින් අමතනු ලැබූ හ. තව ද, ඔවුහු ආරම්භ කාලයේ සිට ම ඉෂ්මායෙල්වරුන් (ඉෂ්මායෙල්ගේ පරම්පරාවේ අය) ලෙස හඳුන්වනු ලැබූ හ.

පැල්ග්‍රේව් (Palgra e) මෙසේ පවසයි : "ඔවුන්ගේ (හිජාස් හි විසූ අරාබීන්ගේ ) භාෂාව කුර්ආනය ලියන (අනාවරණය කරන) ලද (ක්‍රි. ව. 610) එද මෙන් වර්ෂ 1200 ටත් පසු ව අදත්, කිසිදු වෙනසක් නොමැති ව පවිත්‍ර ව තිබීම පෙරදිග සමාජ ආයතනයේ ස්ථිරත්වය හා කල්පැවැතීම ඔප්පු කිරීමේ කදිම නිදසුනකි."

---

6. බලන්න : බයිබලයේ - උත්පත්තිය 25 : 13
7. කේදර් : අ රාබියෙන් "කයිදර්" වෙයි.
8. බලන්න : බයිබලයේ - උත්පත්තිය 25 : 13
9. ආබ්‍රාහිම් : ඉබ්‍රාහිම් (අලෛ)වක්තෘවරයයා ය.

බටහිර ලොවට පදිංචියට ගිය මුස්ලිම්වරුන් බටහිර ජනතාවට දී ඇති ඉතා වටිනා සම්පත ඔවුන්ගේ මිනිස් සම්පත හෝ ශ්‍රම ශක්තිය හෝ නොවෙයි. එය කුමක් ද යත්, අද බටහිරයේ මුල් බැසීමින් ඇති ඉස්ලාමයයි. බටහිරයෙ හි ඇති සෑම රටක ම මුස්ලිම් පල්ලි (මස්ජිද්) හා ඉස්ලාමීය සංවිධාන බොහෝ ගණනක් ඇත, බටහිරයින් ඉතා අධික ලෙස ඉස්ලාමය වෙත ආපසු පැමිණීම, දෛනික සිද්ධියකි. මෙහි "ආගම වෙනස් කරගනියි" යැයි නොකියා, තමාගේ ආගමට ආපසු එති" යැයි මම සඳහන් කිරීම ඔබට ප්‍රහේලිකාවක් වනු ඇත. නියත වශයෙන් ම සෑම කෙනෙක් ම උපත ලබන්නේ අල්ලාහ්ට අවනත වීමෙහි ය, එනම් ඉස්ලාම්හි ය. සෑම දරුවෙකුගේ ම ස්වභාවික උපත සිදුවන්නේ මෙලෙස ය. නමුත්, ඔවුන් ව යුදෙව් ආගමට හෝ ක්‍රිස්තියානි ආගමට හෝ වෙනත් ආගමකට, නැතිනම් නාස්තික වාදීන් බවට හෝ වෙනස් කරන්නේ ඔවුන්ගේ දෙමාපියන් ය, නැතහොත් ඔවුහු වෙසෙන සමාජය ය.

අද බටහිර රටවල් හි ඉස්ලාමය වේගයෙන් ව්‍යාප්ත වීගෙන ඇත. මෙම ව්‍යාප්ත වීම කඩුවෙන් (ආයුධයෙන්, බලහත්කාරයෙන්) නොව මුස්ලිම්වරුන් තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් කරගෙන යන ප්‍රචාරයන්ගෙන් සිදුවන බව නොරහසකි. ක්‍රිස්තියානි මිෂනාරී නම් වූ විශේෂ සංවිධානයන් අප අතර නැත.

වර්ෂ 1934 සිට 1984 දක්වා ලෝක ජනගහනය 136% කින් වැඩි වී ඇත. මෙම කාලය තුළ ක්‍රිස්තියානි ආගම 47% කින් වර්ධනය වී ඇත. ඉස්ලාමය ක්‍රිස්තියානි ආගමට වඩා පස් ගුණයක් අධික ව එනම් 235% කින් වර්ධනය වී ඇත. මෙම සංඛ්‍යා ලේඛන තම 50 වෙනි සංවත්සරිකය නිමිත්තෙන් ද **ප්ලේන් ට්‍රුත් (The Plain Truth) නම් වූ ක්‍රිස්තියානි මාසික සඟරාව,** 1984 පෙබරවාරි මස නිකුත් කළ විශේෂ කලාපයෙහි සඳහන් කොට ඇත. එම සඟරාව මෙම විස්තර උපුටා ගෙන ඇත්තේ, "World almanac and book of Facts 1935. සහ 'Reader's Digest almanac and year - book 1983. පොතපතෙන් ය.

**කි. බැ. :** යුදෙව් ආගම, ක්‍රිස්තියානි ආගම, ඉස්ලාමය යනාදී ආගම් තුන ම එක ම දෙවියන් විසින් දෙනු ලැබුවේ නම් ඒවා එකකට එකක් වෙනස් ව ඇත්තේ ඇයි?

**මුස්** : ආදම් (අලෛ) පටන් මුහම්මද් (සල්) තුමා දක්ව සියලුම වක්තෘවරුන් මුළු මානව සංහතිය ම අල්ලාහ්ට සම්පූර්ණයෙන් අවනත විය යුතු යි' යන එක ම පණිවිඩය ඇතිවය මෙලොවට එවනු ලැබුවේ. මෙම අවනත වීමට අරාබි භාෂාවෙන් ඉස්ලාම්' යනු කියනු ලැබේ. 'ඉස්ලාම්' යන වචනයට ශාන්තිය' නම් වූ පදර්ථයක් ඇත. එයින් සඳහන් වන්නේ මැවුම්කරුවා (අල්ලාහ්) ටත් මවනු ලැබූ ජීවීන්ටත් අතර පවතින ශාන්තිය වේ. යුදෙව් ආගමට හා ක්‍රිස්තියානි ආගමට කවරෙකු විසින් කුමනාකාරයකින් එම නම තබනු ලැබුවේ ද, ඒ ආකාරයෙන් කවරෙකු විසින් හෝ ඉස්ලාමයට ඉස්ලාම්' යන නම තබනු නොලැබුවේ ය. ඉස්ලාමයට මෙම අර්ථවත් නම තැබුවේ එය පිරිනැමූ අල්ලාහ් ය. මේ පිළිබඳ ව අල්ලාහ් කුර්ආනයේ මෙසේ පවසයි :

> **'අද දින ඔබ වෙනුවෙන ඔබගේ ආගම මම සම්පූර්ණ කළෙමි, ඔබ වෙත මගේ අනුග්‍රහය ද සම්පූර්ණ කළෙමි, කව ද, ඉස්ලාමය (යහපත්) ආගමක් වශයෙන් ඔබ සඳහා තෝරාගෙන ඇත්තෙමි."[10]**

යුදෙව් ආගම', ක්‍රිස්තියානි ආගම' යනා දී නම් බයිබලයේ පමණක් නොව බයිබල් ශබ්ද කෝෂයෙහි ද දක්නට නැත. ඊශ්‍රායෙල්වරුන් වෙත එවනු ලැබූ කිසිම වක්තෘවරයෙක්, ඔවුන් සතු කාර්යභාරය ඉටු කරන කල්හි යුදෙව් ආගම' යන නම භාවිතා නොකළහ. "මෙම පොළොව මත ක්‍රිස්තියානි ආගම පිහිටුවමි' යැයි යේසුස් වහන්සේ නොපැවසූ හ, එපමණක් නොව, උන්වහන්සේ "මම ක්‍රිස්තියානියෙක්මි" යැයි කිසිවිටෙක නොපැවසූ හ. "ක්‍රිස්තියානි" යන වචනය (බයිබලයේ) අලුත් ගිවිසුමෙහි තෙවරක් සඳහන් වී ඇත. යේසුස් වහන්සේ මෙලොවින් ගොස් බොහෝ කලකට පසු, එනම්, ක්‍රි.. ව. 43 හි පමණ, පළමුව - මිත්‍යා දෘෂ්ටිකයින් ද ,දෙවනුව - යුදෙව්වන් ද අන්තියෝක් යන ස්ථානයෙහි දී ක්‍රිස්තියානි' යන වචනය කීහ.

---

10. අල් කුර්ආන් 5:3
11. අලුත් ගිවිසුම: ක්‍රියා 11:26

බයිබලයේ අලුත් ගිවිසුම මේ ගැන සඳහන් කරයි :

**"ගෝලයෝ ක්‍රිස්තියානිකාරයෝය්යි පළමුකොට කියනු ලැබුවේ අන්තියෝකියේදී ය."[11]**

පසු, ව දෙවෙනි අග්‍රිපා රජු මෙසේ පැවසූ බව බයිබලයේ සඳහන් වෙයි.

**"එවිට අග්‍රිපා කථා කොට : වැඩි පෙළඹීමක් නැතුව ම තුඹ මා ක්‍රිස්තියානිකාරයෙක් කරන්ට සිතනවායයි පාවුල් ට කීවේ ය."[12]**

මෙලෙස, "ක්‍රිස්තියානි" යන නම පළමුව පතුරුවන ලද්දේ යේසුස් වහන්සේගේ දේවගැති මණ්ඩලයේ ම සිටි සතුරන් විසින් මිස මිතුරන් විසින් නොවන බව පැහැදිලි ය. අනතුරු ව, පේත්‍රුස් විසින් ද ක්‍රිස්තියානි යන නමට විශ්වාසය දක්වන ලදී.

මේ ගැන බයිබලය මෙසේ සඳහන් කරයි.

**"නමුත්, යමෙක් ක්‍රිස්තියානිකාරයෙකු මෙන් දුක්විඳී නම් ඔහු ලැජ්ජා නොවී, ඒ නාමය සම්බන්ධයෙන් දෙවියන් වහන්සේට ගෞරව කරවා."[13]**

මෙම පොළොව මත මුස්ලිම්වරයෙක් ලෙස අමතනු ලැබූ පළමු මිනිසා මුහම්මද් (සල්) තුමා නොවෙයි, අල්ලාහ්ට අංග සම්පූර්ණ ව අවනත වූ ආබ්‍රහම් තුමා වෙයි. එපමණක් නොව, ආබ්‍රහම්ට පෙර පැමිණි වක්තෘවරුන් වූ ආදම් සහ නෝවා යනාදීන්ට ද ඉස්ලාමය ජීවන සැලැස්මක් ලෙස අනාවරණය කොට තිබුණි. එවකට පටන් මුළු මිනිස් සංහතියට ම අදාළ ජීවන සැලැස්මක් ලෙස ඉස්ලාමය බැබළෙයි.

**කි. බැ. :** ආබ්‍රහම් මුස්ලිම්වරයෙක් වන්නේ කෙසේද? එතුමා යුදෙව්වෙක් බව දැන සිටිමු.

**මුස් :** යුදෙව්වෙක්! ඔබට එසේ කිව්වේ කවු ද?

**කි. බැ. :** අපට කියා දී ඇත්තේ එලෙස ය. බයිබලය ද මෙය සහතික කරන්නට ඇත.

---

12. අලුත් ගිවිසුම: ක්‍රියා 26:28
13. අලුත් ගිවිසුම: 1 පේත්‍රුස් 4:16

**මුස් :** ආබ්‍රහම් යුදෙව්වෙක් බව බයිබලයේ පවසා ඇත්තේ නම් කරුණාකර එය මට පෙන්විය හැකි ද? ඔබට එවැනි යමක් බයිබලයෙන් සොයා ගැනීමට අපහසු නම්, මම උදව් කරන්නෙමි. කරුණාකර බයිබලයේ, උත්පත්තිය 11:31 කියවන්න.

**ක්‍රි. බැ. තෝරා තමාගේ පුත්‍ර වූ ආබ්‍රහම් ද තමාගේ පුත්‍ර වූ හාරාන්ගේ පුත්‍රයා වන ලොත් ද තමාගේ පුත්‍ර වූ ආබ්‍රහම්ගේ භාර්යාව වන තමාගේ යෙහෙළි වූ සාරයි ද කැඳවාගෙන ඔවුන් සමග කනාන් දේශයට යනු පිණිස ඌර් නම් වූ කල්දිවරුන්ගේ නුවරින් පිටත් ව ගොස් හාරාන්ට පැමිණ එහි වාසය කෙළේ ය."**

**මුස් :** එසේ නම්, කල්දිවරුන්ගේ නගරය වූ "ඌර්" හි ඉපදුණු ආබ්‍රහම් යුදෙව්වෙක් ලෙස සිටියැයි කිව නොහැකි ය. මක්නිසා ද යත්, පළමු ව, කල්දිවරුන්ගේ නගරය වූ "ඌර්" පිහිටා තිබුණේ දැනට ඉරාකයේ කොටසක් වන මෙසපොතේමියාවෙහිය.. මෙයින්, එතුමා යුදෙව්වෙක් බව නොව අරාබියෙකු බව කැපී පෙනෙයි. දෙවනු ව, "යුදෙව්" යන නම භාවිතයට පත්වූයේ ආබ්‍රහම්ගේ මුනුබුරාගේ දරුවා වූ "යූද" ගේ උපතින් පසු ව ය. මෙහි ඇති පෙළපත් සටහන බලන්න. ඒ සමගම බයිබලයේ උත්පත්ති 12 : 4, 5 කියවන්න.

**ක්‍රි. බැ. : .......ආබ්‍රම් හාරානෙන් පිටත් වූ කල ඔහුට සැත්තෑ පස් අවුරුද්දක් වයස් විය. ......ඔව්හු කානාන් දේශයට පැමිණියෝ ය."**


**මුස්:** මේ වාක්‍යය අනුව ආබ්‍රහම් තමාගේ සැත්තෑ පස් වියෙහි කානාන් (කන්ආන්) දේශයට පදිංචි පිණිස ගිය බව වැටහෙයි. තව ද, එතුමා එහි අන්‍යයෙකු ව සිටි බව බයිබලය පැහැදිලි ව පවසයි :

**"නුඹ විදේශී ව වාසයකරන දේශය වන මුළු කානාන් දේශය නුඹට සහ නුඹෙන් පසු ව නුඹේ වංශයටත් සදාකාල උරුමයක් කොට දෙන්නෙමි, මම ද ඔවුන්ගේ දෙවියන් වහන්සේ ව සිටින්නෙමියි කී සේක."[14]**

දැන්, බයිබලයේ, උත්පත්තිය 14 : 13

---

14. බයිබලයේ : උත්පත්ති 17 : 8


ආබ්‍රහම්
ඉෂ්මායෙල්
ඊසාක්
ගිම්රාම්
මෙදන්
මිදියාන්
ඉෂ්බාක්
ෂුවා
යොක්ෂාන්
ඒසව්
යාකොබ්
(ඉශ්‍රායෙල්)
උත්පත්ති 16:16, 21:5, 25:1-2, 25:25-26, 29:32-35, 38:3-5
නික්මයාම 1:1-5, 6:16-20
1 - ලේකම් 2 : 2-5
රූබෙන්
සිමියොන්
ලෙවී
යූද
ඉස්සාබර්
සාබුලොන්
යෝසෙප්
බෙන්යමින්
දන්
නප්තලි
ගාද්
ආෂෙර්
ඒර්
ඕනාන්
ෂේලා
පෙරෙශ්
සේරා
දවිත්
යේසුස්
ගේර්ෂොන්
කොහොත්
මෙරාරි
අම්රාම්
ඉශ්හාර්
හෙබ්‍රොන්
උස්සියෙල්
ආරොන්
මෝසෙස්

**කි. බැ. : "එවිට ගැළවී ගිය කෙනෙක් ඇවිත් හෙබ්‍රෙව්වා වූ ආබ්‍රම්ට දැන්වී ය......"**

**මුස්.** : ආබ්‍රහම් හෙබ්‍රෙව් කෙනෙකු බව, එනම් - යූප්‍රටීස් නදියේ අනෙක් ඉවුරු පෙදෙසින් පැමිණි මිනිසෙක් බව බයිබලය ම පැහැදිලි ව සඳහන් කරනවිට, එතුමා යුදෙව්වෙක් බව ඔබ කියන්නේ කෙසේද? තව ද, මෙම නමට "ෂෙම්ගේ පරම්පරාවෙන් පැමිණි ඒබෙර්ගේ කුලය සමග සම්බන්ධතාවය ඇති කෙනෙක් යයි අර්ථයක් ද ඇත. දැන්, උත්පත්ති 32:28 කියවන්න. එවිට දූතයෙකු (angel) සමග පොරබැදීමෙන් පසු යාකොබ්ගේ නමට කුමක් වූනේ ද යන්න දැනගත හැකිය.

**කි. බැ.: "නුඹ දෙවියන් වහන්සේ සමගත් මනුෂ්‍යයන් සමගත් පොරබද ජයගත් නිසා නුඹේ නම මින්මතු යාකොබ් නොව ඉශ්‍රායෙල් වන්නේයයි උන්වහන්සේ කීසේක.**

**මුස්** : එහෙයින්, ආබ්‍රහම් හෙබ්‍රෙව් කෙනෙකු ව සිටිය හ. යාකොබ්ගේ පරම්පරාව ගෝත්‍ර දෙළහකින් සමන්විත වූ ඊශ්‍රායෙල්වරුන් වෙති. යූදට "යුදෙව්" යනු විකට නමක් තිබුණි. එම නිසා ඔහුගෙන් පමණක් පැවත එන්නන් යුදෙව්වන් ලෙස සඳහන් කරනු ලැබූ හ. නියත වශයෙන් ම, මෝසෙස් යනු කවරෙක් ද යැයි දැන ගැනීමට කරුණාකර බයිබලයේ, නික්මයාම 6 : 16 - 20 කියවන්න.

**කි. බැ. : "තමන්ගේ පරම්පරා වශයෙන් ලෙවි පුත්‍රයන්ගේ නාම මෙසේ යः ගේර්ෂොන්, කොහොත් සහ මෙරාරි ය..... කොහොත්ගේ පුත්‍රයෝ : අම්රාම්.....අම්රාම් තුමාගේ පියාගේ සහෝදරී වූ යොබෙබෙද් භාර්යාව කොට පාවාගත්තේ ය, ඈ ඔහු නිසා ආරොන් සහ මෝසෙස් වැදුවා ය."**

**මුස්.** : මෙනයින්, මෝසෙස්[15] යුදෙව්වෙක් නොවන බව සහතික වෙයි. මීට හේතුව එතුමා ලෙවීගේ පරම්පරාවෙන් මිස යූදගේ පරම්පරාවෙන් පැවත එන්නෙක් නොවීම ය. මෝසෙස් ඊශ්‍රායෙල්ගේ පරම්පරාවට "නීතිය ගෙන දෙන්නෙක් ලෙස සිටිය හ. (එම නීති මාලාව "තෝරාහ්"[16] නම් වෙයි.)

---

15. මෝසෙස්:මූසා (අලෛ) වක්තෘවරයා ය.
16. තෝරාහ්: තව්රාත් නම් වූ දේව ග්‍රන්ථය ය.

**කි. බැ. : ඔබ එය විස්තර කරන්නේ කෙසේද?**

**මුස්** : අපි කුර්ආනය මිම්මක් ලෙස භාවිතා කරමු. එහෙයින් මේ පිළිබඳ ව අගනා විස්තරයක් දිය හැක ය. ඔබ මෙම කුර්ආනයේ වාක්‍ය අනුව, බයිබලය ගැන විස්තර කිරීමටත්, යුදෙව් හා ක්‍රිස්තියානි දෙපාර්ශ්වය මගින් සිදු වූ අගතිය නිවැරදි කිරීමටත් තැත්කළ හැකි ය.. කුර්ආනය අවසාන වශයෙන් අනාවරණය වූ දේව ග්‍රන්ථයකි. මෙම කුර්ආනය මිනිසුන්ගේ අදහස්, ඇතුල් කිරීමෙන් හෝ යම් යම් වාක්‍ය අඩු වැඩි කිරීමෙන් හෝ අපවිත්‍ර වී නැත. එහි ඇත්තේ කිසිදු මිශ්‍රවීමක් නැති අල්ලාහ්ගේ වාක්‍ය පමණ ය. එය අනාවරණය වූ කාලය පටන් අද දක්වා ම එක් තිතක්වත් මාරු වී නැත, ඇති නැති වී නැත. මින් ඉදිරියට, ලොව අවසානය දක්වා ම එසේම පවතිනවා ඒකාන්තයි. ඊට හේතුව, කුර්ආනය ආරක්ෂා කිරීමේ කාර්යභාරය තමා වෙත පවරාගෙන ඇත්තේ එය අනාවරණය කළ අල්ලාහ් ම වීම ය.

අල්ලාහ් මෙසේ පවසයි :

> **"මෙය අල්ලාහ්ගේ ධර්ම ග්‍රන්ථයයි, ඒ ගැන කිසිදු සැකයක් නැත."**[17]
>
> **"නියත වශයෙන් ම අපි මෙම ධර්මය (ඔබ වෙත) අනාවරණය කළෙමු, නියත වශයෙන් ම අපි ම මෙය (දූෂණය වීමෙන්) ආරක්ෂා කරමු."**[18]

මෙම කුර්ආන් වාක්‍යයන් මුළු මානව සංහතියට ම අභියෝග කරමින් ඇත. කුර්ආනය අනාවරණය වී දැනට ශත වර්ෂ දහහතරක් ගත වී හමාරයි. නමුත් එහි ඇති වචනයකුදු කිසිවෙකු විසින් වෙනස්කොට නැති බවට සත්‍යයට නැඹුරුවන්නෝ සාක්ෂි දරති. එහි වෙනස්කම් ඇති කිරීමට, එය දූෂණය කිරීමට මිථ්‍යා දෘෂ්ටිකයින් දැරූ වෑයම සාමාන්‍ය නොවේ. එහෙත් එම වෑයම් සියල්ල නිෂ්ඵල වී ඔවුන් අන්ත පරාජයට

17. අල් කුර්ආන් 2:2
18. අල් කුර්ආන් 15:9

පත් වූහ. අල්ලාහ්ගේ පොරොන්දුව අකුරට ම ඉටුවීමෙන් එදත් අදත් අල්කුර්ආනය කිසිදු හානියකට පත් නොවී සුරක්ෂිත ව ඇත්තේ ය.

මෙම සුරක්ෂිතභාවය (තෝරාහ්, ගීතාවලිය (Psalms) ගොස්පල් වැනි) අනෙකුත් සියලු ම ග්‍රන්ථ පිළිබඳ ව නැති ව ඇත. ඒවායේ මූලික ග්‍රන්ථයන්හි ම වැඩි කිරීම්, අඩු කිරීම්, වෙනස් කිරීම් විකෘති කිරීම් යනාදිය තුළින් නොයෙක් මිශ්‍රවීම් සිදු වී ඇත.

**කි. බැ.** : ආබ්‍රහම් සහ මෝසෙස් ගැන කුර්ආනය පවසන්නේ කුමක් ද?

**මුස්** : අල් කුර්ආනය පවසන්නේ මෙයයි.

**ධර්ම ග්‍රන්ථ ලත් (යුදෙව්, ක්‍රිස්තියානි) ජනයිනි! ඉබ්‍රාහිම් ගැන (එතුමා යුදෙව්වෙක් ද ක්‍රිස්තියානියෙක් ද යනුවෙන් අනවශ්‍ය) තර්ක කරන්නේ ඇයි? ඔහුට පසු ව හැර තව්රාත් (Torah) සහ ඉන්ජීල් අනාවරණය කළේ නැතः (මේ ගැනවත්) ඔබට අවබෝධයක් නැත්තේ ද?"[19]**

**"ඉබ්‍රාහිම් (ආබ්‍රහම්) යුදෙව්වෙක් ද ක්‍රිස්තියානියෙක් ද නොවෙයි. එහෙත්, ඔහු (අල්ලාහ්ට) සම්පූර්ණයෙන් ම (අවනත වූ) අවංක මුස්ලිමෙකු ව සිටියේ යः ඔහු මුෂ්රික්වරුන් (අල්ලාහ්ට ආදේශ පිහිටුවන්නන්) ගෙන් කෙනෙකු ව නොසිටියේ ය."[20]**

**"එසේ නැතහොත් ඉබ්‍රාහිම්, ඉස්මාඊල්, ඉස්හාක් යාකුබ් සහ ඔහුගේ දරුවෝ යන මේ සියල්ලෝ ම යුදෙව්වෝ හෝ ක්‍රිස්තියානිහු යැයි ඔබ කියන්නාහු ද? (නබිතුමනි! ) ඔවුන්ගෙන් මෙසේ අසන්න. ඔබ වඩා දැනුමෙන් යුක්ත ද?නැතහොත් අල්ලාහ් ද? අල්ලාහ් විසින් කෙනෙකුට පවරා ඇති සාක්ෂිය ඔහු සඟවන්නේ නම් ඔහුටත් වඩා අසාධාරණ කෙනෙක් තවත් සිටී ද? ඔබගේ ක්‍රියා කලාපය ගැන අල්ලාහ් නොදන්නෙකු නොවේ....."[21]**

19. අල්කුර්ආන් 3:65
20. අල් කුර්ආන් 3:67
21. අල් කුර්ආන් 2:140

ඇත්ත වශයෙන් ම, ඔවුන් යුදෙව්වන් හෝ ක්‍රිස්තියානීන් ලෙස සඳහන් කිරීම සම්පූර්ණයෙන් ම වැරදි ය. මක්නිසාද යත්, යුදෙව්" යන නමක් බිහිවූයේ යුදගේ උපතින් පසුව යඃ එමෙන් ම ක්‍රිස්ති යානි" යන නම බිහිවූයේ යේසුස් වහන්සේ ලොවෙන් ඇත් වී බොහෝ කලකට පසුවය.

**කි. බැ:** **අල්ලාහ්** යන නම අසන විට අමුතු නාඳුනන හැඟීමක් ඇති වෙයි. එබැවින්, ඉංග්‍රීසි භාෂාවෙන් කතාකරන විට ගෝඩ් - God - (දෙවියන්) යන වචනය භාවිතා කිරීම ගැන ඔබගේ අදහස කුමක් ද?

**මුස්** : ඇත්තයිඃ මුස්ලිම් නොවන අයට **අල්ලාහ්** යන නම අමුතු, නාඳුනන එකක් විය හැකි ය. එහෙත්, මෙම නම ආදම් (අලෛ) තුමා පටන් මුහම්මද් (සල්) තුමා දක්වා වූ වක්තෘවරුන් සියල්ලෝ ම භාවිතා කර ඇති බව දැනගත යුතුයි. මෙය අල්-ඉලාහ් යන වචන දෙකක සංක්ෂේපය තුළින් බිහිවූවකි. අල්-ඉලාහ් යන වචනයෙ හි ඇති "ඉ" යන්න ඉවත්කළ විට '**අල්ලාහ්** යන වචනය (නම) ඔබට දිස්වෙයි. අරාබි භාෂාවෙන් වූ වාක්‍යයක් තුළ මෙම වචනය පිහිටි තත්ත්වය අනුව **අල්ලාහ' නම් වූ** ආකාරයෙන් ද තිබෙන්නට පුළුවන. මෙම **අල්ලාහ'** යන වචනය හෙබ්‍රෙව් භාෂාවෙන් මැවුම්කරු වූ දෙවියන්ට යෙදෙන '**එලෝහ**' (Eloha) යන වචනයට සමීප ව ඇතඃ මෙම වචන දෙක ශබ්දයෙන් ද ඒකාකාර ව ඇත. එහෙත්, යුදෙව්වන් දෙවියන්ගේ ඒකියභාවය දක්වන මෙම වචනය වෙනුවට **එලෝහිම්'** (Elohim) යන බහු වචනය භාවිතා කරතිඃ මෙයින් දෙවියන් රාශියක් සිටින බව ඇඟවෙයි. **අල්ලාහ** යන වචනය, යේසුස් වහන්සේ දෙවියන් සඳහන් කිරීමට භාවිතා කළ අරමේයික් (Aramaic) වචනය වූ '**අලහ**' (Alaha) ට ද ශබ්දයෙන් ඉතා සමීප ව ඇත.[22]

" **අල්ලාහ්** යන නම මුස්ලිම් නොවන අයට පමණක් අමුතු ව, නොදන්නා නමක් ව තිබිය හැකි ය. එහෙත්, එය ආදම් (අලෛ) තුමා පටන් **මුහම්මද්** (සල්) තුමා දක්වා වූ කිසිම වක්තෘවරයෙකුට අමුතු නමක් නොවී යඃ

---

22. බලන්නඃ 'Encyclopedia Britanica - 1980" හි අල්ලාහ්, එලෝහිම් යන වචන පිළිබඳ ඇති සටහන්.

නොදන්නා එකක් ද නොවීය. ඊට හේතුව , ඔව්හු සියල්ලෝ ම ප්‍රචාරය කළේත්, මුළුමහත් මානව සංහතිය ම කැදෙව්වේත් ඉස්ලාම් නම් වූ යහමග වෙත ය: **ඉස්ලාම්** යනුවෙන් අදහස් වන්නේ එක ම දෙවියන් වන අල්ලාහ්ට සම්පූර්ණයෙන් අවනත වීම ය. නැමදීමෙ හි පමණක් නොව, මිනිසාගේ ජීවිතයේ සෑම අංගයක ම ඔහුගේ අණ පිළිපැදිය යුතු යි: දෛනික ජීවිතයේ සෑම ක්‍රියාවක් ම ඔහු පවසා ඇති පරිදි ඉටුකළ යුතුයි. මෙමගින්, සියලු ම වක්තෘවරුන්ගේ එක ම අරමුණ වූයේ, අල්ලාහ් විසින් අණාවරණය කරනු ලැබූ ඉස්ලාමය වෙත මානව සංහතිය කැඳවීම වේ.

"**අල්ලාහ්**" යන එක ම සර්ව බලධාරී දෙවියන්ගේ නමයි. මෙම නමට අනේකත්වයක් (බහු වචනයක්) නැත: ලිංග භේදයක් ද නැත. එබැවින්, **ගෝඩ්ස් (Gods) දෙවිවරුන්** යනුවෙන් අනෙක් අය අමතනවා මෙන් **අල්ලාහ්වරුන් (Allahs)** යනුවෙන් ඇමතීමක් හෝ එසේ අමතනු පිණිස දෙවියන් රාශියක් හෝ නොමැති බව පැහැදිලි ය. එමෙන් ම, අනෙක් ආගම්වල ගෝඩ්' **(God) - දෙවියා, ගොඩස් (Goddess) - දෙවි දූ** යන ස්ත්‍රී පුරුෂ දෙවියන් ගැන සඳහන් වනවා මෙන් ඉස්ලාමයෙ හි **පුරුෂ අල්ලාහ්** යනු හෝ **ස්ත්‍රී අල්ලාහ්** යනු හෝ නැත.

තව ද, දෙවියන් ආමන්ත්‍රණය කිරීම සඳහා "ගෝඩ්" යන වචනය භාවිතා කිරීම අවුල් සහගත තත්තත්වයක් ඇති කරයි. ඊට හේතුව, ඉංග්‍රීසි කථාකරන බොහෝ ක්‍රිස්තියානීන්, යේසුස් වහන්සේ දෙවිකෙනෙක් බව තවමත් ඇදහීමයි: ක්‍රියේටර් (Creator) - මැවුම්කාරයා යන වචනය ද ප්‍රශ්නයන්ට තුඩුදෙන සුළු ය. ඊට හේතුව ක්‍රිස්තියානීන් බොහෝ දෙනෙක් මෙම ලොව මැවුවේ යේසුස් වහන්සේ බව තවමත් අදහස් කිරීමයි.

"**අල්ලාහ්**" යන නම පමණක් නොව, මුස්ලිම්වරුන් දෝවනකොට, හිස නමා, දණ ගසා, මුණින් වැටී අල්ලාහ් නමදින විලස ද, අල්ලාහ් වෙනුවෙන් උපවාසයෙ හි යෙදෙන විලස ද මුස්ලිම් නොවන අයට අමුතු ව, පුදුාකාර ව පෙනෙයි: එහෙත් සියලු ම වක්තෘවරුන්ට

මුස්ලිම්වරුන්ගේ නැමදීමේ හා උපවාසයේ යෙදෙන ක්‍රමවත් පිළිවෙළ අමුතු නොවේ: පුදුමාකාර ද නොවේ. ඔවුහු මේ සියල්ල හොඳකාර ව දනිති. නැමදීමෙ හි යෙදීමට පෙර දෝවනය කිරිම (මුහුණ, අත්, පා ආදිය සේදීම, හිසකෙස් තෙත් කිරීම) අභිනව ක්‍රිස්තියානුන් විසින් අතහැර දමා ඇත. නමුත් මුස්ලිම්වරු අදත් එය අකුරට ම පිළිපදිති: කලින් වූ වක්තෘවරුන් ද මෙය යහපත් ලෙස පිළිපැද ඇති බව බයිබලය පවසයි:

**"මෝසෙස් ද ආරොන් සහ ඔහුගේ පුත්‍රයෝ ද ඔවුන්ගේ අත් පා එහි සේදුවෝ ය. ඔව්හු සම්මුඛවීමේ කූඩාරම ඇතුළට ගිය කල්හි ද පූජාසනයට ළංවූ කල්හි ද ස්වාමීන් වහන්සේ මෝසෙස්ට අණ කළ ලෙස සෝදගත්තෝ ය."[23]**

යේසුස් වහන්සේගේ ඉගැන්වීම් හි පෝල් (Paul) විසින් නොයෙකුත් වෙනස්කම් කර ඇතිමුත්, දෝවනය කිරීමෙහි පමණක් ඔහු අවංක ව හැසිරී ඇති බව බයිබලයෙ හි පෙනෙන්නට ඇත:

**"එවිට පාවුල් ඒ මනුෂ්‍යයන් රැගෙන, පසුව ද හා ඔවුන් සමග පවිත්‍ර වී දේව මාළිගාවට පැමිණ."[24]**

මුස්ලිම් කාන්තාවන් තමන්ගේ හිස් වසා නැමදීම් හි යෙදෙන බව කවුරුත් දන්නා කරුණකි. මීට බයිබලයේ සාක්ෂි ඇත.

**"නුමුත්, හිස නොවසා යාච්ඤා කරන්නා වූ නොහොත් ධර්ම වාක්‍ය පවසන්නා වූ ස්ත්‍රී තමාගේ හිසට අගෞරව කරන්නී ය. මක්නිසා ද ඈ මුඩු කළ හිස ඇත්තියකට සමාන ය. මක්නිසා ද ස්ත්‍රියෙක් හිස වසා නොගනිතොත් හිසකේ කපාගනීවා. නුමුත් ස්ත්‍රියකට හිකේ කැපිමවත් මුඩු කිරීමවත් ලජ්ජාවක් නම් ඈ හිස වැස්මක් ඇතුව සිටීවා.."**
**"හිස නොවසා දෙවියන් වහන්සේට යාච්ඤාකරන්ට ස්ත්‍රියකට හොබනේ ද කියා නුඹලා තුළ ම විනිශ්චය කරපල්ලා"[25]**

කලින් වූ වක්තෘවරුන් කවරාකාරයෙන් නැමදුම් ඉටුකළේ ද, ඒ ආකාරයෙන් ම මුස්ලිම්වරු හිස නමා, දණ ගසා, මුණින් වැටී, පාවහන් නොමැති ව තමන්ගේ නැමදුම ඉටුකරති.

23. බයිබලයේ, නික්මයාම 40:31, 32
24. බයිබලයේ, ක්‍රියා 21:26
25. බයිබලයේ, 1 - කොරින්ති 11:5, 6, 13

බයිබලයේ සාක්ෂි දෙස සිත යොමු කරන්න.

**"එව්, නමස්කාර කරමින් වැඳ වැටෙමු: මැවුම්කාර ස්වාමීන් ඉදිරියේ දණ ගසමු."[26]**

**".....එවිට යෝසුවා මුහුණින් බිම වැටී නමස්කාර කොට....."[27]**

**"...එලියා කර්මේල් කන්ද මුදුනට නැගී බිම වැටී දණ දෙකට අතරේ මුහුණ තබාගෙන..."[28]**

**"මෝසෙස් හා ආරොන් සභාව ඉදිරියෙන් සම්මුඛවීමේ කූඩාරමේ දොරකඩ ළඟට ගොස් මුහුණින් වැටුණෝය. ස්වාමීන් වහන්සේගේ තේජස ඔවුන්ට පෙනුනේ ය."[29]**

**"එවිට ආබ්‍රම් මුහුණින් වැටුණේ ය. දෙවියන් වහන්සේ ඔහු සමග කතාකරමින්..."[30]**

**"උන්වහන්සේ (මෝසෙස්ට) කථාකොට: මෙතැනට ළංනොවා: නුඹේ පාදවලින් නුඹේ වහන් ගළවා. මක්නිසා ද නුඹ සිටින ස්ථානය ශුද්ධ භූමියකැයි කී සේක."[31]**

**"ස්වාමීන් වහන්සේ ඔහුට කියන සේක්: නුඹේ පාදවලින් වහන් මුදවා: මක්නිසා ද නුඹ සිටින ස්ථානය ශුද්ධ භූමියක් ය."[32]**

තව ද මක්කමේ ඇති ශුද්ධ වූ කෑබාව වටේ සක්මන් කිරීමෙන් මුස්ලිම්වරුන් ඉටුකරන හජ් කර්තව්‍යය අනේක වක්තෘවරුන් විසින් ඉටු කළ බව ද, ඊශ්‍රායෙල්වරුන් වෙත පැමිණි වක්තෘවරුන් පවා ඉටු කළ බව ද අපි පැවසුවහොත් ක්‍රිස්තියානි සහෝදරයින්ගේ ශරීරය කිළිපොලවා යනවාට සැක නැත.

**කි. බැ.** : (හජ් කර්තව්‍යය සඳහා වූ) මෙම ගමන ගැන හෝ ශුද්ධ වූ ගල ගැන හෝ මම කිසිවිටෙක බයිබලයෙ හි නොකියවූයෙමි.

**මුස්** : මේ ගැන කීප වතාවක් ම බයිබලයේ හි ඉතා පැහැදිලි ව සඳහන් කොට ඇත. එහෙත්, බයිබල් පාඨකයෝ එම වාක්‍ය නොදැක හෝ නොදැන හෝ සිටිති.

---

26. බයිබලයේ, ගීතාවලිය 95:6
27. " යෝෂුවා 5:14
28. " 1 - රාජාවලිය 18:42
29. " ගණන් කථාව 20:6
30. බයිබලයේ, උත්පත්ති 17:3
31 " නික්මයාම 3:5
32. " ක්‍රියා 7:33

ඔබ සත්‍යය දැනගත යුතුයි: බයිබලය දෙස හැරෙන්න.

(1) "යාකොබ් අලුයම නැගිට තමාගේ හිසට තබන ලද ගල රැගෙන කණුවක් කොට සිටුවා එහි මුදුනේ තෙල් වත්කොට, ඒ ස්ථානයට බෙතෙල් යැයි නම් තැබී ය."[33] එනම්, දෙවියන්ගේ මාළිගය යනු වේ.[33]

(2) අවුරුදු ගණනාවකට පසු යාකොබ් නම් වූ එම වක්තෘවරයාට ම බෙතෙල් යන ලෙස අල්ලාහ් අණ කළේය.

"මෙසේ යාකොබ් ද ඔහු සමග සිටියා වූ සියල්ලෝ ද කානාන් දේශයෙ හි වූ ලූස්ට පැමුණුනා හ. ඒ වනාහි බෙතෙල් නම් ස්ථානයයි."[34]

"යාකොබ් උන්වහන්සේ තමා සමග කථා කළ ස්ථානයෙ හි කණුවක් එනම් ගල්කණුවක් සිටුවා ඒ පිට බොන පූජාවක් වත්ළේය. ඒ පිට තෙල් ද වත්කෙළේ ය. යාකොබ් වනාහි දෙවියන් වහන්සේ ඔහු සමග කතා කළ ස්ථානයට බෙතෙල් යන තැබිය."[35]

යාකොබ් බෙතෙල් යාමට පෙර එහි තිබූ අන්‍ය (මනඃ කල්පිත) දෙවිවරුන් සියල්ල ඉවත් කළේය. පසුකලෙක, වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාණෝ ද මක්කමේ කෘබාව අවට තිබූ පිළිම සියල්ල ඉවත් කළ හ.

(3) යාකොබ් සහ ඔහුගේ මාමා වන ලාබන් විසින් තවත් කණුවක් ඉදිකරන ලදී.

"යාකොබ් ගලක් රැගෙන කණුවක් කොට සිටුවා: ගල් රැස්කරපල්ලා යැයි තමන් සහෝදරයන්ට කීය. ඔව්හු ගල් රැගෙන ගොඩක් සෑදුවෝ ය. තව ද ඔව්හු ඒ ගොඩ ළඟ හිඳ කෑවෝ ය. ලාබන් ඊට ඉගර් සාහදුතා යන නම තැබුවේ ය. එහෙත් යාකොබ් ඊට ගල්යේද් යන නම තැබුවේ ය.... තව ද එයට මිශ්පා යයි ද කියන ලදී. මක්නිසා ද ඔහු කතාකරු: අප එකිනෙකාගෙන් වෙන් ව සිටින කළ ස්වාමීන් වහන්සේ මා නුඹ අතරේ බලා ඉන්නා සේක්වා!"[36]

---

33. බයිබලයේ, උත්පත්ති 28:18, 19
34. " " 35:4
35. බයිබලයේ උත්පත්ති 35:14, 15
36. " " 31:45-49

(4) **මිරක්** යෙප්තා සහ අම්මොන් එකිනෙකාට විරුද්ධව යුද වැදුණ හ. මෙම යුද්ධයෙන් තමා දිනුවොත් තමාගේ එක ම දියණිය බිලිදෙන බව යෙප්තා ගිලියද් හි ඇති **මිස්පාවෙහි** දී දෙවියන් වෙත දිව්රුම් දුන්නේ ය. ඔහු එම යුද්ධයෙන් දිනුවේ ය. එවිට, ඔහු දිව්රූ පරිදි ම, තම දියණිය පණ පිටින් ගින්නෙහි දමා පුළුටු පූජාව ඉටු කළේ ය. මේ ගැන වැඩි විස්තර දැන ගැනීමට බයිබලයේ, විනිශ්චයකාරයන්ගේ පොත, වාක්‍ය 11:29-39 කියවන්න.

(5) ඊශ්‍රායෙල්වරුන්ගේ ගෝත්‍ර 11 කින් තෝරාගනු ලැබූ කඩු හටයින් හාර ලක්ෂයකින් යුතු සේනාවක් **මිශ්පාවෙහි** දෙවියන් අභියස රැස් වී බෙන්යමින්ගේ ගෝත්‍රයන් විනාශකර දමන බව දිවුරුම් දුන්නේ ය. වැඩි විස්තර සඳහා බයිබලයේ, විනිශ්චයකාරයන්ගේ පොත'ට අයත් පරිච්ඡේද 20 සහ 21 කියවන්න.

(6) සාමුවෙල්ගේ යටතේ සිටි ඊශ්‍රායෙල්වරුන්ගෙන් පැවත එන අය, පිලිස්තිවරුන්ට විරුද්ධ ව කරන සටනින් ජය ලැබුවහොත් තමන්ගේ පිළිම සියල්ල විනාශකර දමන බව **මිශ්පා** හි දී දිවුරුම් දුන් හ. වැඩි විස්තර සඳහා බයිබලයේ, 1 සාමුවෙල් හි හත්වෙනි පරිච්ඡේදය කියවන්න.

(7) සාමුවෙල් ඊශ්‍රායෙල්වරුන්ගේ රජු ලෙස නියම කළ විට මුළු ඊශ්‍රායෙල් ජනතාව ම **මිශ්පාවෙ** හි එක් රැස්වූ හ. වැඩි විස්තර සඳහා බයිබලයේ, 1 සාමුවෙල් හා දහයවෙනි පරිච්ඡේදය කියවන්න.

ආබ්‍රහම් සහ එතුමාගේ පුත්‍රයා වූ ඉෂ්මායෙල් දෙදෙනා ම එක් වී ශුද්ධ වූ මක්කමේ නිර්මාණය කළ ඉතාමත් පැරණි **කඃබාව** හැර වෙනත් **මිශ්පාවක්** දැනට ලොවෙ හි කිසි තැනක නොමැත. ඔවුන්ගේ පරම්පරාවෙහි ය, පසු කලෙක වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා උපත ලැබුවේ, නිසැකයෙන් ම මුස්ලිම්වරු සියලු ම වක්තෘවරුන්ගේ අනුගාමිකයෝ වෙති. ඉස්ලාම්, මුස්ලිම්වරුන් හා මුහම්මද් (සල්)

තුමාණෝ ගැන බයිබලයෙහි සඳහන් කරුණු ඔබට මට පහද දිය හැකි ය. නමුත්, ඔබ සත්‍ය නොසොයා සිටින විට මෙය විතරක් දැන ගැනීමෙන් ඵලක් නැහැනේද ?

**කි. බැ.** මම විශ්වාසය අතින් දැඩි ක්‍රිස්තු භක්තිකයෙක් වෙමි. එහෙත්, ක්‍රිස්තියානි ආගම හා ඉස්ලාම් ගැන වැඩියෙන් යමක් දැන ගැනීමේ ආශාව ඇත්තෙක් මි. මුස්ලිම්වරුන් විසින් ලියන ලද පොත්පත් කියවීමෙන් පසු ව, සමහර අවස්ථාවන්හි ක්‍රිස්තියානියෙකු වශයෙන් අවමන් තත්ත්වයකට පත්වෙන හැඟීම් මට ඇතිවෙයි.

**මුස් :** එම හැඟීම් ඔබගේ ආගමික ජීවිතයට බාධාවක් වූයේ ද ?

**කි. බැ. :** ඔව්, කලින් මෙන් පිළිවෙළට දැන් මම දේවස්ථානයට නොයමි. මම මුස්ලිම්වරුන් විසින් ලියන ලද පොත්පත් ඉතා රහසිගත ව කියවීමි : ඒවා හි පැහැදිලි නැති කරුණු පිළිබඳ ව බොහෝ මුස්ලිම්වරුන්ගෙන් මම විමසා ඇත්තෙමි. නමුත්, තෘප්තිමත් විස්තර ඔවුන්ගෙන් මම නොලදිමි. මම ධාර්මික වූ යුක්ති සහගත වූ ද පිළිගත හැකි ආගමක් සොයන කෙනෙක්මි. මට තේරුම් ගත නොහැකි ආගමක් විශ්වාස කළයුතු බව යමෙක් කීම වැරදි බව ද මම සිතමි.

**මුස් :** බොහොම හොඳයි. (කවුරුත්) එසේ ය සිටිය යුත්තේ. ඔබගේ මෙම ආකල්පය මම අගය කොට සලකමි. නමුත් කිසිවෙකුට යම්කිසි ආශාවක් ඇතිකොට (ඉස්ලාමය වෙත) ඇද ගැනීමට අපට අනුමැතිය නැත. කවරෙකු අපගේ අදහස් සාවධානව සවන් දීමට කැමති වන්නේ ද එවැනි අය සමග පමණක් අපි ඉස්ලාම් ගැන සාකච්ඡා කරන්නෙමු.

**කි. බැ. :** එහෙත්, මම කැමති ආගමක් පිළිගැනීමට මට අයිතියක් තිබෙනවා. එම අයිතිය මගෙන් පැහැරගන්න කිසිවෙකුට බැහැ. එයින් මා වළක්වන්නට ද කිසිවෙක් ශක්තිමත් වන්නේ නැහැ.

**මුස් :** එය සම්පූර්ණ ඇත්තක් ආගම සම්බන්ධයෙන් බලකිරීමක් හෝ බලහත්කාරයක් නැත.[37]

**කි. බැ. :** එසේ නම්, මුස්ලිම්වරු, වෙනත් ජනයින් වෙත තමාගේ විශ්වාසය (ආගම) පිළිගන්නා ලෙස ආරධනා කරන්නේ ඇයි ?

**මුස් :** ක්‍රිස්තියානීන්, යේසුස් වහන්සේ ගැළවුම්කාරයාණන් ලෙස පිළිගන්නැ'යි යුදෙව්වන්ට පවසති. එවැනි ආරධානවක් එනම්, ක්‍රිස්තියානුන් සහ යුදෙව්වන් ඇතුළු මුළු මානව සංහතියට ම මුහම්මද් (සල්) තුමාණන් වක්තෘවරුන්ගෙන් අවසාන ව පැමිණි කෙනෙකු බව පිළිගන්නැ'යි අපි ආරාධනා කරමු. වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා, මගේ පණිවුඩය, එක (කුර්ආන්) වාක්‍යයක් හෝ වේවා (අනෙක් අය වෙත) ගෙන යන්න" යැයි කීහ.

යෙසායාවෙ හි අරාබිය ගැන දිව්‍ය ප්‍රකාශනය ය"[38] යනු සඳහන් වී ඇත. මෙයින් අදහස් වන්නේ, දැන් අරාබිකරයේ වාසය කරන මුස්ලිම්වරුන්ගේ පමණක් නොව, මුළු මුස්ලිම් ජනතාවගේ ම එක ම වගකීම හා අරමුණ විය යුත්තේ ඉස්ලාමය ලොවට දීම වේ: එය ප්‍රචාරය කිරීම වේ.

---

37. අල් කුර්ආනය මේ පිළිබඳ ව මෙසේ පවසයි:
'ආගම සම්බන්ධයෙන් බලකිරීමක් හෝ බලහත්කාරයක් නැත. වැරැද්දේ සිට නිවැරදි පැහැදිලි ව වෙන්කොට දක්වා ඇත. තාගූත් ව (සීමාවන් ඉක්මවා යන්නන් ව) ප්‍රතික්ෂේප කොට අල්ලාහ් ගැන අදහන කවරෙක් හෝ වේවා ඔහු කිසිකලෙක නොබිදෙන ප්‍රතිඥාවක් ගත්තේ වෙයි. (තව ද ඔහු ප්‍රතිඥාකරගත්) අල්ලාහ් ව සැම දෙයක් ම ඇසෙයි: ඔහු සැම දෙයක් ම දනියි.'

38. බයිබලයේ, යෙසායා 21 : 13

යෙසායා හීනයක කොටළුවන්ගේ රථයක් ද ඔටුවන්ගේ රථයක් ද දැකීමෙන් පසු ව ඔහු මෙසේ පැවසුවේ ය:

> **ඔහු මෑගයන් පිට එනම් දෙන්න දෙන්න වශයෙන් අශ්වයන් පිට ද කොටළුවන් පිට ද මනුෂ්‍යයන් නැගී එනවා දකින කල ඉතා ඕනෑකමින් ම ඇහුම්කන්දෙන්නේ යයි කීසේක."[39]**

කොටළුවන්ගේ රථය යනුවෙන් සඳහන් වන්නේ, යේසුස් වහන්සේ කොටළුවෙක් පිට හිඳ යෙරුසලමට ඇතුළු වූ බව ය.

> **'සියොන් දියණියනි භය නොවව. බලව, නුඹේ රජ කොටළු පැටවෙකු පිට නැගී එන සේක යි ලියා තිබෙන හැටියට යේසුස් වහන්සේ කොටළු තරුණයෙකු ලැබ ඌ පිට හිඳගත් සේක."[40]**

මේ අනුව කොටළුවෙක් පිට නැගී පැමිණියේ යේසුස් වහන්සේ බව කිසිදු සැකයක් නොමැ ති ව පැහැදිලි වෙයි. එසේනම්, ඔටුවන්ගේ රථය පිටුපස පැමිණි අශ්වරෝහකයාගෙන් සඳහන් වන්නේ කවරෙකු ද යනු ප්‍රශ්නය කාටත් මතුවෙනවා ඇත. යේසුස් වහන්සේ පැමිණ ගොස් වසර 600 ට පමණ පසුව පැමිණි මුහම්මද් (සල්) තුමා හැර වෙන කිසිවෙක් මෙයින් සඳහන් නොවෙයි. මගේ මෙම අදහස ඔබ නොපිළි නොගන්නේ නම්, මෙහි සඳහන් වන අනාවැකිය තවමත් ඉෂ්ට නොවූ බව කිව යුතු ය.

---

39. බයිබලයේ, යෙසායා 21:7 මෙම වාක්‍යය සිංහල පරිවර්තනයේ මෙසේ ඇතත් ඉංග්‍රීසි පරිවර්තනයේ වෙනස් ව ඇත.
මෙය ඉංග්‍රීසියෙන් මෙසේ ය:

> **"And he saw a chariot with a couple of horsemen, a Chariot of asses, and a chariot of camels; and he hearkened diligently with much heed."**
>
> **ISAIAH 21:07, THE HOLY BIBLE,** King James Version (1611) Second South Afričan edition 1982, sixth impression 1988, Published By The Bible Society of South Africa, P. O. Box 6215, Roggebaai, Cape Town 8012

මෙම වාක්‍යයේ පරිවර්තනය මෙසේ ය:

> **'තව ද, ඔහු රථයක් සමග අශ්වාරෝහකයින් දෙන්න දෙන්නා ද කොටළුවන්ගේ රථයෙහි හා ඔටුවන්ගේ රථයෙහි මනුෂ්‍යයන් නැගී එනවා දකින කල ඉතා ඕනෑකමින් ම ඇහුම්කන්දෙන්නේ යයි කීසේක.'**

ඉංග්‍රීසියෙ හි සඳහන් වන රථ ගැන හෝ ඔටුවන් ගැන හෝ සිංහල පරිවර්තනය හි නැත්තේ ඇයි දැයි සිතා බැලීම වටී.

40. බයිබලයේ, ශු. යොහන් 12:14 (වැඩි විස්තර සඳහා බයිබලයේ, ශු. මතෙව්21 වෙනි පරිච්ඡේදයේ වාක්‍ය 1 සිට 11 දක්වා කියවන්න.)

**කි. බැ. :** ඔබගේ මෙම විස්තර, මට තව තවත් ඉතා සාවධානව බයිබලය කියවීමටත්, එහි ඇති කරුණු පරීක්ෂා කර බැලීමටත් උනන්දුව ගෙන දෙයි. එමෙන් ම, මම ඔබ සමගත් තවත් බොහෝ කරුණු ගැන සාකච්ඡා කිරීමට ද කැමැත්තෙමි.

**මුස් :** මමත් ඔබ සමග සාකච්ඡා කිරීමට ඉමහත් සතුටින් සිටිමි. ඔබ මෙම ලොවෙ හි සාර්ථක ජීවිතයක්, ජයක් ලබා ගත්තේ නම්, එනයින් මරණින් මතු ජීවිතයෙහිත් සාර්ථකත්වයක් හෝ ජයක් ලබා ගන්නා බව අදහස් නොවේ. මරණින් මතු ජීවිතය මෙලොව ජීවිතයට වඩා ඉතාමත් යහපත්, සාර්ථක හා නිත්‍ය වූ එකක් වෙයි. නමුත්, දැන් දැන් ජනයින් මේ ගැන සිතා බලන්නේ නැත. ඔවුහු දිනෙන් දින ම ආගමෙන් බැහැර වී ද්‍රව්‍යාත්මක ජීවිතයට නැඹුරු වී ගෙන යති.

මෙවැනි තත්ත්වයක අපි විටින් විට, නිතර ම වාගේ මුණගැසී, අප අතර ඇති වෙනස්කම් පිළිබඳ ව කිසිදු අගතියක් නොමැති ව අවංක ව සාකච්ඡා කළ යුතු ය. ඉස්ලාමය බුද්ධිය පදනම් කරගත් ආගමකි. එහෙයින්, බුද්ධියෙන් තොරව ඔබ එය පිළිගත නොයුතු යි.

ඔබගේ බයිබලය ද පවසන්නේ මෙයයි :

**සියල්ල සෝදිසිකර බලා, යහපත් දේ තදින් අල්ලා ගනිල්ලා."**

වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාණෝ පැවසූ හ.

**ඔබ (යමක් ගැන, එය වැරදි හෝ නිවැරදි හෝ යනු ස්ථිර වශයෙන් ම තීරණයකට පැමිණීමට නොහැකි ව ඇත්නම්, එම) සැකයේ නොවැටී සිටීමට, සැක සහිත සියලු දෙයකින් ම ඈත් වී සිටින්න.**

---

41. බයිබලයේ 1 - තෙසලෝනික 5 : 21

කි. බැ. ඔබ විනාඩියකට පෙර, බයිබලයේ යෙසායාවෙන් උපුටාගත් වාක්‍යයක සඳහන් **වන ඔවුවන්ගේ** රථය' ගැන පවසා, එයින් සඳහන් වන්නේ මුහම්මද් බව ද මා හට පැවසුවේ ය. එසේ නම්, මුහම්මද්ගේ පැමිණීම පිළිබඳ ව බයිබලයෙහි අනාවැකි ඇත්තේ ද ?

මුස් : ඔව් : නිසැකව ම!

කි. බැ. පරණ ගිවිසුමෙහි ද ? අලුත් ගිවිසුමෙහි ද ?

මුස් : දෙකෙහි ම ඇත. එහෙත්, ඔබ දෙවියන්ගේ ඒකීයභාවය විශ්වාස නොකරනතෙක්, මුහම්මද් (සල්) තුමා ගැන ද බයිබලයෙන් අඳුනාගන්නේ නැත. දැනගෙන පිළිගන්නේ ද නැත. ඒ කියන්නේ, ඔබ - ත්‍රිත්වය, යේසුස් වහන්සේගේ දේවත්වය යේසුස් වහන්සේගේ දේවපුත්‍රභාවය, මුල පාපය, අපගේ පව් පිණිස ප්‍රායශ්චිත්ත කිරීමක් වශයෙන් යේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසා ලේ වැගිරීම වැනි දේ ගැන විශ්වාස කරනතාක් කල් බයිබලයෙ හි මුහම්මද් (සල්) තුමා දැකගත නොහැකි ය. මෙම කරුණු සියල්ල මිනිසා ඇතිකළ ප්‍රතිපත්ති තුළින් උපත ලැබූ ඒවාය.

ජනයින් අනවශ්‍ය ලෙස තමාට වැඳ වැටෙන බවත්, මිනිසුන් විසින් ඇතිකළ ප්‍රතිපත්ති විශ්වාස කරන බවත් යේසුස් වහන්සේ ම මෙසේ පවසා ඇත.

> **මනුෂ්‍යයන්ගේ ශික්ෂාවන් ගුරු කම්කොට උගන්වමින්, ඔවුන් මට නමස්කාර කරන්නේ නිරර්ථකයේ යයි අනාගත වචන මනාකොට කීයේ යයි කීසේක."[42]**

42. බයිබලයේ, ශු මතෙව් 15:9

# 2

# ශුද්ධ වූ බයිබලය

**මුස්. :** බයිබලය ශුද්ධ වූ ග්‍රන්ථයක් බව ඔබ විශ්වාස කරනවා ද?

**කි. බැ. :** ඔව්, මම එය තරයේ විශ්වාස කරමි: එය දෙවියන්ගේ වචනයයි.

**මුස්. :** එසේ නම්, ශු. ලූක් ලේඛනගතකර ඇති ඔහුගේ අදහස් දැනගැනීම වටී. කරුණාකර බයිබලයේ, ශු. ලූක් හි ඇති ප්‍රාරම්භය' කියවන්න.

**කි. බැ. :** **"අති උත්තම තියොපිලස්නි පටන් ගැනීමේ සිට ඇසින් දුටුවාවුන් හා වචනයේ සේවකයන් ව සිටි අය විසින් අපට දන්වා දුන් ප්‍රකාරයට අප අතරෙ හි ඉෂ්ට වී තිබෙන කාරණා ගැන කථා වස්තුවක් රචනාකරන්ට බොහෝ දෙනෙකු විසින් පටන්ගෙන තිබෙන බැවින්, ඔබ යමක් ගැන ඉගනීම ලැබූයෙහි ද ඒ කාරණාවල සත්‍යබව ඔබ විසින් දැනගන්නා පිණිස මමත් මුල පටන් ක්‍රමයට සියලු කාරණා හරියාකාර විමසා බලා, ඒ දේ පිළිවෙළින් ඔබට ලියා එවීම සුදුසු යයි සිතුවෙමි."**[43]

**මුස්. :** මෙම වාක්‍ය ඔබ හට හොඳ හැටි වැටහුනා ද? එසේ නම් දැන් මට කියන්න, ලූක් ම, තමා එක්රැස් කළ ඥානයට තමා ම සියැසින් දුටු සාක්ෂිකරු නොවන බවත්, සියැසින් දුටු වෙනත් සාක්ෂිකරුවන්ගෙන් එය ලබාගත් බවත්, ඒවා දෙවියන් විසින් අනාවරණය කළ වචන බව නොකියාම කියන බවත් පැහැදිලි ව සඳහන් කරන කල, ඔබ බයිබලය දේව වචන රැගත් ශුද්ධ වූ ග්‍රන්ථයක් ලෙස විශ්වාස කරන්නේ කෙසේ ද?

**කි. බැ. :** සමහරවිට බයිබලයේ මෙම (ශු. ලූක්ගේ) කොටස පමණක් දේව වචන නොවිය හැකි ය.

---

43. බයිබලයේ, ශු. ලූක් පළවෙනි පරිච්ඡේදයේ වාක්‍ය 1 සිට 4 දක්වා කියවන්න.

**මුස්.** : ඔබගේ මෙම අදහස වැරදි ය. බොහෝ කලක සිට ම බයිබලය වෙනස්වීම්වලට ලක් වී ඇති බව ඉතිහාසය ඔප්පු කරයි. 1952 හි ද 1971 හි ද නිකුත් වූ බයිබල් ප්‍රකාශනයක් වන 'The Revised Standard Version' හි ද 'New American Standard Bible' සහ 'New World Translation of the Holy Scriptures යනාදියෙහි ද King James Version බයිබලයෙහි තිබුණු සමහර වාක්‍යයන් ඉවත්කොට ඇත. Reader's Digest සඟරාව බයිබලයේ පරණ ගිවිසුම 50% ක් අඩුකොට නිකුත් කළ අතර අලුත් ගිවිසුම 25% ක් පමණ සංක්ෂිප්තකොට නිකුත්කර ඇත. ටික වසරකට පෙර, ක්‍රිස්තියානි ආගමික විද්වතුන්ට බයිබලයේ ඇති අසභ්‍ය කරුණු සියල්ල ඉවත්කොට (de-sex) ශුද්ධ පවිත්‍ර කිරීමට උවමනා විය. බයිබලයට මෙවැනි දුක්ඛිත තත්ත්වයක් උදවී තිබිය දී, ශුද්ධ වූ යන වචනය පමණක් භාවිතා කිරීමෙන්, එය වැරදිවලින් ශුද්ධ වූවක් බවට අදහස් කළ හැකි ද?

**කි. බැ.** : නොහැකි ය. ඔබගේ මෙම අදහස මම සම්පූර්ණයෙන් ම පිළිගනිමි. බයිබලයෙහි මොනවගේ වැරදි ඇති බව ඔබ කියන්නේ ද?

**මුස්.** : උදාහරණයක් වශයෙන්, බයිබලයේ එක් වාක්‍යයක්, යම් කෙනෙක් ඔහුගේ පනස් වියෙහි මරණයට පත් වූ බව සඳහන් කරයි. නමුත්, තවත් වාක්‍යයක් ඔහු ම හැට වියෙහි මැරුණු බව සඳහන් කරයි. දැන් ඔබ සිතා බලන්න. මෙම ප්‍රකාශිත කරුණු දෙක ම නිවැරදි බව කිව හැකි ද කියා. කියන්න බැහැ නේ ද?

**කි. බැ.** : කොහෙත් ම බැහැ. මෙම අදහස් දෙක ම නිවැරදි බව කිසිවිටෙක කියන්න බැහැ. මෙයින් එකක් නිවැරදිවන්න පුළුවනි; නැතහොත්, දෙක ම වැරදි වන්නත් පුළුවනි.

**මුස්.** : ශුද්ධ වූ ග්‍රන්ථයක එකිනෙකට පටහැනි වාක්‍ය ඇත්තේ නම්, එය 'ශුද්ධ වූ' එකක් ලෙස ඇදහිය හැකි ද?

**කි. බැ.** : සත්තකින් ම බැහැ. එවැන්නක් ශුද්ධ වූ ග්‍රන්ථයක් බව මම නොඅදහමි. මක්නිසාද යත්, 'ශුද්ධ වූ ග්‍රන්ථය' යැයි කියන්නේ දෙවියන්

විසින් අනාවරණය කරනු ලැබූ ග්‍රන්ථයකට ය. එය වැරදි හා එකිනෙකට පටහැනි වාක්‍ය අඩංගු වී තිබීම කිසිසේත් විය නොහැකිය:

මුස්. : එසේනම්, එවැන්නක් ශුද්ධ වූ ග්‍රන්ථයක් නොවන බව ඔබ පිළිගන්නවා නේ ද?

කි. බැ. : ඔව්, එය ශුද්ධ වූ ග්‍රන්ථයක් නොවන බවට පැහැදිලි නිසා එලෙස පිළිගැනීමට සිදුවෙයි.

මුස්. : එසේ නම්, එය සියයට සියයක් ම විශ්වාස කිරීමට ඔබ සූදනම් නැහැ; එහෙම නේ ද? මෙම වැරදි හා එකිනෙකට පටහැනි අදහස් බයිබලයෙ හි තිබේ නම් ඊට හේතුව කුමක් විය හැකි ද?

කි. බැ. : ඊට හේතුව, එහි අඩංගු කරුණු සටහන් කිරීමේ දී ඇති වූ වැරදි විය හැකි ය; එම සටහන් ලියූ අය ඕනෑකමින් ම ඇති කළ වෙනස් කිරීම්, ඉවත් කිරීම් හා ඇතුල් කිරීම් විය හැකි ය.

මුස්. : බයිබලයෙ හි එකිනෙකට පටහැනි වාක්‍ය ඇත්තේ නම්, එය 'ශුද්ධ වූ' ග්‍රන්ථයක් බව ඔබ තවත් අදහන්නේ ද?

කි. බැ. : බයිබලයෙ හි එකිනෙකට පටහැනි වාක්‍ය තවමත් මම නුදුටු හෙයින්, එය ශුද්ධ වූ ග්‍රන්ථයක් බව විශ්වාස කරමි.

මුස්. : එහි එකිනෙකට පටහැනි වාක්‍ය රැසක් ඇත.

කි. බැ. : පරණ ගිවිසුමෙ හි ද? අලුත් ගිවිසුමෙහි ද?

මුස්. : දෙකෙහි ම ඇත. එවැනි වාක්‍ය සමහරක් ඔබ ඉදිරියේ තබනු කැමැත්තෙමි. ඔබ විවෘත සිතක් ඇති ව කියවා බලා කල්පනා කරන්න: නිගමනයකට එන්න.

1) **2-සාමුවෙල්, 8 වෙනි පරිච්ඡේදයේ 4 වෙනි වාක්‍යය:**
("දාවිත් ඔහුටත් පහර දී) අසරුවන් එක්දස් සත්සියයක් [44] ද පාබළසෙනඟ විසිදහක් ද ඔහුගෙන් අල්ලාගෙන .... "

**1-ලේකම්, 18 වෙනි පරිච්ඡේදයේ 4 වෙනි වාක්‍යය:**
("දාවිත් හමාත් දක්වා ඔහුට පහරදී) රථ දහසක් ද අසරුවන් සත් දහසක් ද පාබළ සෙනඟ විසි දහසක් ද ඔහුගෙන් අල්ලාගෙන ....

ප්‍රශ්නය : අසරුවන් එක්දස් සත්සියයක් ද? අසරුවන් සත් දහසක් ද? සත්‍යය කුමක් ද?

2) **2-සාමුවෙල්, 8 වෙනි පරිච්ඡේදයේ වාක්‍ය 9 සහ 10 :**
"දාවිත් හදද් එසෙර්ගේ මුළු සේනාවට පහර දුන් බව හමාත් හි රජ වූ තොයි අසා, දාවිත් එසේ හදද්එසෙර්ට විරුද්ධ ව සටන්කොට ඔහුට පහරදුන් නිසා දාවිත්ට ආචාරකරන්ටත් ඔහුට ආශිර්වාද කරන්ටත් ඔහු වෙතට තමාගේ පුත්‍ර වූ යෝරාම් එවූයේ ය. මක්නිසා ද හදද්එසෙර් සහ තොයි අතරේ යුද්ධ පැවතුනේ ය. යෝරාම් රිදී බඩු ද රන් බඩු ද පිත්තල බඩු ද ගෙනාවේ ය."

**1-ලේකම්, 18 වෙනි පරිච්ඡේදයේ වාක්‍ය 9 සහ 10 :**
"දාවිත් ශෝබා හි රජ වූ හදරෙසෙර්ගේ මුළු සේනාවට පහරදුන් බව හමාත් හි රජ වූ තොයූ අසා, දාවිත් එසේ හදරෙසෙර්ට විරුද්ධ ව සටන් කොට ඔහුට පහරදුන් බැවින්, දාවිත්ට ආචාරකරන්ටත් ඔහුට ආශිර්වාද කරන්ටත් ඔහු වෙතට තමාගේ පුත්‍ර වූ හදෝරාම් සහ සියලු ආකාර රන් රිදී පිත්තල බඩුත් එවුවේ ය: මක්නිසා ද හදරෙසෙර් සහ තොයූ අතරේ යුද්ධ තිබුනේ ය."

---

44. බයිබලයේ, සිංහල පරිවර්තනයෙ හි අසරුවන් එක්දස් සත්සියයක් යනු ඇතත්, ඉංග්‍රීසි පරිවර්තනයෙ හි 'Seven hundred horsemen' - අසරුවන් සත්සියයක් යනු ඇත. මෙම පරිවර්තන දෙකෙන් නිවැරදි කොයි එක ද? (බලන්න (2-Samuel 8:4) The Holy Bible, King James Version 1611, Published by Bible society of South Africa, 2nd South African edition 1982, 6th impression - 1988

ප්‍රශ්නය : 'තොයි ද? නැතහොත් තොයූ ද? හදද්එසෙර් ද? නැතහොත් හදද්එසෙර් ද? යෝරාම් ද? නැතහොත් හදෝරාම් ද? සත්‍යය කුමක් ද?

3) **2-සාමුවෙල්, 10 වෙනි පරිච්ඡේදයේ 18 වෙනි වාක්‍යය :** "සිරියවරු ද දාවිත්ට විරුද්ධ ව යුද්ධයට සැරසී ඔහු සමග සටන් කළ විට ඔව්හු ඉශ්‍රායෙල් ඉදිරියෙන් පලාගියෝ ය: දාවිත් සිරියවරුන්ගේ රථ සත්සියයක මිනිසුන් ද අසරුවන් සතළිස් දහසක් ද මරා ඔවුන්ගේ සේනාපති වූ ෂෝබාටත් පහර දුන්නේ ය. ඔහු ද එහි දී මළේ ය."

**1-ලේකම්, 19 වෙනි පරිච්ඡේදයේ 18 වෙනි වාක්‍යය :** "නුමුත් ඉශ්‍රායෙල්වරුන් ඉදිරියෙන් සිරියවරු පලාගියෝ ය: දාවිත් සිරියවරුන්ගෙන් රථ සත්දහසක මිනිසුන් ද පාබළ සෙනග සතළිස් දහසක් ද මරාදමා, සේනාපතියා වූ ෂෝපාක් ද මැරුවේ ය."

ප්‍රශ්නය :
- රථ සත්සියයක මිනිසුන් ද? නැතහොත් රථ සත් දහසක මිනිසුන් ද?
- මරා දමනු ලැබූ සතළිස් දහස අසරුවන් ද? නැතහොත් පාබළ සෙනගද?
- ෂෝබා ද? නැතහොත් ෂෝපාක් ද?

සත්‍යය කුමක් ද?

4) **2-රාජාවලිය, 8 වෙනි පරිච්ඡේදයේ 26 වෙනි වාක්‍යය :** "අහසියා විසි දෑ අවුරුදු වයසේ දී රජ වී යෙරුසලමේ අවුරුද්දක් රජකම් කෙළේය."

**2-ලේකම්, 22 වෙනි පරිච්ඡේදයේ 2 වෙනි වාක්‍යය :** "අහසියා හතළිස් දෑ අවුරුදු වයසේ දී රජ වී අවුරුද්දක් යෙරුසලමෙහි රජකම් කෙළේ ය."

ප්‍රශ්නය : ඔහු රජ වූයේ විසි දෑ අවුරුදු වයසේ ද ? නැතහොත් හතළිස් දෑ අවුරුදු වයසේ ද?
- සත්‍යය කුමක් ද?

5) **2-රාජාවලිය, 24 වෙනි පරිච්ඡේදයේ 8 වෙනි වාක්‍යය :**
"යෙහෝයාඛීන් දහඅට අවුරුදු වයසේ දී රජ වී තුන් මසක් යෙරුසලමෙහි රජකම් කෙළේ ය."

**2-ලේකම්, 36 වෙනි පරිච්ඡේදයෙහි 9 වෙනි වාක්‍යය :**
"යෙහෝයාකීන් දහ අට අවුරුදු වයසේ දී [45] රජකම් කරන්ට පටන්ගෙන, තුන් මස් දස දවසක් යෙරුසලමෙහි රජකම් කෙළේ ය."

ප්‍රශ්නය : ඔහු රජ කළේ තුන් මසක් ද? නැතහොත්, තුන් මස් දස දවසක් ද?
- සත්‍යය කුමක් ද?

6) **2-සාමුවෙල්, 23 වෙනි පරිච්ඡේදයේ 8 වෙනි වාක්‍යය :**
"දාවිත්ට සිටි බලවන්තයන්ගේ නාම මේවා ය: අධිපතීන්ට ප්‍රධාන වූ තාකෙමොනිය යොෂෙබ්-බෂ්ෂෙබෙත් ය: ඔහු එක් වතාවක දී අටසිය දෙනෙකුට විරුද්ධ ව තමාගේ හෙල්ලය ඔසවා ඔවුන් මැරුවේය."

**1-ලේකම්, 11 වෙනි පරිච්ඡේදයේ 11 වෙනි වාක්‍යය :**
"දාවිත්ට සිටි බලවන්තයන්ගේ ගණන මේ ය. හක්මොනියෙකුගේ පුත්‍ර වූ, තිස්දෙනාගෙන් ප්‍රධානියා වූ යාෂොබෙයාම් ය: ඔහු එක් වතාවක දී තුන්සිය දෙනෙකුට විරුද්ධ ව තමාගේ හෙල්ලය ඔසවා ඔවුන් මැරීය."

---

45. ඉංග්‍රීසි බයිබලයෙ 'Eight years old' - 'අට අවුරුදු වයසේ දී' යනු ඇත. බලන්න: 2- Chronicles 36:9, Holy Bible, King James Version 1611, Published by Bible society of South Africa, 2nd South African Edition 1982, 6th impression - 1988. නිවැරදි කොයි එක ද?

ප්‍රශ්නය : ● තාකෙමොනිය ද? නැතහොත්, හක්මොනිය ද?
● මැරුම් කෑවේ අටසිය දෙනා ද? නැතහොත් තුන්සිය දෙනාද?
- සත්‍යය කුමක් ද?

7) 2-සාමුවෙල්, 24 වෙනි පරිච්ඡේදයේ පළවෙනි වාක්‍යය :
"නැවත ස්වාමීන් වහන්සේගේ උදහස ඉශ්‍රායෙල්ට විරුද්ධ ව ඇවුළුණේ ය. උන්වහන්සේ ද ගොස් ඉශ්‍රායෙල්වරුන් ද යුදවරුන් ද ගණන්කරපන්නැ යි කියමින් දාවිත් ඔවුන්ට විරුද්ධ ව පෙළඹෙවූ සේක."

1-ලේකම්, 21 වෙනි පරිච්ඡේදයේ පළවෙනි වාක්‍යය :
"සාතන් ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධ ව නැඟිට ඔවුන් ගණන්කරන්ට දාවිත් පෙළඹෙවුවේය."

ප්‍රශ්නය : 2-සාමුවෙල් 24:1 හි දාවිත්ගේ ස්වාමීන් වහන්සේ වූ දෙවියන්, 1-ලේකම්, 21:1 හි සාතන් වූයේ කෙසේ ද? ඒ අනුව දාවිත්ගේ දෙවියන් සාතන් ද? මෙසේ සිතීමෙන් අල්ලාහ් අපව බේරාගනිත් වා.

8) 2-සාමුවෙල්, 6 වෙනි පරිච්ඡේදයේ 23 වෙනි වාක්‍යය :
"එබැවින් සාවුල්ගේ දුව වූ මීබල් ට ඈ මැරෙන දවස දක්වා දරුවෙක් නො ලැබුණේ ය."

2-සාමුවෙල්, 21 වෙනි පරිච්ඡේදයේ 8 වෙනි වාක්‍යය :
"නුමුත් ඔහු අයාගේ දුව වූ රිශ්පා සාවුල් නිසා වැදූ අර්මොනි ද මෙපිබොෂෙත් ද යන පුත්‍රයන් දෙදෙනා ද සාවුල්ගේ දුව වූ මීබල් මෙහොලාතිය බර්සිල්ලයිගේ පුත්‍ර වූ අද්‍රියෙල් නිසා වැදූ පුත්‍රයන් පස්දෙනා ද ගෙන."

ප්‍රශ්නය : මීබල් ට දරුවන් සිටියේ ද ? නොසිටියේ ද?

**සිත යොමුකළ යුතු කරුණක් :**

**2-සාමුවෙල් 21:8 හි මීබල්** යනු සඳහන් වී ඇති නම **කින්ග් ජේම්ස්** (ඉංග්‍රීසි) පිටපතෙහි ද, **යෙහෝවා: විට්නසස්** Jehovah's Witnesses භාවිතා කරන New World Translation of the Holy Scriptures බයිබලයෙහි ද නොවෙනස් ව ඇත. එහෙත්, The New American Standard Bible- 1973 හි මෙම නම **මෙරාබ්**'(Merab) යනු වෙනස් වී ඇත. ශුද්ධ වූ ග්‍රන්ථයකට අදළ ප්‍රකාශනයන්හි ද, පරිවර්තනයන්හි ද විටින් විට වෙනස්වීම්, අඩුවැඩිවීම් වන බව ඇදහිය හැකි ද? එවැන්නක් **'ශුද්ධ වූ'** වක් විය හැකි ද?

**කි. බැ. :** මීට පෙර කවදවත්, මම මෙම වැරදි කිසිවක් නුදුටු වෙමි. මෙවැනි වැරදි තවත් අධික ලෙස තිබේ ද?

**මුස්. :** ඔබට තවත් අධික ව දැනගන්න උවම නා ද? මෙතෙක් දැනගත් කරුණු ම එය ශුද්ධ වූ ග්‍රන්ථයක් නොවන බව පවසා, ප්‍රතික්ෂේප කිරීමට නොසෑහේ ද? කරුණාකර බයිබලයේ, උත්පත්ති 6 : 3 වෙනි වාක්‍යය බලන්න:

> **"ස්වාමීන් වහන්සේ ද; මාගේ ආත්මය මනුෂ්‍යයා හා සමග සදකල් ම විවාද නොකරන්නේ ය; මක්නිසා ද ඔහුගේ මාංසය ය. එසේ වී නුමුත් ඔහුගේ කාලය එකසිය විසි අවුරුද්දක් වන්නේය යයි කී සේක."**

එහෙත්, නෝවා[46] මරණයට පත් වූ විට ඔහුගේ වයස කොපමණ ද? අවුරුදු 120 වත් අධිකය. මේ බව බයිබලය ම පවසයි.

> **"නොවාගේ සියලු දවස් අවුරුදු නවසිය පනසක් ය; ඔහු මෙළේ ය."** [47]

---

46. නෝවා: නූහ් (අලෛ) වක්තෘවරයා ය.
47. බයිබලයේ, උත්පත්ති 9 : 29

සමහර ක්‍රිස්තියානි වියතුන්ගේ අදහස වන්නේ, මෙම වාක්‍යයන් හි මිනිසාගේ ඉතා අධික වයස් ප්‍රමාණය අවුරුදු 120 ක් ලෙස සඳහන් නොවන බවත්, තවත් අවුරුදු 120 කින් ජල ගැල්මක් ඇතිවීමට ඇති බව සඳහන් වන බවත් ය. මෙම අදහස ද නිවැරදි නොවෙයි. මක්නිසා ද යත්, ජල ගැල්ම ඇතිවෙන කල නෝවාගේ වයස (500+120) අවුරුදු හයසිය විස්සක් විය යුතුයි. නමුත්, බයිබලය පවසන්නේ එවිට එතුමාගේ වයස අවුරුදු හයසියයක් වන බව ය. පහත සඳහන් බයිබල් වාක්‍ය කියවන්න:

> **"නෝවාට අවුරුදු පන්සියයක් වයස් වූ කල ...." [48]**
>
> **"පොළොවෙ හි ජලගැල්ම වූ කල් හි නෝවා අවුරුදු හයසියයක් වයස් ව සිටියේ ය." [49]**

දෙවියන් මිනිසා මවා ඇත්තේ ඔහුගේ ප්‍රතිරූපය අනුව බව ක්‍රිස්තියානි දහම අදහයි. එම ප්‍රතිරූපය මොන පාට ද? තලඑළලු ද? සුදු ද? කළු ද? ශරීරය අතින් පිරිමියෙක් ද නැතිනම් ගැහැණියක් ද?

මෙය පහත සඳහන් බයිබල් වාක්‍යය අනුව බව කියා ඇත.

> **"තව ද, දෙවියන් වහන්සේ: අපගේ ස්වරූපෙයන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදම් හ ..... කීසේක." [50]**

එහෙත්, මෙම වාක්‍යය පහත සඳහන් බයිබල් වාක්‍යයන්ට පටහැනි වෙයි. එම වාක්‍ය මෙසේ ය:

> **"එහෙයින්, නුඹලා දෙවියන් වහන්සේ කාට සමකරන්නහු ද? නොහොත් කොයි රූපාකාරයක් උන්වහන්සේට සමාන කරන්නහු ද?" [51]**
>
> **"ඉතින් නුඹලා මා කාට සමාන කරනවා ද? මා එක සමාන ව සිටින්නේ කාටදැයි ශුද්ධ තැනන් වහන්සේ අසන සේක." [52]**
>
> **"මක්නිසා ද ආකාශයෙ හි කවරෙක් ස්වාමීන්ට සමාන කළ හැකි ද? බලවතුන්ගේ පුත්‍රයන්ගෙන් කවරෙක් ස්වාමීන්ට සමාන වන්නේ ද?" [53]**

---

48. බයිබලයේ, උත්පත්ති 5:32
49. " " 7:6
50. " " 1:26
51. බයිබලයේ, යෙසායා 40:18
52. " යෙසායා 40:25
53. " ගීතාවලිය 89:6

"ස්වාමීන් වහන්ස ඔබට සමාන වූ කිසිවෙක් නැත; ඔබ උතුම් සේක. ඔබගේ නාමය පරාක්‍රමයෙන් උතුම් ව තිබේ. ජාතීන්ගේ රජ්ජුරුවන් වහන්ස ඔබට භය නොවන්නේ කවරෙක් ද? මක්නිසා ද භය විය යුත්තේ ඔබට ය. කුමක් හෙයින් ද ජාතීන්ගේ සියලු ප්‍රඥාවන්තයන් අතරේ ද ඔවුන්ගේ සියලු ම රාජශ්‍රීයෙහි ද ඔබට සමාන වූ කිසිවෙක් නැත." [54]

කි. බැ. : මෙම වාක්‍ය සියල්ල ම බයිබලයේ පරණ ගිවිසුමෙන් ය.

මුස්. : එසේනම්, අලුත් ගිවිසුම වෙත අපගේ සිත යොමුකිරීම හොඳයි නේ ද?

... තුඹලා කිසිකලක උන්වහන්සේගේ හඬ ඇසුවේවත්, උන්වහන්සේගේ රූපාකාරය දුටුවේවත් නැත." [55]

" ... මා දුටු තැනැත්තේ පියාණන් වහන්සේ දුටුවේ ය." [56]

"මම මා ගැන ම සාක්ෂි දෙම් නම්, මාගේ සාක්ෂිය සැබෑ නොවේ." [57]

"යේසුස් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්: මා ගැන ම මා සාක්ෂි දෙතත් මාගේ සාක්ෂිය සැබෑ ය." [58]

මෙම වාක්‍යයන්, අලුත් ගිවිසුමේ ඇති එකිනෙකට පටහැනි වූ බොහෝ වාක්‍යයන්ගෙන් සමහරක් ය. අපි දෙදෙනා තවත් සවිස්තර ව සාකච්ඡා කළහොත් නවීන ක්‍රිස්තියානියේ ඇදහීම් වන ත්‍රිත්වය, යේසුස් වහන්සේගේ දේවත්වය, යේසුස් වහන්සේගේ දේවපුත්‍රභාවය, මූල පාපය, අපගේ පව් පිණිස ප්‍රායශ්චිත්ත කිරීමක් වශයෙන් යේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසා ලේ වැගිරීම යනාදියෙ හි කෙතරම් වැරදි තිබේ ද? එකිනෙකට විරුද්ධ අදහස් තිබේ ද යන්න වටහාගත හැකි ය. තවද, බොහෝ වක්තෘවරුන් වැරදි, අසත්‍ය (මනඃකල්පිත) දෙවියන් නැමදූ බවත්, විවාහකර ගැනීමට තහනම් වූ ලේ නෑදෑයින් සමග සංසර්ගයේ යෙදුණු බවත්, ස්ත්‍රී දූෂණයෙ හි යෙදුණු බවත්, විෂමාචාරයෙ හි යෙදුණු බවත් බයිබලයෙ හි සඳහන් වී ඇත. මෙවැනි අදහස් අඩංගු බයිබලය 'ශුද්ධ වූ' ග්‍රන්ථයක් ලෙස පිළිගන්න ඔබ සූදනම් ද?

---

54. බයිබලයේ, යෙරෙමියා 10:6
55. ශු. යොහන් 5:37
56. ශු. යොහන් 14:9
57. බයිබලයේ, ශු. යොහන් 5:31
58. බයිබලයේ, ශු. යොහන් 8:14

**කි. බැ. :** මෙම අදහස් බයිබලයෙ හි කොතැනක ඔබ කියවූයේ ද?

**මුස්. :** ඔබ විමසූ හෙයින්, එම විස්තර ද නොසඟවා ඔබ ඉදිරියේ තබන්නෙමි. ඔබ අතේ ඇති බයිබලය සමග සසඳා බලන්න.

1) නෝවා (නූහ් - අලෙ - වක්තෘවරයා) වැඩිවියට පැමිණි තම පුතුන් ඉදිරියේ නිර්වස්ත්‍රව සිටින තරම් මත්පැන් බී වෙරි වී සිටි බව මවා පෙන්වා ඇත.

> **"එවිට ෂෙම් සහ යපෙත් වස්ත්‍රයක් ගෙන තමන්ගේ දෙවුර පිට ඒක තබාගෙන පස්සෙන් පස්සට ගොස් තමන් පියාගේ නග්නභාවය වැසුවෝ ය: ඔවුන්ගේ මුහුණු අහකට හැරී තිබුණු බැවින් ඔව්හු තමන් පියාගේ නග්නභාවය නුදුටුවෝ ය. නෝවා තමාගේ මුද්‍රිකපානයන් පිබිද තම බාල පුත්‍රයා තමාට කළ දේ දැනගත්තේ ය."** [59]

2) සාලමොන් (සුලෛමාන් - අලෛ - වක්තෘවරයා) ස්ත්‍රීන් රාශියකින් යුත් වූ අන්තඃපුරයක් ම තබාසිටියා පමණක් නොව අසත්‍ය දෙවිවරුන් නැමදූ බව ද චෝදනා කොට ඇත:

> **"සාලමොන් රජ බොහෝ අන්‍ය ජාති ස්ත්‍රීන්ට එනම් ඵාරාවෝගේ දුව ඇතුළු ව මෝවබ්වරුන්ගේ ද, අම්මොන්වරුන්ගේ ද ඒදෝමිවරුන්ගේ ද සීදෝන්වරුන්ගේ ද හිත්තීවරුන්ගේ ද කාන්තාවන් වූ බොහෝ අන්‍ය ජාතිස්ත්‍රීවරුන්ටත් ආදරේ වූයේ ය. සැබවින් ම ඔවුන් නුඹලාගේ සිත් තමුන්ගේ දෙවිවරුන් වෙතට හරවන බැවින් නුඹලා ඔවුන් අතරට නොයා යුතුය. ඔවුන්ට නුඹලා අතරට එන්ට ඉඩ නොදිය යුතුය කියා ස්වාමීන් වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට යම් යම් ජාතීන් ගැන කීසේක් ද ඒ ජාතීන්ට සාලමොන් ස්නේහයෙන් ඇලුම් වූයේ ය. ඔහුට කුමාරිකා භාර්යාවන් සත්සියයක් ද උප භාර්යාවන් තුන්සියයක් ද සිටියෝ ය. ... සාලමොන් සීදෝන්වරුන්ගේ දේවතාවී වූ අෂ්ටාරෝත් ද අම්මොන්වරුන්ගේ පිළිකුල වූ මිල්කොම් ද අනුව ගොස්, ස්වාමීන් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව තිබුණු දේ කෙළේ ය. .... මෙසේ සාලමොන් තමාට දෙවරක් පෙනී, අන් දෙවිවරුන් පසුව නොයන ලෙස තමාට අණ කලා වූ ඉශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ කෙරෙන් තමාගේ සිත අහක්කර ගත් බැවින්, ස්වාමීන් වහන්සේ ඔහුට උදහස් වූ සේක. ස්වාමීන් වහන්සේ ඔහුට අණ කළ දේ ඔහු පැවැත්තුවේ නැත."** [60]

---

59. බයිබලයේ, උත්පත්ති 9 : 23, 24
60. 1- රාජාවලිය 11 : 1-10

3) ඵාරාවෝ (පිර්අව්න්) හමුවීම සඳහා වක්තෘවරයෙක් වශයෙන් තම සහෝදර (වක්තෘ වූ මූසා - අලෙ) මෝසෙස් තුමා සමග ගිය ආරෝන් (හාරූන් - අලෙ) තුමා, ඉශ්‍රායෙල්වරුන් නැමදීම පිණිස රනින් කරන ලද වහු පැටියෙක් දුන් බව චෝදනා කරනු ලැබ සිටියි!

"ඔහු (ආරෝන්) ඒවා (රන් ආභරණ) ඔවුන් අතින් ගෙන කැටයම් කරන ආවුදයකින් හැඩකොට වාත්තු වස්සෙකු සෑදුවේ ය. ඔව්හු ද එම්බා ඉශ්‍රායෙල්‍ය නුඹ මිසර දේශයෙන් ගෙනාවා වූ නුඹේ දෙවියෝ මේ යයි කීවෝ ය." [61]

4) වක්තෘවරයෙක් වූ ලොත් (ලූත් - අලෙ) තුමා තමාගේ ම දියණියන් දෙදෙනෙක් සමග සංසර්ගයේ යෙදුණු බවට නින්දනීය චෝදනාවක් ඇත:

"... මෙසේ ලොත්ගේ දූවරු දෙදෙනා තමන්ගේ පියා කරණකොට ගෙන ගර්භණී වූවෝ ය."[62]

5) සහෝදරියන් දෙදෙනෙක් එක වරම විවාහ කරගත් වක්තෘවරයෙක් ද බයිබලයෙ හි ඔබට හමුවිය හැකි ය:

"යාකොබ් (යඃකූබ් - අලෙ - වක්තෘවරයා) එසේකොට ඇගේ සතිය සම්පූර්ණ කෙළේ ය. එවිට ඔහු (ලාබන්) තමාගේ දූ වූ රාබෙල් ද ඔහු (යාකොබ්) ට භාර්යාවක් කොට දුන්නේ ය." [63]

6) තවත් වක්තෘවරයෙක් විෂමාචාරයේ හැසුරුණු බව බයිබලය සඳහන් කර සිටියි:

"දිනක් සවස් වේලාවේ දාවිත් (දාවූද් - අලෙ - වක්තෘවරයා) තමාගේ යහනෙන් නැගිට රජගෙදර පියස්ස උඩ සක්මන් කෙළේ ය. එවිට ඔහු ස්ත්‍රියෙක් නානවා පියස්සේ සිට දිටිය. ඒ ස්ත්‍රී පෙනීමෙන් ඉතා ශෝභමාන වූවා ය. දාවිත් පණිවිඩ යවා ස්ත්‍රිය ගැන විභාග කෙරෙව්වේ ය. එක්කෙනෙක් කථාකොට: ඇ එලියාම්ගේ දුව වූ හිත්තීය ඌරියාගේ භාර්යාව වූ බැත් - ෂෙබා නොවේදැ යි කීය. දාවිත් පණිවිඩකාරයන් යවා ඇ ගෙන්වා ගත්තේ ය; ඇ ඔහුළඟට ආවා ය. ඔහු ඇ සමග සයනය කෙළේ ය. ඇ තමාගේ ගෙදරට හැරී ගියා ය. ඒ ස්ත්‍රී ගැබ්ගෙන; මම ගර්භිණීව සිටිමියි දාවිත්ට දන්වා යැවූවා ය." [64]

---

61. බයිබලයේ, නික්මයාම 32:4
62 උත්පත්ති 19:36
63. බයිබලයේ, 2 - සාමුවෙල් 29:28
64. 2 - සාමුවෙල් 11:2-5

**මගේ ප්‍රශ්නය මෙයයි :**
මෙවැනි නින්දිත ක්‍රියාවක, විෂමාචාරයක හැසුරුණු බව බයිබලය සඳහන් කරන දවිත් යේසුස් වහන්සේගේ පරම්පරාවේ ආරම්භකයෙක් ලෙස කෙසේ පිළිගත හැකි ද? සමහරවිට එලෙස පිළිගතහොත් ඔහුගේ පරම්පරාව ම විෂමාචාරයේ හැසුරුණු කෙනෙකුගෙන් පැවත එන එකක් වන බව අදහස් වනවා නේද? මෙවැනි කෙනෙකුගේ තත්ත්වය කුමක් ද යන්න බයිබලය ම පැහැදිලි ව පවසයි:

> **"අවජාතකයෙක් ස්වාමීන් වහන්සේගේ සභාවට ඇතුල් නොවිය යුතු ය: ඔහුගෙන් පැවත එන කිසිවෙක් දසවෙනි පරම්පරාව දක්වා ම ස්වාමීන් වහන්සේගේ සභාවට ඇතුල් නොවිය යුතු ය."** [65]

7) බයිබලයෙන් තවත් චෝදනාවක්: දවිත්ගේ පුත්‍රයා වූ අම්නෝන්, තම සහෝදරිය (Half-Sister) ට බලාත්කාරකම්කොට දූෂණය කළ බව එම චෝදනාවෙන් කියවෙයි:

> **" ... ඔහු ඈ අල්වා: මගේ සහෝදරිය, ඇවිත් මා සමග සයනය කරපන්නැයි ඈට කීවේ ය. එවිට ඈ මාගේ සහෝදරය, එසේ නොවේවා මට අවනම්බු නොකරන්න: ඉශ්‍රායෙල් හි එබඳු දෙයක් කරන්ට යුතු නැත: මේ නින්දිතකම නොකරන්න ... නුමුත් ඔහු ඇගේ හඬට කන්නොදී ඈට වඩා ශක්තිමත් බැවින් ඈට බලාත්කාරකොට ඈ සමග සයනය කෙළේ ය."** [66]

8) දවිත්ගේ තවත් පුත්‍රයෙක් වන අබ්සලොම් තම පියාගේ අනියම් භාර්යාවන් සමහරෙක් දූෂණය කළ බව ද බයිබලය පවසයි:

> **"මෙසේ ඔව්හු ගෙය උඩ අබ්සොලම්ට කූඩාරමක් ගැසුවෝ ය: අබ්සලොම් ද සියලු ඉශ්‍රායෙල්වරුන් ඉදිරියේ දී තමාගේ පියාගේ උප භාර්යාවන් කරා එළඹුනේ ය."** [67]

ඉතාමත් නීච, නින්දිත වනචරයෙක් වුව ද මෙලෙස හැසිරෙයි යන්න මට ඇදහිය නොහැකි ය.

---

65. බයිබලයේ, ද්විතීය කථාව 23:2
66. " 2 - සාමුවෙල් 13 : 11-14
67. " 2 - සාමුවෙල් 16:22

9) තවත් දූෂණයක්: යුද තම ලේලි වූ තාමාර් සමග නොමනා අන්දමින් හැසුරුණේ කෙසේදැ යි බයිබලය විස්තර කරයි. එනම්, යුද තම බැටළුවන්ගේ ලොම් කැපීම පිණිස තිම්නාවට ගියේ ය. එවිට ඔහු තාමාර් දකියි. තාමාර් ඇගේ මුහුණ වසා සිටිහෙයින් ඇය වේශ්‍යාවකැ යි සිතා සංසර්ගයේ යෙදුනාලු:

> "යුද ඇ (තාමාර්) දැක, මුහුණ වසාගෙන සිටි බැවින් ඈ වේශ්‍යාවකැ යි සිතුවේ ය. ඈ තමාගේ යෙහෙළි බව ඔහු නොදැන මාර්ගයේ දී හැරී ඈ ලඟට ගොස්: වරෙන්න, නුඹ වෙත පැමිණීමට මට ඉඩ ඇරපන්නැයි කීවේය. ඈ ද නුඹ මා කරා පැමිණෙන පිණිස මට කුමක් දෙන්නෙහි දැ යි ඇසුවා ය. රැළෙන් එළු පැටවෙකු නුඹට එවන්නෙමියි ඔහු කීය. ඈ: නුඹ ඌ එවනතුරු උකසක් මට දෙන්නෙහි දැ යි ඇසුවා ය. කුමන උකසක් දෙම්දැ යි ඔහු ඇසි ය. නුඹේ මුද්‍රාවත් නුඹේ මාලයත් නුඹේ අතේ තිබෙන සැරයටියත් යයි ඈ කීවා ය. ඔහු ඒවා ඈට දී ඈ කරා පැමිණියේ ය. ඈ ඔහු කරණකොටගෙන ගර්භණී වූවා ය." [68]

ඉශ්‍රායෙල්වරුන් වෙත පැමිණි වක්තෘවරුන් වන යුද, දවිත්, යේසුස් වහන්සේ (අල්ලාහ්ගේ ශාන්තිය හා ආශිර්වාද එතුමන්ට ලැබේවා!) වැනි උතුම් පුරුෂයින්ට විරුද්ධ ව, අයුතු චෝදනා නගමින්, අපහාසකොට පොතක් ලිවීමට මුස්ලිමෙක් නම් කිසිවිටක පෙළඹෙන්නේ නැත: එම උත්තමයින් ස්ත්‍රී දූෂණය, විෂමාචාරය, ලේ ඥාතීන් සමග අයුතු සබඳතා තබා ගැනීම, මත්පැන් පානය කිරීම වැනි මහා පාප ක්‍රියාවන් හි යෙදී සිටිය බව අසත්‍ය ලෙස යම් යම් කරුණු මවා පෙන්වන්න තැත්කරන්නේ ද නැත.

සියලු ම වක්තෘවරුන් මානව සංහතියට යහමග පෙන්වීම සඳහා අල්ලාහ් විසින් එවනු ලැබුවෝ වන්නා හ. වැරදි, අයුතු, නින්දිත, පාප ක්‍රියාවන් හි යෙදෙන්නන් මානව සංහතියට යහමග පෙන්වීමට දෙවියන් විසින් එවන බව ඔබ සිතනවා ද?

**කි. බැ. :** මම කිසිවිටක එසේ නොසිතමි. ඔබ බයිබලය විශ්වාස නොකරන්නේ ද යන්න මට කියන්න.

---

68. බයිබලයේ, උත්පත්ති 38 : 15-18

මුස්. : අපි සියලු ම දේව ග්‍රන්ථ කෙරෙහි විශ්වාසය තබන්නෙමු. එනම්, (කිසිදු වෙනස් කිරීමකට හෝ අඩු වැඩිකිරීමකට හෝ ලක්නොවූ) මුල දී අනාවරණය වූ ආකාරයෙන් එම ග්‍රන්ථ පිළිගන්නෙමු; ඒවා කෙරෙහි විශ්වාසය තබන්නෙමු. දෙවියන් සෑම සමාජයකට ම, සෑම දේශයකට ම අවවාද අනුශාසනා කරන්නන් ලෙස වක්තෘවරයින් එවා ඇත. එම උතුම් වක්තෘවරයින්ගෙන් සමහරෙක් යම් යම් විශේෂ සමාජයන් හට මග පෙන්වීම පිණිස ග්‍රන්ථයන් ගෙන ආහ. ආබ්‍රහම් (ඉබ්‍රාහිම්-අලෛ) තුමාට අනාවරණය කරනු ලැබූ සුහුෆ් (දේව ධර්මය) ද, මෝසෙස් (මූසා-අලෛ) තුමාට අනාවරණය කරනු ලැබූ තෝරාහ් (තව්රාත්) (පරණ ගිවිසුමේ කොටසක්) ද, දවිත් (දවූද්-අලෛ) තුමාට අනාවරණය කරනු ලැබූ සබූර් (Zabour) (ගීතාවලියේ කොටසක්) ද, යේසුස් වහන්සේ (ඊසා-අලෛ) ට අනාවරණය කරනු ලැබූ ඉන්ජීල් (අලුත් ගිවිසුම) ද එම ග්‍රන්ථ වෙයි. නමුත් මේ කිසිදු ග්‍රන්ථයක් ඒවා අනාවරණය කරනු ලැබූ මුල් ආකාරයෙන් ම දැන් නැත.

අල්ලාහ්ගේ මූලික සැලැස්මේ කොටසක් වශයෙන්, ඔහු අවසාන ව වක්තෘවරුන්ගේ පැමිණීම නිමකර දක්වන මුද්‍රාවක් ලෙස මුහම්මද් (සල්) තුමා එවූවේ ය. එතුමාගේ මාර්ගයෙන් අනාවරණය වූ අනගි ග්‍රන්ථයකි අල් කුර්ආනය. එම ග්‍රන්ථය කාලය, භාෂාව, දේශය යනාදිය ඉක්මවා ගොස් මුළු මානව සංහතියට ම යහමග පෙන්වා දෙන්නකි.

යේසුස් වහන්සේ ම, තමා එවනු ලැබුවේ ඉශ්‍රායෙල් ජනතාව වෙත පමණය යනු පැවසී ය:

"ඉශ්‍රායෙල් වංශයේ නැතිවුණු බැටළුවන් වෙතට මිස අන්‍යයන් වෙතට මම එවනු නොලද්දෙමි යි කීසේක." [69]

> **ඈ පුත්‍රයෙකු වදන්නී ය; උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න; මක්නිසාද, තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපවලින් ගළවන්නේ උන්වහන්සේ යයි කීවේ ය."** [70]

---

69. බයිබලයේ, ශු. මතෙව් 15:24
70. බයිබලයේ, ශු. මතෙව් 1:21

තව ද, 'මම වෙනස් කිරීම පිණිස නොව සම්පූර්ණ කිරීම පිණිස පැමිණියෙමි' යනුවෙන් යේසුස් වහන්සේ ම පවසා ඇත.
එම වාක්‍යය මෙසේ ය:

**'ව්‍යවස්ථාව හෝ අනාගත වාක්‍යය හෝ අවලංගු කරනු පිණිස මම ආවෙමියි නොසිතල්ලා. සම්පූර්ණ කරන්ට මිස අවලංගු කරන්ට නාවෙමි. සැබවක් නුඹලාට කියමි. අහසත් පොළොවත් පහව යන තෙක්, සියල්ල සිදුවන තුරු, ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේ ය.'[71]**

**කි. බැ. :** නමුත්, යේසුස් වහන්සේ පහත සඳහන් පරිදි පවසා ඇති බව ඔබ නොදන්නේ ද?

**'උන්වහන්සේ ඔවුන්ට කියන සේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා.'[72]**

**මුස්. :** පළමු ව, මෙම වාක්‍යය ඉහත සඳහන් (ශු. මතෙව් 15:24 හා ශු. මතෙව් 1:21) වාක්‍ය දෙකට ම පටහැනි ව ඇති බව ඉතා පැහැදිලියි. දෙවනු ව, ශු. මාර්ක් හි ඇති 16 වෙනි පරිච්ඡේදයේ 9 වෙනි වාක්‍යය පටන් 20 වෙනි වාක්‍යය දක්වා වූ වාක්‍ය සියල්ල බොහෝ බයිබල්වලින් ඉවත් කොට ඇත. මෙහි ඔබ උපුටා පෙන්වූ 15 වෙනි වාක්‍යය ද ඊට අඩංගු ය. 'The New American Standard Bible' යනු බයිබලයෙ හි, මෙම ශු. මාර්ක් 16 වෙනි පරිච්ඡේදයේ 9 වෙනි වාක්‍යය පටන් 20 වෙනි වාක්‍යය දක්වා වරහන්වලින් කොටුකර සමහර පැරණි අත් පිටපත්වල මෙම 9 වෙනි වාක්‍යය පටන් 20 වෙනි වාක්‍යය දක්වා වූ වාක්‍යයන් අත්හැර ඇත යනු සඳහන්කොට ඇත. 'Jehovah s Witnesses' නම් වූ කොටස භාවිතාකරන, 'The New World Translation of the Holy Scriptures' යනු බයිබලය, සමහර පැරණි බයිබල්වල ශු. මාර්ක් 16:8 වෙනි වාක්‍යයෙන් පසු ඉතා දීර්ඝ හෝ කෙටි නිගමනයක් ලියා එකතුකොට ඇති බව පිළිගෙන ඇත: නමුත්, සමහරෙක් මෙය ද පැහැර හැර ඇති බව ද කියා ඇත. 'The Revised Standard Version' යනු බයිබලයෙහි පහත සඳහන් අධෝලිපිය (Footnote) ලියා ඇත: **'ඉතා පැරණි සමහර විශේෂ බලය ලත් අය විසින් ශු. මාර්ක් විසින් ලියන**

---

71. බයිබලයේ, ශු. මතෙව් 5:17,18

72. බයිබලයේ, ශු. මාර්ක් 16:15

ලද ශුභාරංචිය' 8 වෙනි වාක්‍යයෙන් නිමකොට ඇත" මෙම අධෝලිපිය තුළින් තවත් අදහසක් මතුවෙයි. එනම්, යේසුස් වහන්සේ නැවත නැගිට එන බව පැවසීමෙ හි කිසිදු සත්‍යයක් නොමැති බව ය. මේ ගැන සඳහන් වී ඇත්තේ ශු. මාර්ක් 16:9 වෙනි වාක්‍යයෙහි ය. (ඉහත සඳහන් කරුණු අනුව මෙම වාක්‍යය (ශු. මාර්ක් 16:9-20) නැති බව හෝ ඉවත් කොට ඇති බව හෝ ඉතා පැහැදිලි ය.

**කි. බැ. :** එහෙත්, යේසුස් වහන්සේ පහත සඳහන් ලෙස පවසා ඇති බව බයිබලය කියයි: එය වසන් කිරීම වැරදි බව මගේ හැඟීමයි.

"එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා." [73]

**මුස්. :** මෙහි වසන් කිරීමක් නැත. මෙම වාක්‍යයෙ හි සියලු ජාතීන් යනුවෙන් සඳහන් වී ඇත්තේ ඉශ්‍රායෙල්වරුන්ගේ ගෝත්‍ර දොළහ' බව පිළිගත යුතු ය. එසේ නැතිවිට, සියලු ජාතීන් යනු වචන දෙක වෙනුවෙන් අපි ගන්නා වෙනත් අදහසක් වේ නම්, එම අදහස ඉහත සඳහන් බයිබල් වාක්‍යයන් වන ශු. මතෙව් 15:24 ටත්, ශු. මතෙව් 1:21 ටත් පටහැනි වන බව ඒකාන්ත ය. තව ද 'New American Standard Bible' හි ද 'New World Translation of the Holy Scriptures' හි ද සියලු ජාතීන්' යනු පරිවර්තනයකොට නැත. ඒවා හි ඇත්තේ 'ඒ සියලු ජාතීන්ට ම' යනු ය. මෙයින් පැහැදිලිව ම පෙන්වන්නේ ඉශ්‍රායෙල්වරුන්ගේ ගෝත්‍ර දොළහ ය. දැන්, බයිබලය ගැන ඔබ සිතන්නේ මොනවා ද?

**කි. බැ. :** ඒ ගැන මගේ විශ්වාසය දැන් ටිකින් ටික දුර්වල වීගෙන යයි.

**මුස්. :** අප දෙදෙනා ඉතාමත් සුහද ව සාකච්ඡා කළෙමු: අපගේ ආගම් දෙක අතර ඇති වෙනස්කම් ගැන ද දැඩි අවධානයෙන් යුතු වූ පරීක්ෂණයක් පැවැත්වීමු. මෙයින්, ඉස්ලාමය කෙතරම් උසස්, විශ්වාස කටයුතු ආගමක් ද යනු ඔබට වැටහී ඇතැයි මම විශ්වාස කරමි.

---

73. බයිබලයේ, ශු. මතෙව් 28:19

# 3

# ත්‍රිත්වය කාගේ නිපැයුමක් ද?

**මුස්. :** ඔබ ත්‍රිත්වය අදහන්නේ ද?

**ක්‍රි. බැ. :** නිසැකයෙන් ම! මේ පිළිබඳ ව යොහන්ගේ පළමුවෙනි සාමාන්‍ය පත්‍රයෙ හි සඳහන් වී ඇත.

> **"ස්වර්ගයේ සාක්ෂි දරන තුන්දෙනෙක් වෙති. එනම් - පියාණන් වහන්සේ, වචනය, ශුද්ධ වූ ආත්මය යන්නෝ වෙති. මේ තුන්දෙනා ම එක් ව සිටිති. ලෝකයේ සාක්ෂි දරන තුනක් වෙයි. එනම් - ආත්මය, වතුර, ලේ යනාදිය වෙයි. මේ තුනම එක්වී ඇත."[74]**

**මුස්. :** මෙම වාක්‍යය ඇත්තේ ක්‍රි. ව. 1611 දී ප්‍රකාශිත, ඉතා වැදගත් විශ්වාසිත බයිබලයක් ලෙස සැලකෙන 'King James Version' හි ය. මෙම බයිබලයෙ හි ත්‍රිත්වය පිළිබඳ ව බලවත් සාක්ෂි ඇත. එහෙත්, දැන් 'පියාණන් වහන්සේ, වචනය හා ශුද්ධ වූ ආත්මය නම් වූ තුන ම එක් ව සිටිති' යන මෙම කොටස 1952 දී හා 1971 දී ප්‍රකාශනයට පත් වූ 'The Revised Standard Version' බයිබලයෙන් සහ තවත් බයිබල් රාශියකින් ඉවත් කොට ඇත. ඊට හේතුව, ග්‍රීක් භාෂාවෙන් වූ බයිබලය තුළ ට ඇතුල් කරනු ලැබූ ඔප දැමීමේ කොටසක් ව මෙය තිබීම ය.

'New American Standard Bible' යෙහි 1-යොහන් 5:7,8 වාක්‍යයන් ඇත්තේ පහත සඳහන් ලෙස ය.

> **"සාක්ෂි දෙන්නේ ආත්මයාණන් වහන්සේ ය. මක්නිසා ද ආත්මයාණන් වහන්සේ සත්‍යතාවය සාක්ෂි දරන තුන්දෙනෙක් සිටිති; ආත්මයාණන් වහන්සේ ය; වතුර ය; ලේ ය. මේ තුන්දෙන ම එකඟවෙති."[75]**

---

74. බයිබලයේ, 1 - යොහන් 5:7 සහ 8 වෙනි වාක්‍යයන්. මෙහි ඇත්තේ King James Version - 1611 (ඉංග්‍රීසි) බයිබලයෙන් පරිවර්තනය කළ වාක්‍යයන් ය.

75. මෙම පරිවර්තනය සඳහා අපි භාවිතාකරන සිංහල බයිබලයෙ හි සඳහන් වී ඇත්තේ ද මෙලෙසම යි. (**'ස්වර්ගයේ සාක්ෂි දරන තුන්දෙනෙක් වෙති. එනම්, පියාණන්** වහන්සේ, වචනය, ශුද්ධ වූ ආත්මය යන්නෝ වෙති. මේ තුන්දෙනා ම එක් ව සිටිති' යනු කොටස සිංහල බයිබලයෙන් ද ඉවත්කොට ඇති බව සැලකිය යුතුයි.)

'Jehovah's Witnesses' නම් වූ ක්‍රිස්තියානි කොටස භාවිතා කරන 'New World Translation of the Holy Scripture හි මෙම වාක්‍ය (1-යොහාන් 5:7,8) මෙසේ ඇත:

**"සාක්ෂි දරන තුන්දෙනෙක් සිටිති: ආත්මයාණන් වහන්සේ ය: වතුර ය: ලේ ය. මේ තුන්දෙන ම එකඟ වෙති."**

මෙම වැදගත් ( පියා, වචනය, ශුද්ධ වූ ආත්මය එක් වී ඇත්තෙමු) කොටස බයිබලයෙන් ඉවත්කොට තිබීම ඔබ නොදන්නේ නම් එය මම වටහා ගනිමි. නමුත්, බොහෝ පාදිලිවරුන් ද ක්‍රිස්තියානි ප්‍රචාරකයින් ද මෙය නොදැන සිටීම මට අදහාගන්න බැරි ප්‍රහේළිකාවක් ය: පුදුමයක් ය:

ත්‍රිත්වය බයිබලය පදනම්කොට ඇති වූ ප්‍රතිපත්තියක් නොවේ. ත්‍රිත්වය' යනු වචනය පවා බයිබලයේ හෝ බයිබල් ශබ්ද කෝෂයන් හි හෝ සඳහන් නොවෙයි. මේ පිළිබඳ ව යේසුස් වහන්සේ කිසිවිටක දේශනා කළේ ද නැත: කුමන අවස්ථාවක වුව ද සාමාන්‍යයෙන්වත් මේ ගැන සඳහන් කළේ ද නැත. ත්‍රිත්වය පිළිගැනීම පිණිස බයිබලයෙ හි කිසිදු සාක්ෂියක් ද නොමැත.

**කි. බැ. :** බයිබලයේ, ශු. මතෙව් 28:19 වෙනි වාක්‍යයෙ හි මෙසේ ඇත.

**"පියාණන්ගෙත්, පුත්‍රයාණන්ගෙත්, ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තීස්ම කරපල්ලා."**

මෙම වාක්‍යය තවමත් ඉවත්කොට නැත. එහෙයින්, මෙය ත්‍රිත්වයට සාක්ෂියක් නොවන්නේ ද?

**මුස්. :** සාක්ෂියක් නොවන බවයි මගේ පිළිතුර. තිදෙනෙක් එකට වාඩිවී සිටින බව හෝ ආහාර අනුභව කරන බව හෝ ඔබ කියන්නේ නම්, එයින් එම තිදෙනා ම එක්කෙනෙක් වන බව අදහස් වෙයි ද? නැහැ නේ ද? මෙම ත්‍රිත්වවාදය එවැන්නකි: මෙය ඇති වූ ආකාරය විශ්ම ජනකය.

යේසුස් වහන්සේ මෙලොවින් නික්ම ගොස් ශත වර්ෂ තුනකටත් අධික කාලයක් විය. එවකට ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ පහත් පන්තියේ දේවගැතියෙක් වූ 'ඇතනේසියස්' (Athanasius) නමැත්තා විසින් ය, මෙම ත්‍රිත්වවාදය ඇතිකරනු ලැබුවේ. පසුව එය ක්‍රි. ව. 325 හි දී නිකේශී මණ්ඩලය (Council of Nicacea) විසින් අනුමත කරන ලදී. රෝම බහුදේවවාදයේ ආනුභවය මෙම ත්‍රිත්වවාදය කෙරෙහි ඇතිවී ඇති බවට කිසිදු සැකයක් නැත: ඔවුන්ගේ සබත් (Sabbath) දිනය ඉරුදිනට වෙනස්කොට ඇත: රෝමානුන්ගේ ඉරුදෙවි වන මිත්රා (Mithra) ගේ උපන් දිනය වූ දෙසැම්බර් 25 වෙනිද යේසුස් වහන්සේගේ උපන් දිනය බවට පරිවර්තනය කොට ඇත. මෙම බයිබල් වාක්‍යය කියවන්න.

> **"ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක. ජාතීන්ගේ මාර්ගය ඉගෙන නොගනිල්ලා, අහසේ ලකුණුවලට ජාතීන් කැලඹෙන නුමුත් නුඹලා ඒවාට නොකැලඹෙල්ලා; මක්නිසාද ජනයින්ගේ චාරිත්‍ර නිෂ්ඵලය. එසේ ය, කෙනෙක් වනයෙන් ගහක් කපාගනිති; එය කම්කරුවාගේ අත්වලින් පොරවෙන් කරන වැඩක් ය. ඔව්හු ඒක රන්රිදීවලින් සරසා, නොසෙල්වෙන ලෙස ඇණවලින් ද මිටිවලින් ද සවිකරති. ඒවා තල්ගහක් මෙන් වටකුරු කර තිබේ. ඒවා කථාකරන්නේ නැත. අඩිතබායන්ට ඒවාට බැරි නිසා උසුලාගෙනයන්ට ඕනෑ ය. ඒවාට භය නොවෙල්ලා; මක්නිසා ද අනතුරු කරන්ට ඒවාට බැරි ය. යහපත කිරීම ද ඒවාට නැත."** [76]

ඇත්ත වශයෙන් ම, ක්‍රිස්තියානි ආගම යේසුස් වහන්සේගේ මූලික ඉගැන්වීම්වලින් ඈත් වී බොහෝ දුර ගොස් ඇත. ක්‍රිස්තියානි දින දර්ශනය වශයෙන් රෝම ජූලියන් (Roman Julian Calender) දින දර්ශනය හඳුන්වනු ලැබ ඇත: ඌරුමස් අනුභව කිරීම අනුමතකොට ඇත: චර්මඡේදනය කිරීම පාවුල් විසින් අහෝසිකොට ඇත.

පාවුල් මෙසේ කියා ඇත:

> **"ඉදින් නුඹලා චර්මඡේදාය ලබන්නහු නම්, ක්‍රිස්තුස් වහන්සේගෙන් නුඹලාට කිසි ප්‍රයෝජනයක් නොලැබෙන බව පාවුල් නම් මම නුඹලාට කියමි."** [77]

---

76. බයිබලයේ, යෙරෙමියා 10 : 2 - 5
77. බයිබලයේ, ගලාති 5:2

මෙවැනි අවස්ථාවක, අල්ලාහ් තමාගේ මූලික සැලසුම අනුව මෙම වැරදි ක්‍රියා නිවැරදි කොට මිනිස් සංහතිය යහමග යැවීම සඳහා අවසාන වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා යැවූවේ ය.

අල් කුර්ආනය මෙසේ පවසයි:

**"එකම දෙවියෝ හැර (වැඳුම් පිදුම් කිරීමට) අන් දෙවියෙක් නැති ව සිටිය දී අල්ලාහ් තුන්දෙනාගෙන් එක් කෙනෙක් යයි කියූ අය ප්‍රතික්ෂේප කරන්නෝ ම වෙයි. ඔවුන් කියන දැයින් නොවැළැකී සිටින්නේ නම්, ඔවුන්ගෙන් ප්‍රතික්ෂේප කරන අයට වේදනීය දඬුවම් ලැබෙනවා නියත ය."**[78]

යේසුස් වහන්සේ විසින් දේශනා නොකරනු ලැබූ ත්‍රිත්වය, ඔබ තව මත් විශ්වාස කරන්නේ ද?

**කි. බැ. :** දෙවියන් හා යේසුස් වහන්සේ යනු එක්කෙනෙකි. මේ පිළිබඳ ව බයිබලය මෙසේ පවසයි:

**"මම පියාණන් වහන්සේ තුළෙහිත් පියාණන් වහන්සේ මා තුළෙහිත් සිටින සේක යන මාගේ කීම විශ්වාස කරපල්ලා."** [79]

**මුස්. :** එසේ නම් බයිබලයේ මෙම වාක්‍යය කියවන්න:

**කි. බැ. :** **"(ගෝලයන් වූ) ඔවුන් සියල්ලන් ඒකත්වක් වන පිණිස, පිය වූ ඔබ මා තුළෙහි ද මා ඔබ තුළෙහි ද සිටින්නාක් මෙන් ම ඔබ මා එවූ බව ලෝකයා විශ්වාස කරන පිණිසත්, අප තුළ ඔවුන් ඒකත්වයක් වන පිණිසත් යාච්ඤා කරමි."** [80]

**මුස්. :** මෙම වාක්‍යයෙ හි දෙවියන් සහ යේසුස් වහන්සේ යනු එක්කෙනෙක් බව පැහැදිලි ව ඇත. එමෙන් ම, ගෝලයෝ ද යේසුස් වහන්සේ හි සහ දෙවියන් හි එක් වී, එක්කෙනෙක් ව සිටින බවත් පැහැදිලි ව ම සඳහන් වී ඇත. යේසුස් වහන්සේ දෙවියන් හි එක් වී සිටින බව වූ හේතුව නිසාම එතුමාත් දෙවියන් වන්නේ නම්, එතුමා මෙන් ම දෙවියන් හි එක් වී සිටින එතුමාගේ ගෝලයෝත් දෙවියන් විය

---

78. අල් කුර්ආන් 5:73
79. බයිබලයේ, ශු. යොහන් 14:11
80. ,, ,, 17:21

නොහැකි ද? දෙවියන්, යේසුස් වහන්සේ හා ශුද්ධ වූ ආත්මය යනාදී තුන්දෙනා එක් වී එක ම දෙවියෙක් යනු වූ ත්‍රිත්වය ඇතිවිය හැකි නම්, මෙම තුන්දෙනාත් සමග යේසුස් වහන්සේගේ ගෝලයන් දෙළොස් දෙනාත් ඇතුළු ව, පහළොස් දෙනාගෙන් සමන්විත වූ එක දෙවියෙක් ඇතිවිය නොහැකි ද?

**කි. බැ. :** කෙසේ වෙතත්, යේසුස් වහන්සේ දෙවියන් වන්නේ ය. ඊට පහත සඳහන් බයිබල් වාක්‍යය සාක්ෂි වෙයි:

> **" .... මා දුටු තැනැත්තේ පියාණන් වහන්සේ දුටුවේ ය." [81]**

**මුස්. :** දැන් අප දෙදෙනා ඔබ සඳහන් කරන මෙම වාක්‍යයට පෙර හා පසුව ඇති කොටස් දෙස බලමු.

> **"පිලිප් ද, ස්වාමීනි, පියාණන් වහන්සේ අපට පෙන්නුව මැනව. ඒ අපට ඇතැයි උන්වහන්සේට කීවේ ය. යේසුස් වහන්සේ ඔහුට කියන සේක්: පිලිප්, මා මෙපමණ කල් නුඹලා සමග සිටලාත් මා අඳුනන්නේ නැද්ද? මා දුටු තැනැත්තේ පියාණන් වහන්සේ දුටුවේ ය. එසේවී නම් පියාණන් වහන්සේ අපට පෙන්නුව මැනවයි නුඹ කියන්නේ කෙසේ ද?" [82]**

මේ අනුව, අවසානයේ දී පිලිප් ඇමතූ යේසුස් වහන්සේ, 'බැලීමට නොහැකි දෙවියන්ගේ ආකාරය ගෝලයන්ට කෙසේ පෙන්විය හැකි දැයි' විමසූ බව පෙනෙනවා නේ ද? එහෙයින්, දෙවියන්ගේ මැවීම් ගැන කල්පනාකර ඔහු ව විශ්වාස කළ යුතුයි. ඔහුගේ මැවීම් වන ඉර, හඳ හා අනෙකුත් දේ ගැන සිතා බලන්න. ඔහුගේ මැවීමක් වන යේසුස් වහන්සේ ගැන ම සිතා බලන්න. එවිට දෙවියන් ගැන යහපත් වැටහීමක් ඇතිවෙයි; විශ්වාසයක් ද ඇතිවෙයි. !

යේසුස් වහන්සේ පැවසූ හ:

> **"දෙවියන් වහන්සේ ආත්මයක් ය ..... " [83]**
>
> **" ... නුඹලා කිසිකලක උන්වහන්සේගේ හඬ ඇසුවේවත් උන්වහන්සේගේ රූපාකාරය දුටුවේවත් නැත." [84]**

---

81. බයිබලයේ, ශු. යොහන් 14:9
82. " 14 : 8, 9
83. බයිබලයේ, ශු. යොහන් 4:24
84. " " 5:37

එසේනම්, ඔබ ආත්මයක් බැලිය හැක්කේ කෙසේ ද? ඔවුහු දැක ඇත්තේ යේසුස් වහන්සේ මිස දෙවියන් නොවෙයි: වැටහෙනවා ද?

ජේරිත වූ පාවුල් මෙසේ ලියා ඇත:

"...කිසි මනුෂ්‍යයෙකු විසින් නුදුටුවා වූ, දකින්ටත් බැරි වූ තැනන් වහන්සේ..."[85]

එසේ නම්, ඔබට බැලිය හැකි යමක් වේ ද, එය නියත වශයෙන් ම කිසිවිටක දෙවියන් නොවෙයි: මෙය ඉහත සඳහන් වාක්‍යය පැහැදිලි කරයි.

අපගේ ශුද්ධ වූ අල් කුර්ආනය මෙසේ පවසයි:

"පියැවි ඇසට ඔහු හසුකරගත නොහැකි ය. එනමුත් ඔහු සියල්ලන් ගේ ම (සෑම) බැල්මක් ම දැන (වෙලා) සිටින්නේ ය. ඔහු සියල්ල මැනවින් තේරුම් ගත්තා ද සියල්ල මැනවින් දන්නා ද වේ." [86]

කි. බැ. : සිතට එකඟ ව කියන්නේ නම්, කුඩා කළ පටන් අපට උගන්වනු ලැබූ යම් යම් කරුණු එකවරම ප්‍රතික්ෂේප කිරීම කළ හැකි නොවේ. එය තරමකට අමාරු කාර්යකි.

මුස්. : මම මෙසේ කිරීමට නොකියමි. නමුත්, අපි පිළිගන්නා යමක් වේ නම් එය වැටහීමකින් කළ යුතුයි. දැන්, ඔබ ත්‍රිත්වය පිළිබඳ ව හොඳ වැටහීමක් ලබාගත යුතු යි. ඊට 'ශුද්ධ වූ ආත්මය යනු කුමක් ද?' යන ප්‍රශ්නය ඔබට මග පෙන්වනු ඇතැයි මම අදහස් කරමි.

කි. බැ. : 'ශුද්ධ වූ ආත්මය යනු ශුද්ධාත්මයාණන් වෙයි: දෙවියන් ද වෙයි. පියා දෙවියන් වන්නේ ය: පුත්‍රයා දෙවියන් වන්නේ ය: ශුද්ධාත්මයාණන් දෙවියන් වන්නේ ය' යනු ය අපට උගන්වා ඇත්තේ. එහෙත්, දෙවියන් තිදෙනෙක් බව කීමට අපට අවසර නැත: කිවයුත්තේ එක ම දෙවියෙක් බව ය:

මුස්. : එසේ නම්, කරුණාකර බයිබලයේ, ශු. මතෙව් හි පළවෙනි පරිච්ඡේදයේ 18 වෙනි වාක්‍යය කියවනවා ද?

85. බයිබලයේ, 1 - තිමෝති 6:16

86. අල් කුර්ආන් 6:103

**කි. බැ. : යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තිය මෙසේ විය. උන්වහන්සේගේ මවු වූ මරියා යෝසෙප්ට විවාහබස් දී සිටියදී, ඔවුන් එක්වෙන්ට පළමුවෙන්, ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ඈ ගර්භනී වූ බව දැනගන්නා ලදී." [87]**

මුස්. : දැන්, කරුණාකර මෙම වාක්‍යය බයිබලයේ, ශු. ලූක් හි පළවෙනි පරිච්ඡේදයේ 26 හා 27 වෙනි වාක්‍යයන් සමග සසඳා බලන්න.

කි. බැ. :

සවෙනි මාසයේදී, ගලීලයේ නාසරෙත් නම් නුවරක විසූ, දාවිත්ගේ වංශයෙහිවූ යෝසෙප් නම් මනුෂ්‍යයෙකුට විවාහබස් දී සිටි, කන්‍යාවකු වෙතට දෙවියන්වහන්සේ වෙතින් ගාබ්‍රියෙල් නම් දූතයා යවනලද්දේය; ඒ කන්‍යාවගේ නාමය මරියාය.

මුස්. : මෙම වාක්‍ය දෙක ම යේසුස් වහන්සේගේ ආශ්චර්යමත් උපත පිළිබඳ ව අදහස් දෙකක් ඉදිරිපත් කරයි. මතෙව්ගේ අදහස ශුද්ධාත්මයාණන් බව වන අතර ලූක්ගේ අදහස ගාබ්‍රියෙල් නම් වූ දූතයා වෙයි. එසේනම් ශුද්ධාත්මයාණන් යනු කවරෙක් ද ?

**කි. බැ. :** ශුද්ධාත්මයාණන් යනු දේව දූත ගාබ්‍රියෙල් වෙයි !

මුස්. : දැන් කියන්න: ඔබ තවත්, මෙම ත්‍රිත්වය කෙරෙහි විශ්වාසය තබන්නේ ද?

**කි. බැ. :** මේ අනුව බලන විට, දෙවියන් දෙවියන් ම ය: ශුද්ධ වූ ආත්මයාණන් හෝ ශුද්ධ වූ ආත්මය හෝ යනුවෙන් සඳහන් වන්නේ දේව දූත ගාබ්‍රියෙල් ය: එසේ නම් යේසුස් වහන්සේ .....

මුස්. : මේ අහන්න: යේසුස් වහන්සේ (දෙවියන්ගේ) වක්තෘවරයෙක් වෙයි: එතුමා මරියාගේ පුත්‍රයා ය.

---

87. බයිබලයේ, ශු. මතෙව් 1:18

**කි. බැ.** : අපි අභිරහසක් බව සලකන යමක් ඔබ විසඳන්නේ කෙසේ ද?

**මුස්.** : කලින් අනාවරණය කරන ලද දේව ග්‍රන්ථයන් හි මිනිසුන් විසින් කරනු ලැබූ වෙනස්කම් ද, දෙනු ලැබූ වැරදි අදහස් ද නිරාකරණය කිරීම පිණිස අපි අල් කුර්ආනය මිම්මක් ලෙස භාවිතා කරන්නෙමු. ඔබට දැන් දෙවියන්ගේ ඒකීයභාවය හා මරියාගේ පුත්‍රයා වූ යේසුස් වහන්සේගේ වක්තෘභාවය විශ්වාස කළ හැකි නම්, තවත් යම්තම් ඉදිරියට අවුත් මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ අවසාන වක්තෘවරයා වශයෙන් ද පිළිගන්නට පසුබට වන්නේ ඇයි?

සත්‍යය පිළිගන්න තවත් පසුබට නොවන්න. එන්න: මා සමග ෂහාදහ් යනු වූ සාක්ෂිය - ස්ථිර ප්‍රකාශය - පළමුව, ඉංග්‍රීසියෙන් ද, දෙවනුව, අරාබි භාෂාවෙන් ද කියන්න:

**කි. බැ.** : **"අල්ලාහ් හැර (නැමදීමට, අවනත වීමට, නීති සම්පාදනය කිරීමට) වෙන දෙවි කෙනෙක් නැත: මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දසයෙක් හා වක්තෘවරයෙක් වෙයි යනු මම සාක්ෂි දරමි."**

**"අෂ්හදු අන්ලාඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීකලහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වර සූලුහූ"**

මට තවත් කරුණක් පැහැදිලි කරන්න. මගේ මුතුන් මිත්තන්ගේ තත්ත්වය කුමක් ද? මම ඔවුන්ගෙන් ඈත් වී සිටීමට නොකැමැත්තෙමි. ඔවුහු සියල්ලෝ ම ක්‍රිස්තියානීන් ව සිටිය හ.

**මුස්.** : ආබ්‍රහම් (ඉබ්‍රාහිම් - අලෛ) තුමා වෙත සත්‍යය වූ ඉස්ලාමය අනාවරණය වූ විට, එතුමා තම දෙමාපියන් හා මුතුන් මිත්තන්ගෙන් ඈත් වූ හ. ලොව වෙසෙන සියලුදෙනා ම ඔවුනොවුන්ගේ ක්‍රියාවන් වෙනුවෙන් ඔවුනොවුන් ම වගකිවයුත්තෝ වෙති. සමහරවිට, ඔබට සත්‍යය මෙතරම් පැහැදිලි ව ලැබුණා සේ ම ඔබගේ මුතුන්මිත්තන්ට නොලැබෙන්නට ඇත.

අල් කුර්ආනය මෙසේ පවසයි:

> **"යමෙක් සෘජු මගෙ හි ගමන් කරන්නෙ හි ද ඔහු තම යහපත පිණිස ම සෘජු මගෙ හි ගමන් කරන්නේ ය. යමෙක් නොමග ට යන්නෙහි ද ඔහු තමා හට ම විනාශය ඇති කර ගන්නෙහි ය. නියත වශයෙන් ම කෙනෙකුගේ පව් අන්කෙනෙකු උසුලන්නේ නැත. (අපගේ) වක්තෘවරයාණන් එවන තෙක් (කිසිවෙකුටත්) අපි වේදනාවන් නොදෙමු."** [89]

මෙම කුර්ආන් වාක්‍යය ඉතා පැහැදිලියි නේ ද? කල්පනා කරන්න, සත්‍යය පැහැදිලි ව ඔබට ලැබී ඇත. එය පිළිගැනීමත් ප්‍රතික්ෂේප කිරීමත් ඔබ සතු කාර්යභාරයක්!

**කි. බැ. :** ඉස්ලාමයයි, ක්‍රිස්තියානි ආගමයි දෙක ම එකවර පිළිගත නොහැකි ද?

**මුස්. :** ආගම සම්බන්ධයෙන් බලකිරීමක් හෝ බලහත්කාරයක් නැත. ඔබ කැමති දෙයක් කළ හැකි ය. එහෙත්, ඔබ මෙම ආගම් දෙක ම එක්කරන්න - එකට පිළිගන්න - සිතන්නේ නම්, එයින් පෙනීයන්නේ ඔබ තවමත් අල්ලාහ්ට සම්පූර්ණයෙන් අවනත නොවූ බවයි: ඒ කියන්නේ, ඔබ තවමත් දෙවියන් ප්‍රතික්ෂේප කරන්නෙක් - අවිශ්වාසවන්තයෙක් බවයි.

අල්කුර්ආනයේ මෙම වාක්‍යයට සවන් දෙන්න:

> **"නියත වශයෙන් ම අල්ලාහ් සහ ඔහුගේ වක්තෘවරුන්ටත් අතර වෙනස්කම් කිරීමේ අභිලාෂයෙන්, අපි එම වක්තෘවරුන්ගෙන් සමහරක් අය කෙරෙහි විශ්වාස තබන අතර සෙසු අය ප්‍රතික්ෂේප කරමු" යි පවසති; (කුෆ්ර්ට සහ ඊමානයට අතර) මැද මාවතක් ඇති කර ගැනීමට බලාපොරොත්තු වෙති. මොවුන් සියල්ලෝ ම සැබෑ කාපිර්වරුන් වෙති. කාපිර්වරුන්ට ඉතා නින්දසහගත වේදනාවන් ලැස්තිකොට ඇත්තෙමු. යමෙක් අල්ලාහ් සහ ඔහුගේ වක්තෘවරුන් කෙරෙහි විශ්වාස තබා ඔවුන් අතර වෙනස්කම් නොකරන්නේ ද ඔවුන්ට හිමි ආනිසංස අල්ලාහ් ඔවුන්ට පිරිනමනු ඇත. අල්ලාහ් ක්ෂමාශීලී ය; අතිකාරුණික ය."**

89. අල් කුර්ආන් 17:15

90. අල් කුර්ආන් 4 : 150-152

**මුස්. :** ඔබ යමක් තේරෙන වයසට පැමිණිවිට, ඔබගේ සිහි බුද්ධියත් යහපත් නම්, සත්‍යය පිළිගැනීමේ වගකීම ඔබ වෙත පැවරෙන්නේ ය. ඊට පිටුපා යෑමට ඔබට කිසිසේත් නොහැකි ය. ඔබ 'ෂහාදහ්' යන සාක්ෂිය ප්‍රකාශ කළා හෝ නොකළා හෝ තත්ත්වය එයයි. අල්ලාහ් මෙලොව අනවශ්‍ය ව මවා නැත. තව ද, සත්‍යය හා අසත්‍යය තෝරා බේරා ගැනීම පිණිස අවශ- බුද්ධිය හා අනෙකුත් අවයවයන් අල්ලාහ් විසින් ඔබට පිරිනමා ඇත. එපමණක් නොව, ඔහු විසින් යහමග පෙන්වන වක්තෘවරුන් බොහෝ දෙනෙක් එවා ඇත. එම උතුම් වක්තෘවරුන් සෑම කෙනෙකුට ම හොඳ නරක පෙන්වා දී, හොඳ මාර්ගයේ යන ආකාරයත් තම ජීවිතාදර්ශය තුළින් පෙන්වා ඇත.

අප සියලු දෙනා ම මවා ඇත්තේ අල්ලාහ්ට අවනත වී ජීවත් වීමට ය: ඔහුට පමණක් නැමදීම ඉටුකිරීමටය. එබැවින්, යහපත් දේ කිරීමෙ හි අප අතර තරඟකාරීත්වයක් තිබිය යුතු ය.

අල්ලාහ් පවසා ඇති කරුණු දෙස සිත යොමුකොට බලන්න:

> **"…. අපගේ අධිපතිතුමනි, ඔබ අනවශ්‍ය ලෙස මේ කිසිවක් මවා නැත; ඔබ අති ශ්‍රේෂ්ඨවන්තෝ ය. …"** [91]
>
> **"තව ද, ජින් (වර්ගයා) හා මිනිස් (වර්ගයා) මාහට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනත වී, මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා මාහට පමණක් නැමදීම් ඉටු) කිරීමට හැර මා මැවූයේ නැත."** [92]
>
> අල්ලාහ්ගේ තෘප්තිය ලබාගන්නා අදහසින් කරන සෑම ක්‍රියාවක් ම ඔහුට කරන නැමදීම් වෙයි.
>
> **"(මිනිසුන්ගෙන්) යහපත් ක්‍රියාවන් ඇත්තෝ කවරහු දැ'යි ඔවුන් පරීක්ෂාකිරීම පිණිස, නියත වශයෙන් ම පොළොවෙ හි ඇති දේ ඊට අලංකාරවත් ලෙස අපි කළෙමු."** [93]

---

91. අල් කුර්ආන් 3:191
92. " " 51:56
93. " " 18:7

# 4

# යේසුස් වහන්සේ දෙවිකෙනෙක්?

**මුස්.** : යේසුස් වහන්සේ දෙවි කෙනෙක් ද?

**කි. බැ.** : ඔව්. ශු. යොහන් එසේ ලියා ඇත්තේ ය:

**"පටන්ගැන්මෙහි දී වාක්‍යයාණෝ සිටිසේක, වාක්‍යයාණෝ දෙවියන් වහන්සේ හා සමග සිටිසේක, වාක්‍යයාණෝ දෙවියන් වහන්සේ ව සිටිසේක."** [94]

**මුස්.** : දේව ග්‍රන්ථයක් එකිනෙකට පටහැනි අදහස් රැගත් එකක් නො විය යුතු බව අපි සාකච්ඡා කළෙමු; තීරණයකට ද පැමිණියෙමු. සමහරවිට එකිනෙකට පටහැනි වාක්‍ය දෙකක් ඇත්තේ නම් ඒ දෙකින් එකක් සත්‍ය විය හැකි ය: (දෙක ම සත්‍ය විය නොහැකි ය.) නැතහොත්, වාක්‍ය දෙක ම වැරදි, අසත්‍ය විය හැකිය.

ශු. යොහන් වාක්‍ය 1:1 පරිදි යේසුස් වහන්සේ දෙවි කෙනෙක් නම් දෙවියන් කීදෙනෙක් සිටින බව කියන්නේ ද? අඩු තරම් දෙවියන් දෙදෙනෙක්වත් සිටිය යුතුයි. මෙම අදහස බයිබලයේ බොහෝ වාක්‍යයන්ට පටහැනි ය: විරුද්ධ ය.

කරුණාකර මෙම වාක්‍ය ඔබත් කියවා බලන්න:

**"ස්වාමීන් වහන්සේ ම ඉහළ ස්වර්ගයෙහිත් පහත පොළොවෙහිත් දෙවියන් වහන්සේ බව ද වෙන දෙවිකෙනෙක් නැති බව ද අද දවසේ දැනගෙන ඒ බව නුඹේ සිතේ තබා ගනිත්ත."** [95]

**"එම්බා ඉශ්‍රායෙල්, අසාපන්න අපේ දෙවි වූ ස්වාමීන් වහන්සේ එක ම ස්වාමීන් වහන්සේ ය."** [96]

---

94. බයිබලයේ, ශු. යොහන් 1:1
95. " ද්විතීය කථාව 4:39
96. " " " 6:4

"මම ඒ තැනන්වහන්සේ බව නුඹලා දැනගෙන මා විශ්වාසකර තේරුම් ගන්න පිණිස, නුඹලා මාගේ සාක්ෂිකාරයෝ ව, මා විසින් තෝරාගත් මාගේ මෙහෙකරුවා ව සිටින්නහු ය යි ස්වාමීන් වහන්සේ කියන සේක. මා සිටින්ට පළමුවෙන් කිසි දෙවිකෙනෙක් සාදනු ලැබුවේ නැත. මට පසුව සිටින්නෙත් නැත. මම, මමම, ස්වාමීන් වහන්සේ ය; මා ඇර වෙන ගැළවුම්කාරයෙක් නැත."[97]

"..... ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක. මම පළමුවෙනියා ය, අන්තිමයාත් මම ය; මා ඇර වෙන දෙවිකෙනෙක් නැත." [98]

".... ස්වර්ගයන් මැවූවා වූ, පොළොව මවා සාද එය පිහිටෙවූවා වූ, එය හිස්කමට නොමවා වාසය පිණිස එය සෑදුවා වූ දෙවියන් වහන්සේ වන ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක: මම ස්වාමීන් වහන්සේ ය, වෙන කෙනෙක් නැත." [99]

මෙම යෙසායා 45:18 වෙන වාක්‍යය ඉතා වැදගත් කරුණක් අප වෙත ඉදිරිපත් කරයි. එනම්, දෙවියන් පමණය මැවුම්කාරයා වන්නේ; ඒ හැර වෙන කිසිවෙකු එම ස්ථානයෙ හි නැත. යේසුස් වහන්සේ ද දෙවියන්ගේ මැවීමට අදළ කාර්ය කිසිවක සහභාගිවූවෙක් නොවෙයි. මේ අනුව අපට ද එම නිගමනයට පැමිණිය හැකි ය.

මේ පිළිබඳ ව තවත් විස්තර ලබාගැනීමට පහත සඳහන් බයිබල් වාක්‍ය කියවන මෙන් ආදරයෙන් ඉල්ලා සිටිමි.

| | | | |
|---|---|---|---|
| * ද්විතීය කථාව, | 04 වෙනි පරිච්ඡේදයේ | 35 වෙනි වාක්‍යය |
| * නික්මයාම , | 08 " | 10 " |
| * 2-සාමුවෙල් , | 07 " | 22 " |
| * 1-රාජාවලිය , | 08 " | 23 " |
| * 1-ලේකම් , | 17 " | 20 " |
| * ගීතාවලිය , | 86 " | 08 " |
| * " , | 89 " | 06 " |
| * " , | 113 " | 05 " |
| * හොෂෙයා , | 13 " | 04 " |
| * සෙකරියා , | 14 " | 09 " |

97. බයිබලයේ, යෙසායා 43:10, 11
98. " " 44:6
99. බයිබලයේ, යෙසායා 45:18

කි. බැ. : ඔබ උපුටා පෙන්වන මේ සියලු වාක්‍යයන් ම බයිබලයේ පරණ ගිවිසුමෙන් ය. අලුත් ගිවිසුමෙ හි මේ පිළිබඳ වූ වාක්‍ය තිබේ ද?

මුස්. :ඇයි නැත්තේ? මෙන්න එවැනි වාක්‍ය කීපයක්! කරුණාකර කියවා බලන්න.

**"යේසුස් වහන්සේ උත්තර දෙමින්: ප්‍රධාන එකනම් - අහෝ ඉශ්‍රායෙල්! අසා පන්න: අපේ දෙවියන් වහන්සේ ස්වාමීන් වහන්සේ ය. උන්වහන්සේ එක ම (දෙවියන් වහන්සේ) ය."** [100]

මෙසේ පවසා ඇත්තේ වෙන කෙනෙකු නොව, යේසුස් වහන්සේ ම ය:

**"... දේවතාවෙක් ලෝකයෙ හි කිසිත් නැති බවත්, එක ම දෙවිකෙනෙක් මිස අන් දෙවිකෙනෙක් නැති බවත් දනිමු ච."** [101]

**"... ඇත්තේ එක ම දෙවිකෙනෙක් සහ දෙවියන් වහන්සේටත් මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදහත්කාර කෙනෙකුත් ය. උන්වහන්සේ සියල්ලන් උදෙසා මිදීමේ මිලයක් කොට තමන් ම දුන්නා වූ, මනුෂ්‍යයා වූ ක්‍රිස්තුස් වහන්සේ ය ....."** [102]

මෙම වාක්‍යයෙ හි 'මනුෂ්‍යයා වූ ක්‍රිස්තුන් වහන්සේ' යැයි සඳහන්කොට ඇත. මෙය ඔබ කල්පනා කළ යුතු ඉතා වැදගත් කියමනකි. දැන් ඔබ වෙත මහත් වගකීමක් පැවරී ඇත. එනම්, 'ශු. යොහන් හි ඇති පළවෙනි පරිච්ඡේදයේ පළවෙනි වාක්‍යය නිවැරදියි; වැරදි ව ඇත්තේ මෙහි සඳහන් වන අනෙක් වාක්‍යයන් යැ යි' ඔබ කිව යුතුයි. නැතහොත් 'ශු. යොහන් වාක්‍ය 1:1 වැරදි යි; අනෙක් වාක්‍ය සියල්ල ම නිවැරදියි:' යැයි කිව යුතුයි. ඔබගේ නිගමනය කුමක් ද?

කි. බැ. : ඇත්ත වශයෙන් මෙය නම්, මහත් ප්‍රහේලිකාවක්! මේ සම්බන්ධ ව හරි වැරදි බැලීම ඉතාමත් දුෂ්කර කාර්යයක්:

---

100. බයිබලයේ, ශු. මාර්ක් 12:29
101. බයිබලයේ, 1 - කොරින්ති 8:4
102. බයිබලයේ, 1- තිමෝති 2:5, 6

**මුස්. :** දුක්වන්න එපා. මෙය අපි කුර්ආනයේ අදහස් තුළින් බලමු. එවිට කුර්ආනයේ අදහස්වලට, බයිබලයේ අලුත් ගිවිසුමේ යේසුස් වහන්සේ පැවසූ බව සඳහන් වන අදහස් එකඟ ව ඇති බව පෙනීයයි. කුර්ආනයෙ හි කීප වතාවක් ම සඳහන් වන්නේ, යේසුස් වහන්සේ අල්ලාහ්ගෙන් වූ වචනයක් බව ය.

එම කුර්ආන් වාක්‍ය මෙසේ ය:

> **"ඔහු (සෙකරියා) ස්වකීය කුටියේ සලාත් ඉටුකරමින් සිටිය දී මලාඉකාවරු ශබ්ද නගා, "නියත වශයෙන් ම අල්ලාහ් යහ්යා' නැමැත්තා සම්බන්ධයෙන් ශුභාරංචි පවසන්නේ ය. ඔහු අල්ලාහ්ගේ එක් වදනක් (මරියාගේ පුත්‍ර වූ යේසුස්) සත්‍යයේක්ෂණ කරන්නා ද ගෞරවණීය (පුද්ගලයෙක්) ද චරිතවත් (පුද්ගලයෙක්) ද යහපත් පුද්ගලයන් අතරේ නබි (වක්තෘ) වරයෙක් ද වන්නේය" යි පැවසූ හ."** [103]

එම පරිච්ඡේදයේ ම ඇති තවත් වාක්‍යයක් මෙසේ ය:

> **"මලාඉකාවරු කීහ: මරියම් (තුමියණි!) නියත වශයෙන් ම අල්ලාහ් තමාගේ එක් වදනකින් ඔබහට (දරුවෙකු පිළිසිඳ ගන්නට) සුභාසිංසන කළේ ය. එහි නම මසීහ්: මරියම්ගේ පුතනුවන් වන ඊසා වේ. ඔහු මෙලොව දී මෙන් ම පරලොව දී ත් ගෞරවාන්විත පුද්ගල යා ද (දෙවියන් වහන්සේට) ඉතා සමීප පුද්ගලයන් අතුරින් කෙනෙක් ද වන්නේ ය."** [104]

මෙම කුර්ආන් වාක්‍ය දෙකෙහි ම සඳහන් වන්නේ යේසුස් වහන්සේ අල්ලාහ් වෙතින් වූ වචනයක් බව ය. එනම්, අල්ලාහ් වෙතින් පැමිණෙන වචනයක් බව හෝ අල්ලාහ් සතු වචනයක් බව හෝ වෙයි. මෙය බයිබලයේ, 1-කොරින්ති හි 3 වෙනි පරිච්ඡේදයේ 23 වෙනි වාක්‍යය වන, **"නුඹලා ක්‍රිස්තුස් වහන්සේගේ ය: ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ය"** යන්නට සම ව ඇත. තවද, ශු. යොහන් 1:1 හි ද සඳහන් වියයුත්තේ, **"වාක්‍යයාණෝ දෙවියන් වහන්සේගේ ය"** යනුවෙන් ය.

---

103. අල් කුර්ආන් 3:39

104. අල් කුර්ආන් 3:45

බයිබලය **අරමයික්** (Aramaic) භාෂාවෙන් ග්‍රීක් භාෂාවට පරිවර්තනය කරන කල, ඕනෑකමින් හෝ නොදැනුවත්කමින් හෝ මෙම වරද සිදුවෙන්නට ඇත. ග්‍රීක් භාෂාවෙන් **තියෝස්** (Theos) යනු කියන්නේ දෙවියන්ට ය. එහෙත්, **තියෝ** (Theo) යනුවෙන් අදහස්වන්නේ දෙවියන්ගේ කියා ය![105] එක අකුරක ඇති නැතිවීම තුළින්, එනම් එස් (S) අකුරක් කෙතරම් විශාල වෙනස් වූ අදහසක් ඇතිකළේ ද යන්න පැහැදිලි ව වටහාගත හැකි ය.

**කි. බැ. :** යේසුස් වහන්සේ 'දෙවියන්ගේ වචනයක්' යනු කුර්ආනය සහ බයිබලය අමතන්නේ ඇයිදැ යි කිව හැකි ද?

**මුස්. :** යේසුස් වහන්සේගේ උපත සිදුවූයේ මරියාගේ ගර්භාශය තුළ තැන්පත් වූ ධාතුවලින් නොව, 'වනු' යනු වූ අල්ලාහ්ගේ අණ කිරීමකින් ය. මේ පිළිබඳ ව කුර්ආනය මෙසේ සඳහන් කරයි:

> **"(එ සමයේ මරියම්) කීවා ය: "මාගේ දෙවියෙනි! කිසිදු පිරිමියෙක් මා ස්පර්ශ කර නැති හෙයින් කෙසේ නම් මම දරුවෙකු පිළිසිඳ ගන්නෙම් ද?" ඊට ඔහු කීවේ ය: "එසේ ය, අල්ලාහ් තමා අභිමත දේ මවන්නේ ය. ඔහු යමක් තීරණය කළේ නම් එම කාර්යය 'වනු' යනුවෙන් අණ කළ සැනෙන් එය එසේ සිදුවන්නේ ය."** [106]

**කි. බැ. :** යේසුස් වහන්සේ ශුද්ධ වූ ආත්මයෙන් පරිපූර්ණ වූ කෙනෙකු හෙයින්, එතුමා දෙවිකෙනෙක් වූ හ:

**මුස්. :** යේසුස් වහන්සේ දෙවිකෙනෙක් බව ඔබ විශ්වාස කිරීමට මෙය හේතුවෙයි නම්, එතුමා මෙන් ම ශුද්ධ වූ ආත්මයෙන් පරිපූර්ණ වූ තවත්

---

105. බලන්න: ග්‍රීක් ශබ්ද කෝෂය, ග්‍රීක් බයිබලය හෝ උරාමියාහ් හි පාදිළිකෙනෙක් ව සිටි, පසු ව ඉස්ලාමය වැළඳගත් මහාචාර්ය අබ්දුල් අහද් දවුද් ලියූ 'Muhammad in the Bible' පොතේ 16 වෙනි පිටුව.

106. අල් කුර්ආන් 3:47

අය සිටිති. ඔවුහු ද දෙවියන් බව විශ්වාස නොකරන්නේ ඇයි? මෙම බයිබල් වාක්‍ය කියවා බලන්න:

**"මක්නිසා ද ඔහු (බාර්ණබස්) යහපත් වූ ශුද්ධාත්මයෙන් ද ඇදහිල්ලෙන් ද පූර්ණ වූ මනුෂ්‍යයෙක් ය. මහත් සමූහයක් ද ස්වාමීන් වහන්සේට එක්කරන ලද්දෝ ය."** [107]

අප මේ කාරණාවලට සාක්ෂි කාරයෝ ය: එසේ ම දෙවියන් වහන්සේ විසින් තමන්ට කීකරුවෙන්නන්ට දුන් ශුද්ධාත්මයාණන් වහන්සෙත් සාක්ෂිකාරයෙකැ යි කීවෝ ය." [108]

පහත සඳහන් බයිබල් වාක්‍ය ද කියවීමෙන් වැඩි විස්තර ලබාගැනීමට හැකිවන්නේ ය.

| | | | |
|---|---|---|---|
| * ක්‍රියා | 6 වෙනි පරිච්ඡේදයේ | 5 වෙනි වාක්‍යය | |
| * 2-පේතෘස් | 1 | " | 21 | " |
| * 2-තිමෝති | 1 | " | 14 | " |
| * 1-කොරින්ති | 2 | " | 16 | " |
| * ශු. ලූක් | 1 | " | 41 | " |

**කි. බැ. :** යේසුස් වහන්සේ එතුමාගේ මව්කුසෙ හි සිටියදී ම ශුද්ධ වූ ආත්මයෙන් පරිපූර්ණ කරනු ලැබුවෙක් වූ හ:

**මුස්. :** බව්තීස්ම කරන්නා වූ යොහන් ද ඔහුගේ මව්කුසෙ හි සිටියදී ම ශුද්ධ වූ ආත්මයෙන් පරිපූර්ණ කළ බව බයිබලය පවසනවා ඔබ බැලුවේ නැද්ද?

**"නුමුත් දේවදූතයා ඔහුට කථාකොට: සෙකරියස්, භය නොවන්න. මක්නිසා ද නුඹේ කන්නලව්ව අසන ලද්දේ ය. නුඹේ භාර්යාව වූ එලිසබෙත් නුඹ නිසා පුත්‍රයෙකු වදන්නී ය. ඔහුට යොහන් යන නම තබාපන්න. නුඹට ප්‍රීතියත් සන්තෝෂයත් වන්නේ ය: බොහෝ දෙනෙක් ඔහුගේ ඉපදීමට ප්‍රීතිවන්නෝ ය. මක්නිසා ද ඔහු ස්වාමීන් වහන්සේ ඉදිරියෙ හි උත්තමයෙක් වන්නේ ය. ඔහු මුද්‍රිකපානයවත් මද්‍යපානයවත් නොබොන්නේ ය: මවු කුස පටන් ම ඔහු ශුද්ධාත්මයෙන් පූර්ණ ව සිටින්නේ ය."** [109]

---

107. බයිබලයේ, ක්‍රියා 11:24
108. බයිබලයේ, ක්‍රියා 5:32
109. බයිබලයේ, ශු. ලූක් 1 : 13-15

**කි. බැ. :** යේසුස් වහන්සේ ප්‍රාතිහාර්යයන් පැවැත්වූ හ. එතුමා රොටී පහකින් හා මාළුවන් දෙදෙනෙකුගෙන් මිනිසුන් පන්දහස් දෙනෙකුගේ කුසගිනි නිවූ හ:

**මුස්. :** මෙවැනි ප්‍රාතිහාර්යයන් එලිෂා සහ එලියා විසින් ද පවත්වනු ලැබ ඇත. එලිෂා, බාර්ලි රොටී විස්සක් හා ගොයම් කරල් ටිකක් ගෙන මිනිසුන් සියදෙනෙකුගේ කුසගිනි නිවාඇති බව බයිබලයෙ හි සඳහන් වෙයි. එය ඔබ නො කියවීම ගැන මම කණගාටු වෙමි.

> **"…. රොටී විස්සක් ද අලුත් ගොයම් කරල් ද තමාගේ මල්ලේ දමා දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයා වෙතට ගෙනාවේ ය. ඔහු ද සෙනගට කන්ට දීපන්නැයි කීවේ ය. ඔහුගේ මෙහෙකරුවා කීමෙක් ද? මේවා මනුෂ්‍යයන් සියයක් ඉදිරියෙ හි තබන්ට දැ යි කීවේ ය. එහෙත් ඔහු ඒවා සෙනගට කන්ට දීපන්න; මක්නිසා ද ඔවුන් කා ඉතුරු කරනවා ඇත කියා ස්වාමීන් වහන්සේ වදාරනසේකැ යි කීවේ ය. එවිට ඔහු ඒවා ඔවුන් ඉදිරියෙහි තැබීය. ඔවුන් එයින් කා ස්වාමීන් වහන්සේගේ වචනය ලෙස ඉතුරු කළෝ ය."** [110]

තව ද, එලිෂා - දුප්පත් කනවැන්දුම් ස්ත්‍රියකගේ ජීවිතය තෙල් වර්ගයක් නොඅඩුව ලබාගැනීමට උදව්වීමෙන් ආරක්ෂා කළ බව බයිබලය පවසයි:

> **" … එක්තරා ස්ත්‍රියක් එලිෂාට මොරගසා: ඔබගේ මෙහෙකරු වූ මාගේ පුරුෂයා මෙළේ ය. ඔබගේ මෙහෙකරුවා ස්වාමීන් වහන්සේ කෙරෙහි භය ඇතුව සිටි බව ඔබ දන්නෙහි ය. ණය හිමියා මාගේ දරුවන් දෙදෙනා තමාට දසයන්කොට ගන්ට ඇවිත් සිටීයයි කීවා ය. එලිෂා කතා කොට: මම තුඹට කුමක් කරම්ද? ගෙයි තුඹට තිබෙන්නේ මොනවාදැ යි මට කියාපන්නැයි ඇට කීවේ ය. තෙල් කුළාවක් මිස ගෙයි වෙන කිසිවක් ඔබගේ දසියට නැතැයි ඇ කීවා ය. එවිට ඔහු: තුඹ පිටත ගොස් තුඹේ සියලු අසල්වාසීන්ගෙන් භාජන එනම් හිස් භාජන බොහොමයක් ඉල්ලා ගනින්න. තුඹත් තුඹේ පුත්‍රයණුත් ඇතුල් වී දොර පියාගෙන, ඒ සියලු භාජනවල තෙල් වත්කොට, පිරුණු ඒවා පැත්තක තබාපන්නැයි කීවේ ය. ඇ ඔහු ළඟින් ගොස්, ඇත් ඇගේ පුත්‍රයොත් ඇතුල් වී දොර පියාගත්තෝ ය; ඔව්හු ඇ ළඟට භාජන ගෙනාවෝ ය. ඇ තෙල් වත්කළා ය. භාජන පිරුණු කළ ඇ, තවත් භාජනයක් මට ගෙනෙන්නැයි ඇගේ පුත්‍රයාට කීවා ය. තවත් භාජනයක් නැතැයි ඔහු ඇට කීවේ ය. තෙල් නැවතුණේ ය. එවිට ඇ ඇවිත් දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයාට දැන්නුවා ය. ඔහු දඃ තුඹ ගොස් තෙල් විකුණා ණය ගෙවා ඉතිරි මුදලෙන් තුඹත් තුඹේ පුත්‍රයොත් රක්ෂාවෙයල්ලාය යි කීවේ ය."** [111]

---

110. බයිබලයේ, 2 - රාජාවලිය 4 : 42-44

111. බයිබලයේ, 2 - රාජාවලිය 4 : 1-7

"ස්වාමීන් වහන්සේ එලියා ලවා කියෙවූ උත්වහන්සේගේ වචනය ප්‍රකාරයට පිටි මුට්ටිය හිම නොවීය, තෙල් කුළාව ද අඩු නොවී ය." [112]

"කපුටුවෝ (එලියා වෙත) උදයේ රොටි සහ මස් ද සවස රොටි සහ මස් ද ගෙනාවෝ ය: ඔහු ඔයෙන් වතුර බීවේ ය."[113]

**කි. බැ. :** යේසුස් වහන්සේට ලාදුරු රෝගය සුවකිරීමට හැකි වූයේ ය:

**මුස්. :** එලිෂා ද ලාදුරු රෝගියෙක් වූ නාමන් වෙත යොර්දන් ගඟෙහි ස්නානය කරන්න කියා සුවපත් කළ බව බයිබලය පවසයි.

"එවිට ඔහු (නාමන්) බැසගොස් දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයා (එලිෂා) ගේ කීම ලෙස යොර්දනෙ හි සත්වරක් ගිලුණේ ය. ඔහුගේ මාංසය ද කුඩා ළමයෙකුගේ මාංසය මෙන් හරි ගැහී ඔහු පවිත්‍ර වුණේ ය." [114]

**කි. බැ. :** යේසුස් වහන්සේ අන්ධයෙකුට පෙනීම ගෙන දුන් හ:

**මුස්. :** මෙය එලිෂා ද කරඇති බව බයිබලය පවසයි.

"එවිට එලිෂා යාච්ඤා කොට: ස්වාමීන් වහන්ස, දකින පිණිස මොහුගේ ඇස් පැහැදුව මැනවයි කීවේ ය. ස්වාමීන් වහන්සේ තරුණයාගේ ඇස් පැහැදූ සේක." [115]

"තව ද, ඔවුන් සමාරියට පැමුණුන විට එලිෂා: ස්වාමීන් වහන්ස, පෙනෙන පිණිස මොවුන්ගේ ඇස් පැහැදුව මැනවයි කීවේ ය. ස්වාමීන් වහන්සේ ඔවුන්ගේ ඇස් පැහැදූ සේක: ඔව්හු බැලූ විට තමුන් සමාරිය මැද සිටින බව දුටුවෝ ය." [116]

මෙපමණක් නොව, එලිෂා විසින් සමහරෙකුගේ ඇස් නොපෙනී යෑමත් සිදුවී ඇත. මෙයත් බයිබලයෙහි ම ඇත:

"ඔවුන් එලිෂාළඟට බැස්ස කල ඔහු: මේ සෙනග අන්ධ කළ මැනවයි ස්වාමීන් වහන්සේට යාච්ඤා කෙළේ ය. උන්වහන්සේ එලිෂාගේ වචනය ලෙස ඔවුන් අන්ධ කළසේක." [117]

---

112. බයිබලයේ, 1 - රාජාවලිය 17:16
113. බයිබලයේ, 1 - රාජාවලිය 17:6
114. බයිබලයේ, 2 - රාජාවලිය 5:14
115. බයිබලයේ, 2 - රාජාවලිය 6:17
116. බයිබලයේ, 2 - රාජාවලිය 6:20
117. ,, 2 - රාජාවලිය 6:18

කි. බැ. : යේසුස් වහන්සේට මරණයට පත්වූවන් නැවත නැගිටවීමට හැකි වූයේය:

මුස්. : බයිබලයේ පහත සඳහන් වාක්‍යය බලන්න. එලිෂා ද මරණයට පත් වූ ළමයෙකුට ප්‍රාණය ලබාදුන් බව පැහැදිලි ව ම සඳහන් වෙයි.

**"තුන්වරක් ළමයා පිට දිගාවී ස්වාමීන් වහන්සේට යාච්ඤාකොට: මාගේ දෙවි වූ ස්වාමීන් වහන්ස, මේ ළමයාගේ ප්‍රාණය නැවත ඔහු තුළට පැමිණේවයි කීවේය. ස්වාමීන් වහන්සේ එලියාගේ හඬට ඇහුම්කන් දුන්සේක; ළමයාගේ ප්‍රාණය නැවත ඔහු තුළට පැමිණ ඔහු ජීවත් වුණේ ය."** [118]

මෙම බයිබල් වාක්‍යය ද කියවන්න:

**"තව ද ඔහු නැගී ගොස් ළමයා පිට වැතිර තමාගේ කට ඔහුගේ කට පිට ද, තමාගේ ඇස් ඔහුගේ ඇස් පිට ද, තමාගේ අත් ඔහුගේ අත් පිට ද තබා ළමයා පිට දිගා වුණේ ය; ළමයාගේ මාංසය ද උණුසුම් වුණේ ය."** [119]

තවත් ආශ්චර්යවත් සිද්ධියක් ගැන බයිබලය සඳහන් කරයි. එනම්, මරණයට පත් වූ එලිෂාගේ ඇටකටු හි තැවරුණ තවත් කෙනෙකුගේ මළමිනියට පණ ඇවිත් නැගිට සිටි බව ය.

**"මිනිස්සු මිනියක් වළලන්ට යනවිට සමූහයක් දැක එලිෂාගේ සොහොන්ගෙයි ඒ මිනිය දැමුවෝ ය. ඒ මිනිය එලිෂාගේ ඇටවලට තැවරුණු හැටියේ ම පණ ලැබ නැගිට සිටියේ ය."** [120]

කි. බැ. : යේසුස් වහන්සේ ජලය මත ගමන් කළ හ:

මුස්. : මෝසෙස් (මූසා - අලෛ) ද තමාගේ අත මුහුදට උඩින් දිගු කළ බවත් එහි ගමන් කළ බවත් බයිබලය ම පවසයි.

**"මෝසෙස් තමාගේ අත මුහුදට උඩින් දිගු කෙළේ ය. ස්වාමීන් වහන්සේ ද ඒ මුළු රාත්‍රියෙ හි බලවත් වූ නැගෙනහිර සුළඟක් කරණකොට ගෙන මුහුද ආපසු යන්ට සලස්වා මුහුද ගොඩබිමක් කළසේක. ජලය බෙදී ගියේ ය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ වියලි භූමිය පිට මුහුද මැදට ගියෝ ය. ජලය ඔවුන්ගේ දකුණු පැත්තෙන් ද වම් පැත්තෙන් ද ඔවුන්ට තාප්පයක් මෙන් විය."** [121]

118. බයිබලයේ, 1 - රාජාවලිය 17:22
119. බයිබලයේ, 2 - රාජාවලිය 4:34
120. බයිබලයේ, 2 - රාජාවලිය 13:21
121. නික්මයාම 14:21, 22

**කි. බැ. :** යේසුස් වහන්සේට යක්ෂයන් එළවා දැමීමට හැකි විය.

**මුස්. :** (යේසුස් වහන්සේ නොවන) අන් අයට ද යක්ෂයන් එළවා දැමීමේ හැකියාව ඇති බව යේසුස් වහන්සේ ම පිළිගෙන ඇත. බයිබලයේ පිටු පෙරළා බලන්න.

> **"තව ද මම බෙල්සෙබුබ් කරණකොටගෙන යක්ෂයන් දුරුකරම් නම්, නුඹලාගේ පුත්‍රයෝ කවරෙකු කරණකොටගෙන උන් දුරුකරද්ද? එබැවින් ඔව්හු නුඹලාගේ විනිශ්චයකාරයෝ වන්නෝ ය."** [122]

> **"නුමුත් මම බෙල්සෙබුබ් කරණකොට ගෙන යක්ෂයන් දුරුකරම් නම්, නුඹලාගේ පුත්‍රයෝ කවරෙකු කරණකොටගෙන ඔවුන් දුරු කරද්ද? එහෙයින් ඔව්හු නුඹලාගේ විනිශ්චයකාරයෝ වන්නෝ ය."** [123]

මොවුන් පමණක් නොව, යේසුස් වහන්සේගේ කුහක ගෝලයින්ට පවා යක්ෂයන් එළවා දැමීම කළ හැකි බව යේසුස් වහන්සේ පවසා ඇත:

> **"ඒ දවසේ දී බොහෝ දෙනෙක්: ස්වාමීනි ! ස්වාමීනි ! ඔබගේ නාමයෙන් අනාගත වචන නොකීයෙමු ද? ඔබගේ නාමයෙන් යක්ෂයන් දුරු නොකෙළෙමු ද? ඔබගේ නාමයෙන් නොයෙක් බලවත් ක්‍රියා නොකෙළෙමු දැ යි මට කියනවා ඇත."** [124]

තව ද, යේසුස් වහන්සේගේ ම අනාවැකි අනුව අසත්‍ය වක්තෘවරුන් ද බොහෝ ආශ්චර්යයවත් කාර්යයන් කළ හැකි බව වෙයි.

> **"මක්නිසා ද බොරු ක්‍රිස්තුවරු ද බොරු අනාගත වක්තෘවරු ද නැඟිට පුළුවන් නම් තෝරාගනු ලැබූවන් පවා මුළාකරන ලෙස මහත් ලකුණු ද පුදුම දක්වන්නෝ ය."** [125]

**කි. බැ. :** මෙහි එක් කරුණක් මතක් කළ යුතුයි. එලිෂා සහ එලියා සෑම ආශ්චර්යයමත් කාර්යයක් ම ඉටුකර ඇත්තේ, දෙවියන් වහන්සේ වෙත ප්‍රාර්ථනාකොට (දෙවියන්ගේ ආශිර්වාද) ලත් පසුව ය:

---

122. බයිබලයේ, ශු. මතෙව් 12:27
123. ශු. ලූක් 11:19
124. බයිබලයේ, ශු. මතෙව් 7:22
125. ශු. මතෙව් 24:24

මුස්. : යේසුස් වහන්සේ ආශ්චර්යයමත් කාර්යයන් ඉටුකළේත් දෙවියන් වහන්සේගේ ආශිර්වාද ඇතිව ය. උන්වහන්සේ ම මේ බව පවසා ඇත; බයිබලය සාක්ෂි දරයි:

"මට තනියම කිසිවක් කරන්ට නුපුළුවන:" [126]

"නුමුත් මම දෙවියන් වහන්සේගේ ඇඟිල්ලෙන් යක්ෂයන් දුරුකරම් නම්, සැබවින් දෙවියන් වහන්සේගේ රාජ්‍යය නුඹලා කෙරෙහි පැමිණ තිබේ." [127]

යේසුස් වහන්සේ විසින් පවත්වන ලද ප්‍රාතිහාර්ය සියල්ල ම එතුමාට පෙර පැමිණි වක්තෘවරුන් විසින් ද, එතුමාගේ ගෝලයන් විසින් පමණක් නොව මිථ්‍යා දෘෂ්ටිකයින් විසින් ද පවත්වනු ලැබ ඇත. එනමුත්, මිථ්‍යා දෘෂ්ටිය ඇති තැනක කිසිදු ප්‍රාතිහාර්යයක් පැවැත්වීමට යේසුස් වහන්සේට නුපුළුවන් විය. බයිබලය එසේ පවසයි:

"එහිදී රෝගීන් ස්වල්ප දෙනෙකු පිට අත් තබා සුව කළා මිස වෙන කිසි බලවත් ක්‍රියාවක් කරන්ට උන්වහන්සේට නොහැකි වූයේ ය. ඔවුන්ගේ විශ්වාසය නැතිකම ගැන උන්වහන්සේ මවිත වූ සේක. උන්වහන්සේ උගන්වමින් අවට ගම්වල ඇවිද්ද සේක." [128]

කි. බැ. : යේසුස් වහන්සේ මරණයට පත් වී තෙදිනකට පසු නැවත නැගිට සිටිය හ:

මුස්. : යේසුස් වහන්සේ කුරුසියේ තබා ඇණ ගැසීම සම්බන්ධ ව අපි දෙදෙනා පසුව සාකච්ඡා කරමු. ඒ ගැන මතභේද රාශියක් ඇත. නමුත්, දැන් එකක් පමණක් කියන්නෙමි. මෙම ඇණ ගැසීමේ කථාව ඇත්තේ ප්‍රේරිත වූ පාවුල් විසින් තිමෝතියස්ට ලියන ලද දෙවෙනි පත්‍රයෙ හි පමණය. ඔහු (පාවුල්) යේසුස් වහන්සේ ජීවත් ව සිටිය දී, උන්වහන්සේ ව කිසිවිටක දැක නැත. ඔහු මෙසේ පවසා ඇත.

"මාගේ ශුභාරංචියේ ප්‍රකාරයට දාවිත්ගේ වංශයෙන් උපන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටින බව සිහිකරපන්න." [129]

---

126. බයිබලයේ, ශු. යොහන් 5:30
127. " ශු. ලූක් 11:20
128. බයිබලයේ, ශු. මාර්ක් 6 : 5, 6
129. බයිබලයේ, 2 - තිමෝති 2:8

යේසුස් වහන්සේ නැවත නැගිට සිටීම සම්බන්ධ ව බයිබලයේ, ශු මාර්ක් 16:9-20 හි සඳහන් වී තිබුණ සටහන් බයිබල් රාශියකින් ඉවත්කොට ඇත. තවත් බයිබල්වල එය කුඩා අකුරුවලින් හෝ වරහන් ඇතුළත විවරණයක් ඇති ව හෝ යම්තමින් සඳහන් වී ඇත.

කරුණාකර පහත සඳහන් බයිබල් බලන්න:

* Revised Standard Version
* New American Standard Bible
* New World Translation of the Holy Scriptures.
  මෙම බයිබලය භාවිතා කරන්නේ **ජෙහෝවාස් විට්නසස්** ක්‍රිස්තියානි කොටසට අයත් අයය.

දැන්, මම ඔබගෙන් වැදගත් ප්‍රශ්නයක් අසනු කැමැත්තෙමි. 'මම දෙවියෙක් මි' යනු යම්විටෙක යේසුස් වහන්සේ වාද කළේ ද? නැතහොත්, 'මෙහි වැඩම සිටින මමයි ඔබගේ දෙවියන් වන්නේ; මට ම නැමදුම් සියල්ල ඉටු කරන්න!' යැයි පැවසුවේ ද?

**කි. බැ.** : නැත. එහෙත්, උන්වහන්සේ දෙවියෙක් ද මනුෂ්‍යයෙක් ද වෙයි !

**මුස්.** : මගේ ප්‍රශ්නය මෙයයි. එතුමා කිසිවිටෙක එලෙස වාද කළේ ද?

**කි. බැ.** : නැත.

**මුස්.** : මිනිසුන් අනවශ්‍ය ලෙස තමාට වැඳුම් පිදුම් කරන බවත්, දෙවියන් වහන්සේ විසින් අනාවරණය නො කළ, මිනිසුන් විසින් ඇති කළ ප්‍රතිපත්ති විශ්වාස කරන බවත් උන්වහන්සේ අනාවැකි පවසා ඇත. බයිබලය ඒ ගැන මෙසේ සඳහන් කරයි:

> **"මනුෂ්‍යයන්ගේ ශික්ෂාවන් ගුරුකම්කොට උගන්වමින්, ඔවුන් මට නමස්කාර කරන්නේ නිරර්ථකයේ යයි අනාගත වචන මනාකොට කීයේයයි කීසේක."** [130]

නවීන ක්‍රිස්තියානියෙ හි ඇති ත්‍රිත්වය, යේසුස් වහන්සේ දේව කුමාරයෙක් බව ඇදහීම, යේසුස් වහන්සේ දෙවිකෙනෙක් බව ඇදහීම, මූල පාපය, අපගේ පව් පිණිස ප්‍රායශ්චිත්ත කිරීමක් වශයෙන් යේසුස් වහන්සේ

---

130. බයිබලයේ, ශු. මතෙව් 15:9

කුරුසියේ ඇණ ගසා ලේ වැගිරීම වැනි ප්‍රතිපත්ති සියල්ල ම මිනිසා විසින් ඇතිකරගත් ඒවා වෙයි. අලුත් ගිවිසුමෙහි ඇති යේසුස් වහන්සේ ගේ ම වචන, උන්වහන්සේ කිසිවිටෙක තමා දෙවියන් බව හෝ දෙවියන්ට සමාන බව හෝ වාද නො කළ බව පැහැදිලි ව ම පෙන්වා දෙයි.

මෙම බයිබල් වාක්‍යයන් කියවා බලන්න:

> **" ..... මාගේ ම කැමැත්තෙන් මා කිසිවක් නොකර ...."** [131]
>
> **" ..... පියාණන් වහන්සේ මට වඩා උතුම් ය."** [132]
>
> **" ...... අපේ දෙවියන් වහන්සේ ස්වාමීන් වහන්සේ ය. උන්වහන්සේ එක ම (දෙවියන් වහන්සේ) ය."** [133]
>
> **" .... මාගේ දෙවියෙනි! මාගේ දෙවියෙනි! ඔබ මා අත්හැරියේ මක්නිසා ද?"** [134]
>
> **" ... පියාණෙනි! ඔබගේ අතට මාගේ ආත්මය භාරදෙමි....."** [135]
>
> **" .... නුමුත් ඒ දවසවත් ඒ පැයවත් පියාණන් වහන්සේ මිස අන්කිසිවෙක් දන්නේ නැත. ස්වර්ගයෙ හි සිටින දූතයෝවත් පුත්‍රයාවත් නො දනිති."** [136]

යේසුස් වහන්සේ පළමු ව හඳුන්වනු ලැබුවේ වක්තෘවරයෙක්, දෙවියන් වහන්සේගෙන් පැමිණි දේශකයෙක්, දෙවියන් වහන්සේගේ සේවකයෙක්, ආශිර්වාද ලත් ගැළවුම්කරුවෙක් ලෙස ය. නමුත් පසු ව, දේව පුත්‍රයෙකුගේ තත්ත්වයට ද ඉනික්බිති ව දෙවිකෙනෙක් ව ම ද උන්වහන්සේ උසස් කරනු ලැබූ හ.

අප සැවොම බුද්ධියෙන් යුතු ව කල්පනා කළ යුතු කරුණක් ඇත. එනම්, ලොව ඇති සියලු දේ ම කවදා හෝ නැති වී යයි: එවැනි, නැති වී යන කෙනෙකු (මරියා) ගේ කුසෙ හි (නිත්‍ය වූ) දෙවිකෙනෙක් ඉපදෙන්නේ කෙසේ ද?

යේසුස් වහන්සේ නිදාගත් හ: එහෙත්, දෙවියන් වහන්සේ කිසිවිටෙක නිදා ගත්තේ නැත: නිදාගන්නේත් නැත.

> **"බලව, ඉශ්‍රායෙල් ආරක්ෂා කරන තැනන්වහන්සේට නිදිබර වීමක්වත් නිදාගැනීමක්වත් නැත්තේ ය."** [137]

| | | | | | |
|---|---|---|---|---|---|
| 131. | බයිබලයේ, ශු. යොහන් | 8:28 | 135. | බයිබලයේ, ශු. ලූක් | 23:46 |
| 132. | " " | 14:28 | 136. | " ශු. මාර්ක් | 13:32 |
| 133. | " ශු. මාර්ක් | 12:29 | 137. | බයිබලයේ, ගීතාවලිය | 121:4 |
| 134. | " ශු. මාර්ක් | 15:34 | | | |

දෙවියන් වහන්සේ බලගතු කෙනෙක් විය යුතු ය: ඔහුට සමාන, ඔහුතරම් බලසම්පන්න තවත් කෙනෙක් නොවිය යුතු ය. එසේනම්, ක්‍රිස්තියානින් පවසන අන්දමින් ඔහු වෙත කෙළ ගසන්නේ කෙසේ ද? එතුමා කුරුසියේ තබා ඇණ ගසන්නේ කෙසේ ද? අනෙක් මිනිසුන් මෙන් යේසුස් වහන්සේ ද දෙවියන් වහන්සේට වැඳුම් පිදුම් කළේ නම්, එතුමා දෙවිකෙනෙක් වන්නේ කෙසේ ද?

**"තුමුත් උන්වහන්සේ වනාන්තර ස්ථානවලට අහක් ව ගොස් යාච්ඤා කළසේක."** [138]

යේසුස් වහන්සේ නොයෙක් අන්දමින් යක්ෂයා විසින් පරීක්ෂාකරනු ලැබූ හ: බයිබලයේ, ශු . ලූක් 4 වෙනි පරිච්ඡේදයේ වාක්‍ය 1 සිට 13 දක්වා මේ ගැන විස්තර ඇත. කියවන්න. නමුත්, බයිබලයේ, යාකොබ් පළවෙනි පරිච්ඡේදයේ 13 වෙනි වාක්‍යයෙ හි සඳහන් වන්නේ, '**... මක්නිසා ද, දෙවියන් වහන්සේ නපුරෙන් පරීක්ෂාකරනු ලබන්ට නුපුළුවන** " යනුවෙන් ය. එසේ නම්, යේසුස් වහන්සේ දෙවිකෙනෙක් වන්නේ කෙසේ ද? කල්පනා කර බලන්න. මේ පිළිබඳ ව අපි බුද්ධියෙන් යුතු ව කරුණු සොයන්නේ නම්, තව තවත් කරුණු රාශියක් ලැබෙනවාට කිසිදු සැකයක් නැත

**කි. බැ. :** මට නම් මේ පිළිබඳ ව කිසිවක් තේරෙන්නේ නැහැ. එහෙත්, විශ්වාසයක් වශයෙන් අපට මෙය පිළිගන්නට වී ඇත.

**මුස්. :** ඔබගේ මෙම ක්‍රියාවලිය බයිබලයේ උපදෙස්වලට පටහැනි නොවෙයි ද? බයිබලය පවසන්නේ යමක් පිළිගන්නාවිට සියුම් ලෙස පරීක්ෂාකොට පිළිගත යුතු බව නේ ද? බයිබලයෙ හි, පාවුල් මෙසේ පවසා ඇත:

**"සියල්ල සෝදිසිකර බලා, යහපත් දේ තදින් අල්ලාගනිල්ලා."** [139]

**කි. බැ. :** ඇත්තෙන් ම මෙය නම් අවුල් ජාලාවක්!

**මුස්. :** මෙම බයිබල් වාක්‍යය බලන්න.:

**"මක්නිසාද, දෙවියන් වහන්සේ වියවුල්කමේ නොව සමාදනයේ දෙවියන් වහන්සේ ය: ශුද්ධවන්තයන්ගේ සියලු සභාවන් හි එසේ මය."** [140]

කිසිදු සැකයක් නැති සත්‍යයක් නම්, සෑම අවුලක් ම ඇත්තේ මිනිසුන් ඇති කළ ප්‍රතිපත්තිවල ය: ඒවායින් ප්‍රශ්න ඇති වී වැඩිවෙනවා මිස වෙනෙකක් නොකෙරෙයි.

---

138. බයිබලයේ, ශු. ලූක් 5:16
139. " 1 - තෙසලෝනික 5:21
140. බයිබලයේ, 1 - කොරින්ති 14:33

5

# යේසුස් වහන්සේ දේව පුත්‍රයෙක්?

**මුස්. :** යේසුස් වහන්සේ දෙවියන්ගේ පුත්‍රයෙක් ද?

**කි. බැ. :** ඔව්. ශු. මතෙව් මේ පිළිබඳ ව කියයි:

> **යොහන් විසින් යේසුස් වහන්සේ බව්තීස්ම කළවිට, "තව ද මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයා ය, මොහු කෙරෙහි ඉතා ප්‍රසන්න ව සිටිමියි අහසෙන් හඬක් විය."** [141]

**මුස්. :** මෙහි ඇති 'පුත්‍රයා' යන වචනයේ පදර්ථය තුළින් ඔබ තේරුම් ගන්න එපා. මක්නිසා ද, බොහෝ වක්තෘවරුන් පමණක් නොව සාමාන්‍ය මිනිසුන් පවා දෙවියන්ගේ පුත්‍රයන් ලෙස ද දරුවන් ලෙස ද බයිබලයෙ හි අමතා ඇත. බයිබලයේ, නික්මයාම 4:22 කියවන්න:

**කි. බැ. :** **නුඹ (මෝසෙස්) ඵාරාවෙන්ට කථාකොට: ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක - ඉශ්‍රායෙල් මගේ පුත්‍රයා ය; මාගේ කුලුඳුලා ය"**

**මුස්. :** යාකොබ් (ඉශ්‍රායෙල්) දෙවියන්ගේ කුලුඳුල් පුත්‍රයා බව මෙම වාක්‍යයෙන් කියවෙයි. දැන් බයිබලයේ - 2 සාමුවෙල් හි 7:13 හා 14 හෝ 1-ලේකම් හි 22:10 කියවන්න.

**කි. බැ. :** **"ඔහු (සාලමොන්) ම මාගේ නාමයට ගෘහයක් ගොඩනගන්නේ ය. ඔහුගේ රජකමේ සිංහාසනය ද සදාකාලෙට ම ස්ථිර කරන්නෙමි. මම ඔහුට පියා වන්නෙමි, ඔහු මට පුත්‍රයා වන්නේ ය. ...."** [142]

---

141. බයිබලයේ, ශු. මතෙව් 3:17
142. බයිබලයේ, 2 - සාමුවෙල් 7 : 13, 14

**මුස්. :** ඔබ බයිබලයේ, යෙරෙමියා හි 31:9 කියවුවහොත් මහත් කලබලකාරී තත්ත්වයකට පත්වන බවට සැකයක් නැත. එහි ඇත්තේ, "**... මම ඉශ්‍රායෙල්ට පියකෙනෙක් වී සිටිමි. එප්‍රායිම් ද මාගේ කුලුදුලා ය:**" යනුවෙන් ය. මේ දැන්, විනාඩියකට පෙර, බයිබලයේ, නික්මයාම 4:22 හි, '**දෙවියන්ගේ කුලුදුල් පුතා ඉශ්‍රායෙල්** බව කියවීමු. එසේනම්, නියම කුලුදුල් පුත්‍රයා කවු ද යන ප්‍රශ්නය මතුවෙයි. ඔහු ඉශ්‍රායෙල් ද? නැතහොත් එප්‍රායිම් ද? ප්‍රශ්නය මෙයින් නිම නොවෙයි. සාමාන්‍ය මිනිසුන් පවා දෙවියන්ගේ දරුවන් විය හැකි ය. කියවන්න: බයිබලයේ, ද්විතීය කථාව 14:1 වෙනි වාක්‍යය.

**කි. බැ. :** "**නුඹලා නුඹලාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේගේ දරුවෝ ය;**"

**මුස්. :** මෙපමණක් නොව, සාමාන්‍ය මිනිස්සුන් පවා කුලුදුල් පුත්‍රයන් ලෙස ඇමතිය හැකි ය. කරුණාකර බයිබලයේ, රෝම 8:29 වෙනි වාක්‍යය කියවන්න:

**කි. බැ. :** "**මක්නිසා ද උන්වහන්සේ පූර්වයෙන් ඇඳින ගත්තවුන් තමන් වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුලුදුලා වන පිණිස ඒ පුත්‍රයාගේ ස්වරූපයට සමානවෙන්ට පූර්වයෙන් නියම කළසේක.**"

**මුස්. :** මෙහි සඳහන් වන පරිදි සියල්ලෝ ම කුලුදුල් පුත්‍රයන් වේ නම් යේසුස් වහන්සේ කවරෙකු ද?

**කි. බැ. :** උන්වහන්සේ දෙවියන් වහන්සේගෙන් ජනිත වූ එක ම පුත්‍රයා ය:

**මුස්. :** යේසුස් වහන්සේ ඉපදෙන්න බොහෝ කලකට පෙර දවිත් ඇමතූ දෙවියන් වහන්සේ මෙසේ කීසේක.

"**මම නියමය ප්‍රකාශ කරන්නෙමි. ස්වාමීන් වහන්සේ මට කථාකොට: නුඹ මාගේ පුත්‍රයෙහි ය; අද නුඹ ජනිත කෙළෙමි.**" [143]

143. බයිබලයේ, ගීතාවලිය 2:7

මෙම වාක්‍යය අනු දවිත් ද දෙවියන් වහන්සේ විසින් ජනිත කරන ලද පුත්‍රයෙකි. 'දෙවියන්ගේ පුත්‍රයා' යන වදන් දෙක පදර්ථයෙන් බැලීම යුතු නොවේ. එම වදන් උපමානුසාරයෙන් බැලිය යුතුයි. කවරෙක් දෙවියන් වහන්සේගේ ආදරයට හා අනුග්‍රහයට ලක්වන්නේ ද, හෙතෙම දෙවියන් වහන්සේගේ පුත්‍රයා යැයි බයිබලයේ අමතා ඇත. තව ද, යේසුස් වහන්සේ ම දෙවියන් වහන්සේ මගේ පියාණන් පමණක් නොව, ඔබගේ ද පියාණන් වෙයි' යැයි පවසා ඇත. කරුණාකර බයිබලයේ, ශු. මතෙව් හි 5:45 හා 48 කියවන්න:

**කි. බැ. :** **"නුඹලා ස්වර්ගයෙ හි සිටින නුඹලාගේ පියාණන් වහන්සේගේ පුත්‍රයෝ වන්නේ ය."**

**" .... නුඹලාගේ ස්වර්ගීය පියාණන් වහන්සේ සම්පූර්ණ ව සිටින්නාක් මෙන් නුඹලාගේ සම්පූර්ණ ව සිටපල්ලා."**

**මුස්. :** මෙලෙස, ආදරය, කරුණාව, දෙවියන් වහන්සේ වෙත ළංවීම යනාදිය දැක්වීමේ නිමිත්තෙන්, දෙවියන්ගේ පුත්‍රයා' යන වදන් බයිබලයෙ හි බොහෝ පිටුවල සඳහන් වෙයි; එය යේසුස් වහන්සේට පමණක් සීමා වූ බව නොසිතන්න. තව ද, බයිබලයෙ හි දෙවියන් වහන්සේගේ පුත්‍රයන් ගැන පමණක් නොව දියණියන් ගැන ද සඳහන් වෙයි. කියවන්න:

**"නුඹලාට (මම) පියෙක් වන්නෙමි. නුඹලා ද මට පුත්‍රයොත් දූවරුත් වන්නාහුයයි සර්ව පරාක්‍රම වූ ස්වාමීන් වහන්සේ කියන සේක."** [144]

මෙම වාක්‍යය හා බයිබලයේ ඇති වෙනත් වාක්‍ය රාශියක් ගැන අපි සිතා බලනවිට, යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා යන පදර්ථයෙන් හෝ වෙනත් අති විශිෂ්ට අර්ථයකින් හෝ සැලකීමට කිසිදු හේතුවක් නොමැත.

**කි. බැ. :** යේසුස් වහන්සේට පියෙක් නැත. එම නිසා, උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා ලෙස සලකන්නෙමු!

---

144. බයිබලයේ, 2 - කොරින්ති 6:18

**මුස්.** : එසේනම්, ආදම් (අලෛ) තුමා දෙවියන්ගේ පුත්‍රයා බව ඔබ නො කියන්නේ ඇයි? එතුමාට පියා පමණක් නොව මව ද නැත. බයිබලයෙ හි එතුමා ද දෙවියන් වහන්සේගේ පුත්‍රයා ලෙස අමතා ඇති බව ඔබ දන්නවා ද? කරුණාකර බයිබලයේ, ශු. ලූක් 3:38 කියවා බලන්න:

*එම වාක්‍යය මෙසේ ය:*

> **"ඔහු එනොස්ගේ පුත්‍රයා ය; ඔහු සෙත්ගේ පුත්‍රයා ය; ඔහු ආදම්ගේ පුත්‍රයා ය; ඔහු (ආදම්) දෙවියන් වහන්සේගේ පුත්‍රයා ය."**

තව ද, බයිබලයේ, හෙබ්‍රෙව් 7:3 කියවන්න:

**කි. බැ.** : **"තව ද පියෙක්වත් මවෙක්වත් පෙළපතක්වත් දවස්වල පටන්ගැන්මක්වත් ජීවිතයේ කෙළවරක්වත් නැත්තා වූ මේ තෙමේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාට සමාන කරනු ලැබ නිතරම පූජකයෙක් ව පවතින්නේ ය."**

**මුස්.** : මෙසේ සඳහන් කරනු ලබන මොහු කවු ද? මෙම ප්‍රශ්නයට බයිබලය ම පිළිතුරු දෙයි:

> **"..... සාලමේ රජ වූ, මහෝත්තම දෙවියන් වහන්සේගේ පූජකයෙක් වූ මේ මෙල්කිසදෙක් ආබ්‍රහම් සම්මුඛ ව ...."** [145]

මෙතුමා යේසුස් වහන්සේටත් ආදම් තුමාටත් වඩා අසහාය කෙනෙකි. එසේ වූ මෙතුමා දෙවියන් වහන්සේගේ පුත්‍රයා ලෙස හෝ දෙවියන් වහන්සේ ලෙස හෝ සලකන්නේ නැත්තේ ඇයි?

**කි. බැ.** : එසේනම්, යේසුස් වහන්සේ ගැන ඔබ කියන්නේ කුමක් ද?

**මුස්.** : මුස්ලිම්වරුන් වන අපි එතුමා අමතන්නේ මරියාගේ පුත්‍රයා වන යේසුස් (මර්යම්-අලෛ-තුමියගේ පුත්‍රයා වන ඊසා-අලෛ) වහන්සේ ලෙස ය:

**කි. බැ.** : මෙය කවුරුත් ප්‍රතික්ෂේප කරන්නේ නැහැ!

---

145. බයිබලයේ, හෙබ්‍රෙව් 7:1

**මුස්.** : ඔව්, සාමාන්‍ය අදහසක් වූ මෙය කාටත් ප්‍රතික්ෂේප කිරීමට බැහැ. යේසුස් වහන්සේ, තමා මිනිසෙකුගේ පුත්‍රයෙක් බව පවසා ඇත: දෙවියන් වහන්සේගේ පුත්‍රයා' යැයි ඇමතීම ප්‍රතික්ෂේප කොට ඇත. බයිබලයේ, ශු. ලූක් 4:41 කියවනවා ද?

**කි. බැ.** : "යක්ෂයෝ ද: ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය කියා මහත් ශබ්ද පවත්වමින්, බොහෝ දෙනෙකුගෙන් දුරුවූණෝ ය. උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේයයි ඔවුන් දැනගෙන සිටිනිසා උන්වහන්සේ ඔවුන්ට සැර කරමින් කතාකරන්ට ඉඩ නුදුන්සේක."

**මුස්.** : මෙම වාක්‍යයෙන් පැහැදිලි වන්නේ යේසුස් වහන්සේ දෙවියන්ගේ පුත්‍රයා' යැයි ඇමතීම එතුමා ම ප්‍රතික්ෂේප කළ බව ය. බයිබලයේ, ශු. ලූක් හි 9:20 හා 21 වෙනි වාක්‍ය දෙස බලන්න. එම වාක්‍යයන් හි එතුමා දෙවියන්ගේ පුත්‍රයා' යැයි ඇමතීම ප්‍රතික්ෂේප කර ඇති අතර, එසේ අමතන්න එපා යැයි අණකොට ද ඇත:

> "නුඹුත් නුඹලා කවුරුය කියනවාදැ යි උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූසේක. පේත්‍රුස් උත්තරදෙමින්: දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුස්යයි කීවේ ය. උන්වහන්සේ ද මෙය කාටවත් නොකියන ලෙස ඔවුන්ට තදින් අණකොට:" [146]

**කි. බැ.** : මෙය දැන් මට පැහැදිලි ව වැටහෙයි:

**මුස්.** : අපේක්ෂා කළ ගැළවුම්කාරයෙක් වූ ද වක්තෘවරයෙක් වූ ද දේශකයෙක් වූ ද යේසුස් වහන්සේ, පසු ව දෙවියන් වහන්සේගේ පුත්‍රයෙක් ලෙස ද, දේවත්වය ඇති කෙනෙක් ලෙස ද හඳුන්වනු ලැබ, අවසානයේ දී දෙවියන් ව ම කරනු ලැබූහ.

මෙය කරනු ලැබූ පිළිවෙළ බයිබලය විසින් ම කියා ඇත. කරුණාකර පහත සඳහන් වාක්‍ය කියවන්න; වැටහේවි:

> "හෙතෙම රාත්‍රියේ උන් (යේසුස්) වහන්සේ ළඟට ඇවිත්: රබ්බි, ඔබ දෙවියන් වහන්සේ කෙරෙන් ආවාවූ ගුරුවරයෙකැ යි අපි දනිමුව. ..." [147]

---

146. බයිබලයේ, ශු ලූක් 9 : 20, 21

147. බයිබලයේ, ශු. යොහන් 3 : 2

**"එබැවින් ඒ මනුෂ්‍යයෝ උන්(යේසුස්) වහන්සේ විසින් කළා වූ මේ හාස්කම දැක: සැබැවට ම මුන්වහන්සේ ලෝකයට එන්නාවූ අනාගත වක්තෘමයයි කීවෝ ය."** [148]

පහත සඳහන් වාක්‍යයන්හි ද යේසුස් වහන්සේ වක්තෘවරයෙක් බවට පැහැදිලි ව ම පවසා ඇත:

**"එබැවින් සමූහයාගෙන් සමහරෙක් මේ වචන අසා: සැබෑවට ම මුන්වහන්සේ අනාගත වක්තෘමයයි කීවෝ ය."** [149]

**"සමූහයෝ ද: මුන්වහන්සේ ගලීලයේ නාසරෙත් නුවර අනාගත වක්තෘ වූ යේසුස් වහන්සේයයි කීවෝ ය."** [150]

**"එකල සියල්ලෝ ම භයපත් ව: උතුම් වූ අනාගත වක්තෘ කෙනෙක් අප අතරෙහි නැඟුටුණු සේක...."** [151]

**" .... උන්(යේසුස්) වහන්සේ දෙවියන් වහන්සේ ද මුළු සෙනග ද ඉදිරියෙ හි ක්‍රියාවෙහිත් කථාවෙහිත් බලවත් වූ අනාගත වක්තෘ කෙනෙක් ව සිටිසේක."** [152]

මෙතෙක් අප බැලූ වාක්‍යවලින්, යේසුස් වහන්සේ වක්තෘවරයෙක් බව මනාව වටහා ගතිමු. එහෙත්, පහත සඳහන් වාක්‍යය ඊට ඉඳුරා ම වෙනස් අදහසක් දක්වන්නේ ය. එනම්, යේසුස් වහන්සේ 'දෙවියන් වහන්සේගේ පුත්‍රයා' යැයි හඳුන්වනු ලබන්නේය:

**"ඔහු අප්‍රමාදව ම: යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා ය කියා සිනගෝගවල දී උන්වහන්සේ ව ප්‍රකාශ කළේ ය."** [153]

මෙම වාක්‍යයෙන් වටහාගත හැකි තවත් කරුණක් නම් මුල් අවධියේ විසූ ක්‍රිස්තියානීන් තමන්ගේ ආගමික කටයුතුවලට යුදෙව්වන්ගේ සිනගෝග (සම්මුති ශාලා) වල් පාවිච්චි කළ බව ය. නමුත්, පසුකලෙක, යේසුස් වහන්සේගේ සත්‍ය ඉගැන්වීම්වලින් ක්‍රිස්තියානි ආගම ඉවත් වී ගියවිට ඔවුන් වෙනුවෙන් පල්ලි (Churches) ඇතිකර ගත් හ.

---

148. බයිබලයේ, ශු. යොහන් 6 : 14
149. බයිබලයේ, ශු. යොහන් 7 : 40
150. " ශු. මතෙව් 21 : 11
151. බයිබලයේ, ශු. ලූක් 7 : 16
152. " 24 : 19
153. " ක්‍රියා 9 : 20

පසු ව, පාවුල්, බාර්ණබස් හා යුදෙව්වන් නොවන බොහෝ දෙනෙක් පවිත්‍ර වූ (ක්‍රිස්තියානි) ආගම අවමන් කළ බවත් කෙලෙසූ බවත් චෝදනාකොට යුදෙව් සිනගෝග (සම්මුති ශාලා) වලින් පිටුවහල් කරනු ලැබූ හ. ඔවුහු පිටුවහල් කිරීම ගැන ද කළ වරද ගැන ද බයිබලය මෙසේ සඳහන් කරයි:

> "නුමුත් යුදෙව්වරු භක්තිවන්ත කුල ස්ත්‍රීන් ද නුවර ප්‍රධානීන් ද පොළඹවා, පාවුල් සහ බාර්ණබස්ට විරුද්ධ ව පීඩාවක් උපදවා තමන්ගේ සීමාවලින් ඔවුන් පිටතට ලූවෝ ය." [154]

> එපිකූරිය සහ ස්තෝයික පණ්ඩිතයන්ගෙන් සමහරෙක් ද ඔහුට මුණ ගැසුණෝ ය. සමහරෙක් ද: මේ (පාවුල්) වාචාලයා මක්කියන්ට හදනවා දැ යි කීවෝ ය. තව සමහරෙක්: ඔහු (පාවුල්) අන්දේවතාවන් ප්‍රකාශ කරන්නෙකු මෙන් පෙනේයයි කීවෝ ය. මෙසේ කීවේ ඔහු යේසුස් වහන්සේ හා මළවුන්ගෙන් නැගිටීම ප්‍රකාශ කළ බැවින් ය." [155]

> සෙනගට ද ව්‍යවස්ථාවට ද මේ ස්ථානයට ද විරුද්ධ ව සියලු තැන්වල සියල්ලන්ට උගන්වන්නා වූ මනුෂ්‍යයා මොහු (පාවුල්) ය. එපමනකුත් නොව ග්‍රීක් වරුන් ද දේවමාළිගාවට කැඳවාගෙනවිත්, ඔහු (පාවුල්) මේ ශුද්ධස්ථානය අපවිත්‍ර කෙළේ යයි මොරගසා කීවෝ ය."[156]

පහත සඳහන් බයිබල් වාක්‍යයෙ හි යේසුස් වහන්සේගේ තත්ත්වය 'දෙවියන් වහන්සේගේ පුත්‍රයා යන තත්ත්වයෙන් උසස් කොට පෙන්වනු ලැබ ඇත.

> "මක්නිසා ද ස්වාමී වූ ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් නුඹලාට දාවිත්ගේ නුවර අද උපන්සේක."[157]

අවසාන වශයෙන්, යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ස්ථානයට උසස් කරනු ලැබූහ; එනම් දෙවිකෙනෙක් කරනු ලැබූ හ. මේ ගැන මෙම වාක්‍යය පැහැදිලි ව කියයි:

> "පටන්ගැන්මෙහි දී වාක්‍යයාණෝ සිටිසේක, වාක්‍යයාණෝ දෙවියන් වහන්සේ හා සමඟ සිටිසේක, වාක්‍යයාණෝ දෙවියන් වහන්සේ ව සිටිසේක." [158]

---

154. බයිබලයේ, ක්‍රියා 13 : 50 1
155. " ක්‍රියා 17 : 18
156. " ක්‍රියා 21 : 28
157. බයිබලයේ, ලූක් 2 : 11
158. " ශු. යොහන් 1 : 1

# 6

# යේසුස් වහන්සේ කුරුසියේ ඇණගසනු ලැබුවේ ද?

**මුස්.** : යේසුස් වහන්සේ කුරුසියේ තබා ඇණ නොගැසූ බව අල් කුර්ආනය පවසයි :

> **"තව ද, නියත වශයෙන් ම අල්ලාහ්ගේ රසූල් (වක්තෘ) වරයාණන් වූ ද මරියම්ගේ පුතණුවන් වූ ද ඊසා (යේසුස් වහන්සේ) අපි ඝාතනය කළෙමු'යි ඔවුන් (යුදෙව්වන්) පවසන හෙයින්, (ඔවුහු ශාපයට ලක් වූහ.) ඔවුහු එතුමා ඝාතනය කළේ ද නැත; කුරුසියේ (ඇණ) ගැසුවේ ද නැත...."[159]**

එතුමා කුරුසියේ මරණයට පත් වූ බව ඔබ තවත් විශ්වාස කරන්නේ ද ?

**ක්‍රි. බැ.** : ඔව්, එතුමා කුරුසියේ මරණයට පත් වී නැවත නැගිට සිටියහ.

**මුස්.** : එතුමා නැවත නැගිට සිටි අවස්ථාවෙ හි කිසිවෙක් නොදුටු බව අපි සැමදෙන පිළිගෙන ඇත්තෙමු. යේසුස් වහන්සේ භූමිදාන කළ සොහොන හිස් ව තිබෙන බව දුටු ඔවුන් එතුමා නැවත නැගිටගත් බව තීරණය කළ හ. මක්නිසාද යත්, යේසුස් වහන්සේගේ ගෝලයන් හා අනෙකුත් සාක්ෂිකරුවන්, එතුමා කුරුසියේ ඇණ ගැසූ බව කීමෙන් පසු ව ද ජීවත් ව සිටිනු දැක ඇත. එබැවින්, කුර්ආනය පවසන පරිදි, යේසුස් වහන්සේ කුරුසියේ නොමැරී සිටින්නක් හැකි නොවෙයි ද ?

**ක්‍රි. බැ.** : එසේ නම්, ඊට සාක්ෂි ඇත්තේ ද ?

---

159. අල් කුර්ආන් 4 : 157

**මුස්.** : එන්න: මීට අදාළ සාක්ෂි ගෙනදෙන වාක්‍ය බයිබලයෙ හි තිබේදැ'යි සොයා බලමු. ඔබ, යමක් ගැන යේසුස් වහන්සේ පැවසූ වදන්වලට සවන් දෙන්නේ ද ? නැතහොත්, එතුමාගේ ගෝලයන් හා ප්‍රේරිතයන් සවන් දුන් බව කියන කටකථාවලට සවන් දෙන්නේ ද ?

**කි. බැ.** : යේසුස් වහන්සේගේ වදන් අනෙකකට වඩා උතුම් ය: උසස් ය. ඊට ප්‍රමුඛස්ථානය දෙන්නෙමි.

**මුස්.** : බොහොම හොඳයි. මෙය (යේසුස් වහන්සේගේ වදන් උසස්කොට සැලකීම) වනාහි එතුමාගේ වදනකට එකඟ අදහසකි. එම වදන මෙසේ වෙයි.

**"ගෝලයෙක් තමාගේ ගුරුවරයාටවත් දසයෙක් තමාගේ ස්වාමියාටවත් උතුම් නැත."[160]**

**කි. බැ.** : යේසුස් වහන්සේ ම, තමා මරණයට පත්වුවහොත් නැගිට සිටින බව පැවසූහ.

**"(යේසුස් වහන්සේ) ඔවුන්ට කියන සේක් : මෙසේ ක්‍රිස්තුස් වහන්සේ වධවිඳින්ටත්, තුන්වෙනි දා මළවුන්ගෙන් නැගිටින්ටත්......ලියා තිබේ."[161]**

**මුස්.** : බොහෝ අවස්ථාවන් හි දුක වේදනාව ගැන බයිබලය කථාකරන කල, එහි ඇති ස්වාභාවික තත්ත්වයට වඩා වැඩිකොට කියයි. සමහර විට එම තත්ත්වය මරණයට සමාන ව ම කියයි. ඊට කදිම නිදසුනකි පාවුල් පැවසූ බව සඳහන් වන මෙම බයිබල් වාක්‍යය :

**"සහෝදරයෙනි! ● මම දවස්පතා නසිමියි අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ නුඹලා ගැන මට ඇත්තාවූ පාරට්ටුව පිට කියමි."[162]**
(ඇත්තෙන් ම මෙහි කියවෙන්නේ 'මම දිනපතා දුක් විඳිමි' යන්න ය.)

---

160. බයිබලයේ, ශු. මතෙව් 10 : 24
161. " ශු. ලූක් 24 : 46
162. " 1 - කොරින්ති 15 : 31

තවත් නිදසුන් සමහරක් බලන්න :

1) යේසුස් වහන්සේ කුරුසියේ දී දෙවියන්ගෙන් උදව් ඉල්ලා කන්නලව් කළ හ.

"......මාගේ දෙවියෙනි! මාගේ දෙවියෙනි! ඔබ මා අත්හැරියේ මක්නිසාද......[163]

"පියාණෙනි ඔබ කැමති සේක් නම්, මේ කුසලාන මාගෙන් පහකළ මැනව. එසේ වී නුමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවායි කීසේක."[164]

(මෙහි කුසලාන යැයි සඳහන් කර ඇත්තේ මරණයටයි.)

2) ශු ලූක්, හෙබ්‍රෙව්, යාකොබ් යනාදියෙ හි ඇති වාක්‍ය අනුව, යේසුස් වහන්සේ කුරුසියේ මරණයට පත් නොවී සිටීම පිණිස එතුමා කළ ප්‍රාර්ථනාව දෙවියන් වහන්සේ විසින් පිළිගෙන ඇත. එසේනම් එතුමා කුරුසියේ මැරුම්කන්නේ කෙසේද?

("යේසුස් වහන්සේ ප්‍රාර්ථනා කළ) එකල ස්වර්ගයෙන් දේව දූතයෙක් උන්වහන්සේට පෙනී, උන්වහන්සේ ශක්තිමත් කළේ ය."[165]

(මෙයින් අදහස්වන්නේ, දේව දූතයෙක් යේසුස් වහන්සේ වෙත පැමිණ දෙවියන් වහන්සේ එතුමා අසරණ තත්ත්වයක නො තබන බව ධෛර්යමත් කළ බව ය.)

"උන්වහන්සේ මාංසවත් ව සිටි දවස්වලදී තමන්වහන්සේ මරණයෙන් ගළවන්ට පුළුවන් වූ තැනන් වහන්සේට බලවත් හැඬීමෙන් හා කඳුළින් යුක්ත යාච්ඤා සහ කන්නලව් ඔප්පුකර තමන්ගේ දේවභය නිසා උත්තර ලැබ."[166]

(මෙහි උත්තර ලැබ' යනුවෙන් සඳහන් වන්නේ දෙවියන් වහන්සේ යේසුස් වහන්සේගේ කන්නලව්ව පිළිගෙන ඇති බව ය.)

"ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඔප්පුකරන කන්නලව්ව කරනකොටගෙන මහත්දේ ඉෂ්ටවෙයි."[167]

---

163. බයිබලයේ, ශු. මතෙව් 27 : 46
164. " ශු. ලූක් 22 : 42
165. " ශු. ලූක් 22 : 43
166. " හෙබ්‍රෙව් 5 : 7
167. බයිබලයේ, යාකොබ් 5 : 16

යේසුස් වහන්සේ ම මෙසේ පවසා ඇත :

> **"ඉල්ලාපල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ; සොයාපල්ලා, එවිට නුඹලාට සම්බ වේ; තට්ටුකරපල්ලා, එවිට නුඹලාට දෙර හරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ; සොයන්නාට සම්බ වේ ; තට්ටුකරන්නාට දෙර හරිනු ලැබේ. නුඹලා අතරෙන් කවර මනුෂ්‍යයෙක් තමාගේ පුත්‍රයා රොටියක් ඉලන්නේ නම්, ඔහුට ගලක් දේ ද ? නොහොත් ඔහු මත්ස්‍යයෙකු ඉල්ලන්නේ නම්, ඔහුට සර්පයෙකු දේ ද ?"[168]**

යේසුස් වහන්සේගේ සෑම ප්‍රාර්ථනාවක් ම - එතුමා කුරුසියේ මරණයට පත් නොවිය යුතුයි යනු ප්‍රාර්ථනාව ඇතුව - දෙවියන් වහන්සේ විසින් පිළිගනු ලැබුවේ නම්, එතුමා කුරුසියේ මරණයට පත්වන්නේ කෙසේ ද?

3) රෝම භේවා භටයින් යේසුස් වහන්සේගේ කෙණ්ඩය නොබිඳූ බව බයිබලය පවසයි :

> **"එබැවින් භේවායෝ ඇවිත්, පළමුවෙනියාගෙත් ඔහු සමග කුරුසියෙහි ඇණ ගසනලද අනික් අයගෙත් කෙණ්ඩා බින්දේ ය. නුමුත් ඔව්හු යේසුස් වහන්සේ ළඟට ආකල, උන්වහන්සේ මැරී සිටි බව දැක, උන්වහන්සේගේ කෙණ්ඩා නොබින්දේ ය."[169]**

යේසුස් වහන්සේ මරණයට පත් වූ බව කීම පිණිස, මෙම භේවා භටයින් මත විශ්වාසය තැබිය හැකි ද ? එසේ නැතිනම්, යේසුස් වහන්සේ නිර්දෝෂ බව ඔවුන්ට පෙනී ගොස්, එතුමා නොමරා බේරාගැනීමට උවමනා වුයේ ද ?

4) යේසුස් වහන්සේ කුරුසියේ මරණයට පත්වුයේ නම්, එතුමාගේ ලේ කැටි ගැසීයයි; තව ද, එතුමාගේ ශරීරයේ ඇළයට හෙල්ලයකින් ඇනීම නිසා වේගයෙන් ලේ පිටවී තිබිය නොහැකි ය. නමුත්, යොහන් විසින් ලියන ලද ශුභාරංචියෙ හි ලේ සහ වතුර පිටවු බව ලියා ඇත.

---

168. බයිබලය, ශු. මතෙව් 7 : 7-10
169. 〃 ශු. යොහන් 19 : 32, 33

**"එසේ වුවත්, භේවායින්ගෙන් එක්කෙනෙක් හෙල්ලයකින් උන්වහන්සේගේ ඇළයට ඇන්නේ ය. එකෙණෙහි ම ලේත් වතුරත් නික්මුණේ ය."[170]**

5) යේසුස් වහන්සේගේ දූත මෙහෙය සත්‍යනම්, ඊට ලකුණක් පෙන්වන ලෙස එරිසිවරුන් කී හ. එවිට එතුමා මෙසේ පිළිතුරු දුන් බව බයිබලය කියයි.

**"මක්තිසා ද යෝනා මත්ස්‍යයාගේ බඩේ දහවල් තුනක් ද රෑ තුනක් ද සිටියාක්මෙන් මනුෂ්‍ය පුත්‍රයා ද පොළෝ ගැබේ දහවල් තුනක් ද රෑ තුනක් ද සිටින්නේ ය."[171]**

එහි සඳහන් වී ඇති පරිදි යේසුස් වහන්සේ පොළෝ ගැබ තුළ දහවල් තුනක් ද රෑ තුනක් ද සිටියේ නැත. එතුමා සිටියේ එක් (සෙනසුරාද) දහවලක් සහ රෑ (සිකුරාද රෑ සහ සෙනසුරාද රෑ) දෙකක් පමණය. මෙය ද අපි නොසලකා හරිමු. මෙම ප්‍රශ්නයට පමණක් මට පිළිතුරු දෙන්න: "යෝනා මහා මත්ස්‍යයාගේ බඩේ පණ පිටින් සිටියේ ද?"

**කි. බැ. :** ඔව්!

**මුස්. :** යෝනා මහා මත්ස්‍යයාගේ බඩෙන් එළියට වමනය කළ විට පණපිටින් සිටියේ ද?

**කි. බැ. :** ඔව්!

**මුස්. :** එසේ නම් යේසුස් වහන්සේගේ අනාවැකිය අනුව, එතුමා ජීවත්ව සිටිය යුතුයි:

6) යේසුස් වහන්සේ ම, එතුමා කුරුසියේ නොමැරුණු බව පවසා ඇත. ඉරිදා උදෑසන මේරිමග්දලීන් සොහොනට ගියා ය. එවිට එය හිස් ව තිබුණි. ඇය උයන්පල්ලෙක් මෙන් පෙනුණ යමෙක් සිටගෙන

---

170. බයිබලයේ, ශු. යොහන් 19:34
171. " ශු. මතෙව් 12:40

සිටිනවා දුටු වා ය. ඔහු යේසුස් වහන්සේ බව දැන ඇඳිනගත් ඇය, ඔහු ව අල්ලා බැලීමට තැත්කළා ය. එවිට, **"යේසුස් වහන්සේ: මට අත නොගසන්න: මක්නිසා ද මම තව ම පියාණන් වහන්සේ වෙතට නොනැංගෙමි. ...."**[172] යි පැවසූ හ. 'අත නොගසන්න; මම තව ම පියාණන් වහන්සේ වෙතට නොනැංගෙමි' යැයි පැවසීමෙන් අදහස් වන්නේ, එතුමා තවමත් ජීවත් ව සිටින බව ය; මරණයට පත් නොවූ බව ය. මක්නිසාද යත්, යමෙක් මරණයට පත්වුවහොත් ඔහු තමා මැවූ දෙවියන් වහන්සේ වෙත ආපසු යන්නේ ය. මෙය ඉතාමත් බලවත් සාක්ෂියක් බවට යේසුස් වහන්සේ තුළින් ම ඔප්පු වී ඇත.

7) යේසුස් වහන්සේ කුරුසියේ තබා ඇණ ගැසූ බව කීමෙන් පසු ව, එතුමාගේ ගෝලයන් එතුමා ශාරීරික ව නැති බවත්, ආත්මයෙන් යුතුව සිටින බවත් සිතූ හ. එසේ සිතීමට හේතුව, (මරණින් පසු) නැවත නැගිටෙන ශරීරයන් ආත්මයන් බවට පරිවර්තනය වන හෙයින් ය:

**කි. බැ. :** (කථාව නවතා ...) නැවත නැගිටෙන ශරීර යන් ආත්මයන් බවට පරිවර්තනය වන බව ඔබ ස්ථිර වම කියන්නේ කෙසේ ද?

**මුස්. :** යේසුස් වහන්සේ ම, එසේ පවසා ඇති බව බයිබලය කියයි. ඔව්හු දේවදූතයන් හා සමාන බව එතුමාගේ අදහසයි:

**කි. බැ. :** බයිබලයේ කොතැනක මෙසේ සඳහන් වේ ද?

**මුස්. :** බයිබලයේ, ශු. ලූක් හි ඇති 20 වෙනි පරිච්ඡේදයේ 34, 35, 36 අංක දරන වාක්‍යයන් හි මෙය පැහැදිලි ව ම ඇත. මම කියවමි; සවන් දෙන්න.

> **"යේසුස් වහන්සේ ද: මේ ලෝකයේ දරුවෝ සරණපාවා ගනිති, සරණපාවා දෙනු ලබති. නුමුත් මේ ලෝකයටත් නැවත නැගිටීමටත් පැමිණෙන්ට සුදුස්සෝ යයි ගණන්ගනු ලබන අය සරණපාවා ගන්නේවත් සරණපාවා දෙනු ලබන්නේවත් නැත. මක්නිසාද ඔවුන්ට තවත් මැරෙන්ට නුපුළුවන. ඔව්හු දේවදූතකයන් හා සමානවෙති; නැවත නැගිටීමේ පුත්‍රයන් බැවින් ඔව්හු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය."**

172. බයිබලයේ, ශු. යොහන් 20 : 17

පසු ව, යේසුස් වහන්සේ, තම අත් පා ආදිය ඔවුන්ට අල්ලා බැලීමට ඉඩ දී, තමා යේසුස් ම බව ඔප්පු කළ හ. නමුත්, ඔවුහු එතුමා යේසුස් වහන්සේ බව විශ්වාස කිරීමට පසුබට වූ හ. එබැවින්, අනෙක් ජීවත් වන මිනිසුන් මෙන්, එතුමා ද තවමත් ආහාර අනුභව කරන බව ඔවුන්ට පෙන්වීම පිණිස මස් ගෙන දෙන මෙන් පැවසූ හ. මේ ගැන ඔබ සවිස්තර ව දැනගත යුතුයි නේ ද? කරුණාකර මෙම බයිබල් වාක්‍යය කියවන්න:

**කි. බැ. : "ඔවුන් මෙසේ කථාකරමින් සිටිය දී උන්වහන්සේ ඔවුන් මැද සිට තුඹලාට සමාදනය වේවායි ඔවුන්ට කී සේක. නුමුත් ඔව්හු ත්‍රස්ත ව, භයපත් ව, ආත්මයක් පෙනුණේයයි සිතුවෝ ය. උන්වහන්සේ ඔවුන්ට කථාකොට: තුඹලා කැළඹෙන්නේ මක්නිසා ද? තුඹලාගේ සිත්වල ශංකා හටගන්නේ මක්නිසා ද? මාගේ අත් පා බලා, ඒ මම ම බව දැනගනිල්ලා. මා අතගා බලාපල්ලා. මක්නිසාද මස් හා ඇට මට තිබෙනවා. තුඹලාට පෙනෙන ලෙස ආත්මයකට නැතැයි කී සේක. උන්වහන්සේ මෙසේ කියා, තමන් අත් පා ඔවුන්ට පෙන්වූ සේක. ඔවුන් ප්‍රීතිය නිසා විශ්වාස නොකර පුදුම ව සිටියදී, උන්වහන්සේ ඔවුන්ට කථාකොට: කන්ට යමක් මෙහි තුඹලා ළඟ තිබේදැ යි ඇසූසේක. ඔව්හු බැදපු මාලු කෑල්ලක් උන්වහන්සේට දුන්නෝ ය. උන්වහන්සේ එය රැගෙන ඔවුන් ඉදිරියේ කෑ සේක."** [173]

8) යේසුස් වහන්සේ කුරුසියේ මරණයට පත් වූ බව ඔබ තවමත් විශ්වාස කරන්නේ නම්, පහත සඳහන් බයිබල් වාක්‍ය අනුව, එතුමා අසත්‍ය වක්තෘවරයෙක් හා දෙවියන් වහන්සේ විසින් **ශාප** කරනු ලැබූ කෙනෙක් බව අදහස් වෙයි.

**"ඒ අනාගත වක්තෘ හෝ ස්වප්නකාරයා මරනු ලැබිය යුතුය."** [174]

**"මරණය ලැබීමට සුදුසු පාපයක් කර මරනු ලැබුවා වූ යමෙක් තුඹ විසින් ගසක එල්ලනු ලැබුවේ නම්, තුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේ උරුමයක් කොට තුඹට දෙන දේශය තුඹ විසින් අපවිත්‍ර කරනු නොලබන පිණිස ඔහුගේ මළකඳ රාත්‍රියෙ හි ගසේ තිබෙන්ට නැර, එය එම මුළු දවසේ දී ම තැන්පත් කරපන්න. මක්නිසා ද එල්ලනු ලබන තැනැත්තේ දෙවියන් වහන්සේගෙන් ශාප ලද්දෙක් ය."** [175]

---

173. බයිබලයේ, ශු. ලූක් 24 : 36-43
174. ද්විතීය කථාව 13 : 5
175. ද්විතීය කථාව 21:22, 23

යේසුස් වහන්සේ කුරුසියේ මරණයට පත් වූ බව විශ්වාස කිරීම, එතුමාගේ වක්තෘභාවය ම අවමන් කිරීමක් වැනි ය. යේසුස් වහන්සේ කුරුසියේ තබා ඇණගසා තමන් විසින් මරනු ලැබූ බව යුදෙව්වන් කී හ. තව ද මෙවැනි දුක්ඛිත තත්ත්වයෙ හි එතුමා මරණයට පත්වීම නිසා එතුමා වක්තෘවරයෙක් බවට පැවසූ කරුණු බොරු වී ගිය බව (එතුමා වක්තෘවරයෙක් නොවන බව ඔප්පු වී ඇති බව) එම යුදෙව්වන් කී හ.

ක්‍රිස්තියානීන්, තම පව්වලින් මිදීම පිණිස යේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසා මරුමුවට පත්කළ බව විශ්වාස කිරීම අවශ්‍ය බව සිතති. මෙම හේතුව නිසා ම, යේසුස් වහන්සේ දෙවියන් වහන්සේ විසින් ශාපකරනු ලැබූ කෙනෙක් බව පිළිගත යුතු තත්ත්වයකට ක්‍රිස්තියානීන් වැටී ඇත. ක්‍රිස්තියානීන්ගේ මෙම විශ්වාසය බයිබලයේ ඉගැන්වීම්වලට පටහැනි ය; විරුද්ධ ය !

> **"මම පූජාවට නොව කරුණාවටත් දවන පූජාවලට වඩා දෙවියන් වහන්සේ ඇඳිනගැන්මටත් කැමැත්තෙමි."** [176]

මෙපමණක් නොව, මෙම ඇදහීම යේසුස් වහන්සේගේ ම ඉගැන්වීම්වලට ද පටහැනි ය; විරුද්ධ ය:

> **"නුඹුත් - මම පූජාවට නොව දයාවට කැමැත්තෙමියි යන කීමේ අර්ථය නුඹලා ගොස් ඉගෙන ගනිල්ලා ..."** [177]

නැවතත්; යේසුස් වහන්සේ කථා කරයි:

> **"නුඹුත්: මම පූජාවට නොව කරුණාවට කැමැත්තෙමියි යන කීමේ අර්ථය නුඹලා දැනගෙන සිටියා නම් නිවැරදිකාරයන් පිට වරද තබන්නේ නැත."** [178]

**කි. බැ. :** එසේනම්, මිනිස්සුන් මෙම මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන විශ්වාසය තබන්නේ ඇයි?

---

176. බයිබලයේ, හොෂෙයා 6:6
177. " ශු. මතෙව් 9:13
178. " ශු. මතෙව් 12:7

**මුස්.** : ඇත්තෙන් ම, මළවුන්ගෙන් නැවත නැගිටීමේ මෙම විශ්වාසය උගන්වනු ලැබුවේ ප්‍රේරිත වූ පාවුල් විසින් ය. පහත සඳහන් වාක්‍යයන් එය ඔප්පු කරයි:

> **".... සමහරෙක් (යුදෙව්වන්) ද මේ වාචාලයා මක්කියන්ට හඳනවාදැයි කීවෝ ය. තව සමහරෙක්: ඔහු (පාවුල්) අන් දේවතාවන් ප්‍රකාශ කරන්නෙකු මෙන් පෙනේයැයි කීවෝ ය. මෙසේ කීවේ ඔහු යේසුස් වහන්සේ හා මළවුන්ගෙන් නැගිටීම ප්‍රකාශ කළ බැවින් ය."** [179]

පාවුල්, කිසිවිටක යේසුස් වහන්සේ දැක නැත. යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම ඔහුගේ නිපැයුමක් බව ඔහු ම පිළිගෙන ඇත. පාවුල් විසින් තිමෝතියස්ට ලියන ලද දෙවෙනි පත්‍රයෙ හි මෙය සඳහන් කරයි:

> **"මාගේ (එනම් පාවුල්ගේ) ශුභාරංචියේ ප්‍රකාරයට දාවිත්ගේ වංශයෙන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටින බව සිහිකරපන්න."** [180]

යේසුස් වහන්සේ දෙවියන්ගේ පුත්‍රයා ය:' යන අදහස ද මුලින් ම මිනිසුන්ගේ සිතට ඇතුළු කළේ ද මෙම පාවුල් ය: බයිබලය එය පැහැදිලි ව ඔප්පු කරයි:

> **"ඔහු අප්‍රමාද ව ම: යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා ය කියා සිනගෝගවල දී උන්වහන්සේ ව ප්‍රකාශ කළේ ය."** [181]

මෙම කරුණු අනුව පැහැදිලි වන සත්‍යයක් නම්, ක්‍රිස්තියානි ආගම යේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව ඇතිවූවක් නොවන බව ය; එය පාවුල්ගේ නිපැයුමකි:

**කි. බැ.** : ඔබ මෙසේ කරුණු ඉදිරිපත් කළත්, යේසුස් වහන්සේ ස්වර්ගයට ඔසවාගත් බවත්, දෙවියන් වහන්සේට දකුණු පැත්තෙන් වාඩි වූ බවත් බයිබලයෙ හි ශු. මාර්ක් පවසයි:

> **"මෙසේ ස්වාමී වූ යේසුස් වහන්සේ ඔවුන්ට කථාකළ පසු, ස්වර්ගයට ඔසවාගනු ලැබ, දෙවියන් වහන්සේගේ දකුණු පැත්තෙ හි වාඩි වූ සේක."** [182]

---

179. බයිබලයේ, ක්‍රියා 17:18
180. ,, 2 - තිමෝති 2 : 8
181. ,, ක්‍රියා 9 : 20
182. ,, ශු. මාර්ක් 16:19

**මුස්. :** බයිබලය ගැන වූ අපගේ සාකච්ඡාවේ දී මම සඳහන් කළ සත්‍යයක් අපි කිසිවිටක අමතක නොකළ යුතුයි. එනම්, බයිබලයේ, ශු. මාර්ක්ගේ ශුභාරංචියේ 16 වෙනි පරිච්ඡේදයේ 9 පටන් 20 දක්වා වූ වාක්‍යයන් ඇතැම් බයිබල්වලින් ඉවත්කොට ඇති බව ය. කරුණාකර 'Revised Standard Version, The New American Standard Bible, The New World Translation of the Holy Scriptures' යනාදී බයිබල් හි ඇති සටහන් කියවා බලන්න.

යේසුස් වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලැබීම නිසා ම, එතුමා දේවත්වය ඇති කෙනෙකු ලෙස ඔබ විශ්වාස කරන්නේ නම්, එතුමා මෙන් ම ස්වර්ගයට ඔසවා ගනු ලැබූ අනෙක් වක්තෘවරයින් ද දේවත්වය ඇති ශ්‍රේෂ්ඨ අය බව විශ්වාස නොකරන්නේ ඇයි?

**කි. බැ. :** ඔවුහු කවරහු ද?

**මුස්. :** මෙම බයිබල් වාක්‍යයන් ඔවුහු කවරහුදැ යි ඔබට හඳුන්වා දෙනු ඇත. සාවධාන ව සවන්දෙන්න.

> **" ... එලියා සුළි සුළඟකින් ස්වර්ගයට නැඟී ගියේ ය. එලීෂා ඒ දැක: .... යනු කීවේ ය. ඔහු තවත් ඔහු නුදුටුවේ ය. "** [183]

ඒනොක් ද දෙවියන් වහන්සේ විසින් ස්වර්ගයට ගෙන යනු ලැබී ය.

> **" තව ද ඒනොක් දෙවියන් වහන්සේ සමග හැසුරුණේ ය: දෙවියන් වහන්සේ ඔහු ගත් බැවින් ඔහු තවත් නොදක්නා ලද්දේ ය."** [184]

මේ සිද්ධිය පිළිබඳ ව හෙබ්‍රෙව් හි ද සඳහන් වී ඇත.

> **"ඇදහිල්ලෙන්, ඒනොක් මරණය නොදකින ලෙස ගෙනයනු ලැබුවේ ය; දෙවියන් වහන්සේ ඔහු ගෙනගිය හෙයින් ඔහු සම්බ නොවී ය. ඔහුගේ ගෙනයාමට ප්‍රථම, ඔහු දෙවියන් වහන්සේ ව ප්‍රසන්න කළ බවට සාක්ෂි ලැබුවේ ය."** [185]

---

183. බයිබලයේ, 2 - රාජාවලිය 2 : 11
184. " උත්පත්ති 5 : 24
185. " හෙබ්‍රෙව් 11 : 5

# 7

# පාපෝච්චාරණය සහ මුල් පාපය

**ක්‍රි. බැ :** මෙතෙක් සාකච්ඡා කළ කරුණු අනුව, 'යේසුස් වහන්සේට කුරුසියේ ඇණ ගැසීම නිසා මරණයට පත්වීම තුළින්, එතුමා මිනිස්සුන්ගේ පාපයන්ට පාපෝච්චාරණය කළ හ' යි කීම වැරදි ද? එය එතුමාගේ ඉගැන්වීමක් නොවෙයි ද?

**මුස්. :** ඔව්; එසේ කීම වැරදියි; එය යේසුස් වහන්සේගේ ඉගැන්වීමක් නොවෙයි. පාපෝච්චාරණය පිළිබඳ වූ මෙම ඉගැන්වීම යේසුස් වහන්සේ මෙලොවින් ගොස් ශත වර්ෂ තුන හතරකට පසු ක්‍රිස්තියානි මහා සභාව විසින් ඇතිකරන ලද්දකි. මෙය බයිබලයේ ඉගැන්වීම්වලට පටහැනිය. පහත සඳහන් බයිබල් වාක්‍යයන් මෙය ඔප්පු කරයි:

> **"දරුවන් වෙනුවට පියවරුවත් පියවරුන් වෙනුවට දරුවෝවත් මරනු නොලැබෙත්වා. එක් එක්කෙනා තම තමාගේ පාපය නිසා මරනු ලැබේවා."[186]**

> **"නුමුත් එකිනෙකා තම තමාගේ ම අයුතුකම නිසා නසින්නේ ය. යමෙක් ඇඹුල් මිදිඵල කන්නේ ද ඔහුගේ ම දත් හිරිවැටෙන්නේ ය."[187]**

> **"පව්කරන ප්‍රාණයම නසිනවා ඇත. පුත්‍රයා පියාගේ අයුතුකම නො දරන්නේ ය. පියා ද පුත්‍රයාගේ අයුතුකම නොදරන්නේ ය; ධර්මිෂ්ඨයාගේ ධර්මිෂ්ඨකම ඔහු පිටවත් දුෂ්ටයාගේ දුෂ්ටකම ඔහු පිටවත් පැමිණෙන්නේ ය." [188]**

මේ අනුව, ආදම් සහ ඒව දෙදෙනා ද ඔවුන්ගේ පව්වලට ඔවුන් ම වගකිව යුත්තෝ වන්නා හ. (කුර්ආනය පවසා ඇති පරිදි ඔවුන්ගේ පව් අල්ලාහ් විසින් ක්ෂමා කරන ලදී.)

186. බයිබලයේ, ද්විතීය කථාව 24:16
187. බයිබලයේ, යෙරෙමියා 31:30
188. බයිබලයේ, එසකියෙල් 18:20

**කි. බැ.:** ඔබ උපුටා දක්වන මෙම වාක්‍ය සියල්ල බයිබලයේ පරණ ගිවිසුමෙන් ය!

**මුස්.:** එසේ ද? කරුණාකර අලුත් ගිවිසුමේ යේසුස් වහන්සේ ම පවසා ඇති බව ඇති වාක්‍යය කියවන්න:

**කි. බැ.:තුඹලා විනිශ්චය කරනු නොලබන පිණිස විනිශ්චය කරපල්ලා. මක්නිසාද තුඹලා යම් විනිශ්චයකින් විනිශ්චය කරන්නහු ද එයින් ම තුඹලාත් විනිශ්චය කරනු ලබන්නහු ය. යම් මිම්මකින් තුඹලා මැන දෙන්නහු ද එයින් ම තුඹලාටත් මැනදෙනු ලබන්නේ ය"[189]**

**මුස්.:** බයිබලයේ, 1- කොරින්ති හි 3 වෙනි පරිච්ඡේදයේ 8 වෙනි වාක්‍යයත් කියවන්න.

**කි. බැ."හිටවන තැනැත්තෙත් වතුර වත්කරන තැනෙත්තෙත් එක ය. එක් එක්කෙනා තම තමාගේ වැඩේ හැටියට තම තමාගේ විපාකය ලබන්නේ ය."**

නමුත්, අපි මුල් පාපය විශ්වාස කරන්නෙමු!

**මුස්.:** දරුවන් පවින් තොර ව උපදින බව මට ඔප්පු කළ හැකි ය. බයිබලයේ, ශු. මතෙව් හි 19 වෙනි පරිච්ඡේදයේ 14 වෙනි වාක්‍යය කියවන්න.

**කි. බැ.:"එහෙත්, යේසුස් වහන්සේ කථාකොට: දරුවන් නොවලක්වා මා ළඟට එන්ට ඉඩහැරපල්ලා. මක් නිසාද ස්වර්ග රාජ්‍යය මෙබඳුවන්ගේ යයි කීසේක."**

**මුස්.:** මෙයින්, සෑම කෙනෙක් ම පවින් තොර ව ඉපදෙන බවත්, දරුවන් ස්වර්ග රාජ්‍යයට අයත් බවත් වැටහෙනවා නේද? මෝසෙස්ගේ ව්‍යවස්ථාව අහෝසි කරන ලද්දේ පාවුල් විසින් බව ඔබ දන්නවාද? බයිබලයේ, ක්‍රියා හි 13 වෙනි පරිච්ඡේදයේ 39 වෙනි වාක්‍යය කරුණාකර කියවන්න:

---

**189. බයිබලයේ, ශු. මතෙව් 7:1,2**

**කි. බැ.:**"අදහන්නා වූ සියල්ලෝ උන්වහන්සේ කරණකොටගෙන සියලු දේවල් පිළිබඳ ව නිර්දෝෂ කරනු ලබති. එසේ නුඹලාට මෝසෙස්ගේ ව්‍යවස්ථාව කරණකොටගෙන නිර්දෝෂ කරනු ලබන්ට නුපුළුවන් විය."

**මුස්.:** ඔබගෙන් ප්‍රශ්නයක් අහන්න මට ඉඩදෙන්න. යේසුස් වහන්සේ ජීවත් ව සිටිය දී කිසිවිටක නොදුටු පාවුල් ම, මෙය (යේසුස් වහන්සේ කුරුසියේ තබා ඇණ ගැසූ බව කියන කථාව) ඔහුගේ ශුභාරංචියක් බව පිළිගෙන ඇතිවිට, ඔබ යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටින බව විශ්වාස කරන්නේ කෙසේ ද?

**කි. බැ.:** පාවුල් එසේ පිළිගත් බව සඳහන් වන්නේ කොහේ ද?

**මුස්.:** බයිබලයේ, 2-තිමෝති හි 2 වෙනි පරිච්ඡේදයේ 8 වෙනි වාක්‍යය කියවන්න:

**කි. බැ.** "මාගේ ශුභාරංචියේ ප්‍රකාරයට දාවිත්ගේ වංශයෙන් උපන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටින බව සිහිකරපන්න."

එසේ නම්, යේසුස් වහන්සේ කුරුසියේ තබා ඇණ ගැසූ බවත්, එතුමා මළවුන්ගෙන් නැවත නැගිට වූ බවත් විශ්වාස කිරීමට හේතුව කුමක් ද?

**මුස්.:** එයයි මටත් වැටහෙන්නේ නැත්තේ. ඉස්ලාමය බුද්ධියට, හොඳ නරක තෝරා බේරා ගැනීමේ විචක්ෂණ බුද්ධියට නිසිතැන දෙන ජීවන ප්‍රතිපදාවකි: ආගමකි: අල්ලාහ්ගේ වක්තෘවරුන් සියලු දෙනා ම ඉගැන්වූ ඉතාමත් පවිත්‍ර මාර්ගයකි. මෙය මිථ්‍යා දෘෂ්ටික ඇදහීම් වලින් හෝ අන්ධ විශ්වාසයන් වලින් හෝ අපවිත්‍ර වී නැත.

**කි. බැ.:** මම සොයාගෙන සිටින්නේ ද මෙවැනි උතුම් ආගමක් ය!

**මුස්.:** එසේ නම්, 'ෂහාදත්'ව (ඉස්ලාමය පිළිගත් බවට සාක්ෂිය) පවසා ඉස්ලාමය පිළිගන්න පසුබට වන්න එපා. පළමුව, ඉංග්‍රීසි භාෂාවෙන් එය පවසන්න. පසුව අරාබියෙන් පවසන්න මම උදව් වන්නෙමි.

**කි. බැ.:**"අල්ලාහ් හැර (නැමදීමට, අවනත වීමට, නීති සම්පාදනය කිරීමට) වෙන දෙවියෙකෙනෙක් නැ; මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දසයෙකු හා වක්තෘවරයෙකු වෙයි, යනු සාක්ෂි දරමි! "

**"අෂ්හදු අන්ලාඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීකලහු ව අෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු ව රසූලුහු"**

වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාගේ පැමිණීම පිළිබඳ ව බයිබලයෙ හි අනාවැකි ඇත්තේ ද?

**මුස්.:** ඔව්. නමුත් එය බයිබලයෙන් දැනගත යුතු අවශ්‍යතාවක් මුස්ලිම්වරුන්ට නැත. ඔබ බයිබලය හොඳහැටි කියවා ඇති හෙයින්, වෙනත් අවස්ථාවක ඒ පිළිබඳ ව කෙටියෙන් ඔබ සමග සාකච්ඡා කරන්නෙමි, ඉන්ෂා අල්ලාහ්!

**මෙතැන් සිට ආරම්භවන සාකච්ඡාව මුස්ලිම්වරුන් දෙදෙනෙක් අතර වූවක් වේ.**

# බයිබලයෙහි සඳහන් වන මුහම්මද් (සල්) තුමා

## 1- ආශිර්වාද ලත් ඉෂ්මායෙල් සහ ඊසාක් දෙදෙනා!

**පළමුවෙනි මුස්ලිම්:*** ඉෂ්මායෙල් සහ එතුමාගේ මව වූ හාගර්, සාරාගෙන් වෙන් වී ගියේ ඇයි?

**දෙවෙනි මුස්ලිම්:*** ඊසාක්ට කිරිවැරීමෙන් පසු ඉෂ්මායෙල් ඊසාක්ට විහිළු තහළු කිරීම ඔහුගේ (ඊසාක්ගේ) මව දැක්කා ය. එබැවින්, තම පුත්‍රයා වූ ඊසාක් සමග ඉෂ්මායෙල් ද උරුමක් කාරයෙක් වීමට ඇය අකැමැති වූවා ය. මේ පිළිබඳ ව බයිබලය මෙසේ පවසයි:

> **"ළදරුවා වැඩී කිරිවැරුවේ ය. ඊසාක් කිරි වැරූ දවසෙහි ආබ්‍රහම් මහත් මංගල්‍ය කෑමක් පිළියෙළ කෙළේ ය. මිසරිය හාගර් ආබ්‍රහම් නිසා වැදූ පුත්‍රයා ඊසාක්ට සරදම් කරනවා සාරා දුටුවා ය. එහෙයින් ඇ ආබ්‍රහම්ට කථාකොට: මේ දාසිය සහ ඇගේ පුත්‍රයා පිටත දමා පන්න. මක්නිසාද මේ දාසියගේ පුත්‍රයා මාගේ පුත්‍රයා වූ ඊසාක් සමග උරුමක්කාර නොවන්නේයයි කීවා ය."[190]**

**පළ.මුස්.:** ඊසාක්ට කිරිවැරූ කල ඔහුගේ වයස අවුරුදු දෙකක් විය. එවිට ඉෂ්මායෙල්ගේ වයස අවුරුදු දහසයකි. බයිබලය අනුව, හාගර්ට ඉෂ්මායෙල් ලැබෙන විට ආබ්‍රහම් 86 වෙනි වියෙහි සිටීය; ඊසාක් ඉපදෙන විට එතුමාගේ (ආබ්‍රහම්ගේ) වයස හරියට ම අවුරුදු සියයක් වූයේ ය.

> **"හාගර් ආබ්‍රහම් නිසා ඉෂ්මායෙල් වැදූකල ආබ්‍රහම්ගේ වයස අසූ සාවුරුද්දක් විය."[191]**

---

* මින් ඉදිරියට මෙම 'පළමුවෙනි මුස්ලිම්, දෙවෙනි මුස්ලිම්' යන වචන කෙටියෙන් 'පළ. මුස්:' 'දෙ. මුස්.' යනුවෙන් සඳහන් වෙයි.

* බයිබලයෙහි ආබ්‍රහම් තුමාගේ නම 'ආබ්‍රහම්' යනු ද 'ආබ්‍රම්' යනු ද ඇත.

190. බයිබලයේ, උත්පත්ති 21:8-10

"හාගර් ආබ්‍රහම් නිසා ඉෂ්මායෙල් වැදූ කල ආබ්‍රහම්ගේ වයස අසූ සාවුරුද්දක් විය."[191]

" ආබ්‍රහම් තමාගේ පුත්‍ර වූ ඊසාක් උපදින කල අවුරුදු සියයක් වයස් ව සිටියේ ය."[192]

එසේ නම්, බයිබලයේ, 'උත්පත්ති' යෙහි ඇති 21:8-10 වාක්‍යයන්ට එම 'උත්පත්ති' යෙහි ම ඇති 21:14-21 වාක්‍යයන් පටහැනි වෙයි. මෙම බයිබල්, උත්පත්ති 21:14-21 වාක්‍යයන් හි ඉෂ්මායෙල්, ඔහුගේ මවගේ උර හිසෙහි සිටි දරුවෙක් ව පෙන්නා ඇත; දරුවෙක් යැයි අමතා ඇත.

"ආබ්‍රහම් අලුයම නැගිට රොටි සහ වතුර භාජනයකුත් ගෙන හාගර්ගේ කරේ තබා දරුවා ද ඇට දී ඇය යන්ට හැරියේ ය .........
ඈ දරුවා පඳුරක් යට තබාගොස් .......... (දෙවියන් වහන්සේ ඇට කථාකොට) නැගිට ළමයා ඔසවා නුඹේ අතින් අල්ලාගනින්න........"[193]

මෙම වාක්‍යවලින් කුඩා දරුවෙක් මිස ගැටවර කාලයේ පසුවෙන තරුණයෙකු පෙන්වා නැති බව පැහැදිලි ය. මෙයින් පෙනීයන්නේ ඉෂ්මායෙල් සහ හාගර්, ඊසාක් ඉපදීමට බොහෝ කලකට පෙර සාරාගෙන් වෙන් වී ගිය බව ය. සියයට සියයක් ම විශ්වාසිත කුර්ආනයෙහි අනාවරණය වී ඇති පරිදි, ආබ්‍රහම් තමාගේ ඉෂ්මායෙල් සහ හාගර්ව කැඳවා ගෙන ගොස් බයිබලයෙහි 'පාරාන්'[194] නමින් අමතන මක්කාවෙ හි පදිංචි කළ හ. දෙවියන් වහන්සේගේ සැලැස්මේ එක් අංගයක් වශයෙන් ආබ්‍රහම්ට මෙසේ කරන ලෙස අණ කරන ලදී.

පසු ව, හාගර් ජලය ලබාගැනීම පිණිස 'සෆා' 'මර්වා' කඳු ගැට දෙක අතර සත් වරක් ම දිව්වා ය. මෙය පසුකලෙක මුස්ලිම්වරුන් ඉටුකරන කර්තව්‍යයක් බවට පත්විය. හජ් සමයෙහි හජ් කර්තව්‍යය ඉටු කිරීම පිණිස ලොව සතර වටින් ම පැමිණෙන ලක්ෂ සංඛ්‍යාත මුස්ලිම්වරුන් අදවනතුරුත් මෙය භක්තියෙන් යුතු ව ඉටුකරති. බයිබලයේ සඳහන් වන දිය උල්පත[195] (ළිඳ) මක්කාවෙහි තවත් ඇත; එය 'සම් සම්' (Zum Zum) නමින් අමතනු ලබන්නේ ය.

191. බයිබලයේ, උත්පත්ති 16:16
192. බයිබලයේ, උත්පත්ති 21:5
193. බයිබලයේ, උත්පත්ති 21:14-21
194. බයිබලයේ, උත්පත්ති 21:21
195. බයිබලයේ, උත්පත්ති 21:19

පසුව, ආබ්‍රහම් සහ ඉෂ්මායෙල් දෙදෙනා එක් වී ශුද්ධ වූ කෘබාව මක්කාවෙ හි නිර්මාණය කළ හ. ආබ්‍රහම් ශුද්ධ වූ කෘබාවට සමීප වී සලාතය ඉටු කළ ස්ථානය සඳහන්කොට ඇති පරිදි අදවන තුරුත් නො වෙනස් ව එසේම ඇත. 'මකාමු ඉබ්‍රාහිම්' (ඉබ්‍රාහිම් සලාතය ඉටුකළ තැන) නමින් අදත් එම ස්ථානය අමතනු ලබන්නේ ය. හජ් කර්තව්‍යය සඳහා වෙන් වූ කාලය තුළ එම කර්තව්‍යය ඉටු කිරීමට මක්කාවට පැමිණෙන මුස්ලිම්වරුන් ද ලොව වෙසෙන අනෙකුත් කෝටි සංඛ්‍යාත මුස්ලිම්වරුන් ද ආබ්‍රහම් සහ ඉෂ්මායෙල් කළ උදාර සේවය සිහි කිරීමක් වශයෙන් (ගවයෝ, එළුවෝ සහ ඔටුවෝ වැනි) සිවුපාවුන් කපා දුගී දුප්පත් ජනතාවට බෙදා දෙනු ලැබේ.

දෙ. මුස්: නමුත්, බයිබලයෙහි සඳහන් වන්නේ කැපකිරීම පිණිස තෝරා ගනු ලැබුවේ ඊසාක් බව නේ ද?

පළ.මුස්.: නැහැ. ඉෂ්මායෙල් කැපකිරීමට නියමිත දිනයෙහි දෙවියන් වහන්සේටත්, ආබ්‍රහම්ටත්, එතුමාගේ එකම පුත්‍රයා වූ ඉෂ්මායෙල්ටත් අතර ගිවිසුමක් ඇතිකර මුද්‍රා තබනු ලැබූ බව කුර්ආනය පවසයි. තවද, එදින ම ආබ්‍රහම්, ඉෂ්මායෙල් හා එතුමාගේ නිවසෙහි සිටි සියලු ම පිරිමින් චර්මඡේදනය කරනු ලැබූ හ. එවිට ඊසාක් ඉපදී සිටියේවත් නැත. බයිබලය මේ පිළිබඳ ව මෙසේ පවසයි:

> **"ආබ්‍රහම් චර්මාග්‍ර මාංසය ඡේදාය කරනු ලබන කල අවුරුදු අනූනවයක් වයස් ව සිටියේ ය. ඔහුගේ පුත්‍ර වූ ඉෂ්මායෙල්ගේ චර්මාග්‍ර මාංසය ඡේදාය කරනු ලබන කල ඔහු අවුරුදු දහතුනක් වයස් ව සිටියේ ය. එම දවසෙහි ම ආබ්‍රහම් ද ඔහුගේ පුත්‍ර වූ ඉෂ්මායෙල් ද චර්මඡේදාය කරනු ලැබුවෝ ය. ගෙයි උපන්නෝ ද විදේශීන්ගෙන් මිලේට ගනු ලැබුවෝ ද යන ඔහුගේ ගෙදර සියලු පිරිමි ඔහු සමඟ චර්මඡේදාය කරනු ලැබුවෝ ය."[196]**

වසරකට පසු ඊසාක් ඉපදුනේ ය. ඔහු ඉපදී අටවෙනි දින ඔහුට ද චර්මඡේදනය කරනු ලැබී ය.

196. බයිබලයේ, උත්පත්ති 17:24-27

**"දෙවියන් වහන්සේ තමාට අණදුන් ලෙස ආබ්‍රහම් තමාගේ පුත්‍ර වූ ඊසාක්ට අට දවසක් වයස් වූ කල්හි ඔහු චර්මඡේදාය කෙළේය. ආබ්‍රහම් තමාගේ පුත්‍ර වූ ඊසාක් උපදින කල අවුරුදු සියයක් වයස් ව සිටියේ ය"**[197]

මෙසේ ගිවිසුමක් ඇතිකර මුද්‍රා තබනු ලැබූ (චර්මඡේදනය සහ කැප කිරීම කරනු ලැබූ) කල්හි ආබ්‍රහම්ගේ වයස අනූනවයක් ද ඉෂ්මායෙල්ගේ වයස දහතුනක් ද විය. ඊසාක් ඊට වසරකට පසු ඉපදුනේ ය. එවිට ආබ්‍රහම්ගේ වයස අවුරුදු සියයක් විය.

වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා ඇතුළු ව ඉෂ්මායෙල්ගේ පරම්පරාවෙන් පැවත එන්නන් ද ලොව වෙසෙන මුළු මුස්ලිම් ජනතාව ද මෙම චර්මඡේදනයට අදාළ ගිවිසුම කෙරෙහි අදවනතුරුත් විශ්වාසයෙන් සිටිති; ඔවුන්ගේ සලාතයන් හි, අඛණ්ඩව දිනපතා ඔවුන් ඉටුකරන පස් වේල් සලාතයන් හි ආබ්‍රහම් හා එතුමාගෙන් පැවත එන්නන්ට ද, මුහම්මද් (සල්) තුමා හා එතුමාගේ පැවත එන්නන්ට ද ප්‍රාර්ථනා කරති.

**දෙ. මුස්.:** බයිබලයේ, උත්පත්ති හි 22 වෙනි පරිච්ඡේදය කැපකිරීමට සිටියේ ඊසාක් යනුවෙන් සඳහන් කරයි!

**පළ. මුස්.:** මම එය දනිමි. නමුත් එහි පරස්පර විරෝධි තත්ත්වයක් ඇති බව ඔබ දැනගත යුතුයි. එහි, "..... **තුඹේ එකම පුත්‍ර වූ ඊසාක්** ......" යනුවෙන් ඇත.

එකල, ඉෂ්මායෙල්ගේ වයස අවුරුදු දහතුනක් වන හෙයිනුත්, ඊසාක් තවමත් නො ඉපදුනු හෙයිනුත්, "**තුඹේ එකම පුත්‍ර වූ ඉෂ්මායෙල්**" යනුවෙන් නොවෙයි ද සඳහන් විය යුත්තේ. ඊසාක් ඉපදුනු කල ආබ්‍රහම්ට දරුවන් දෙදෙනෙක් වෙයි. යුදෙව්වන්ගේ ජාතිවාදය නිසා ම බයිබලයේ, 'උත්පත්ති' හි ඇති 22 වෙනි පරිච්ඡේදයේ තිබුණු 'ඉෂ්මායෙල්' යන නම සම්පූර්ණයෙන් ම 'ඊසාක්' යැයි වෙනස් කරනු ලැබී ය. නමුත්, සත්‍යය

---

197. බයිබලයේ, උත්පත්ති 21:4,5

කුමක් ද යනු පෙන්වා දීම පිණිස 'එකම පුත්‍රයා' යන වාක්‍යය, අල්ලාහ් ආරක්ෂාකොට තැබුවේ ය: එයින්, කැපකිරීමට අයත් තැනැත්තා ඉෂ්මායෙල් බවට පැහැදිලි වන්නේ ය.

"....... **නුඹේ වංශය බොහෝ සෙයින් වැඩිකරන්නෙමි.**" යනුවෙන් බයිබලයේ, උත්පත්ති, 22 වෙනි පරිච්ඡේදයේ 17 වෙනි වාක්‍යයෙහි සඳහන් වෙයි. මෙම වාක්‍යය, ඊට කලින් උත්පත්ති, 16 වෙනි පරිච්ඡේදයේ 10 වෙනි වාක්‍යයෙහි සඳහන්වන ඉෂ්මායෙල්ට ය යෙදෙන්නේ. ඒ අනුව, බයිබලයේ, උත්පත්තිහි 22 වෙනි පරිච්ඡේදය සම්පූර්ණයෙන් ම ඉෂ්මායෙල්ට නොයෙදෙයි ද? "**මම ඔහු මහත් ජාතියක් කරන්නෙමි**" යන වාක්‍යය දෙවරක් ම ඉෂ්මායෙල් වෙනුවෙන් බයිබලයෙහි සඳහන් වී ඇත. බයිබලයේ, උත්පත්ති හි 17 වෙනි පරිච්ඡේදයේ 20 වෙනි වාක්‍යය ද 21 වෙනි පරිච්ඡේදයේ 18 වෙනි වාක්‍යය ද බලන්න. මෙම වාක්‍ය කිසිසේත් ඊසාක්ට යෙදෙන්නේ නැති බව පැහැදිලි ය.

**දෙ. මුස්.:** යුදෙව්වන් හා ක්‍රිස්තියානීන් ඉෂ්මායෙල්ට වඩා ඊසාක් උසස් බව අදහස් කරති. ඊට හේතුව හාගර් පහත් තත්ත්වයේ වූ වහල් තැනැත්තියක් වීම ය.

**පළ. මුස්.:** ඔවුහු පැවසූ නමුත්, බයිබලය එලෙස නොපවසයි. බයිබලය කුමක් පවසන්නේ දැ යි බලන්න:

> **"එවිට ස්වාමීන් වහන්සේගේ වචනය ඔහු (ආබ්‍රහම්) වෙතට පැමිණ: මොහු (දමස්කයේ එලියේසර්) නුඹේ උරුමක්කාරයා නොවන්නේය: නුඹ තුළෙන් නික්මෙන කෙනෙක් ම නුඹේ උරුමක්කාරයා වන්නේ යයි කී ය."**[198]

මේ අනුව ඉෂ්මායෙල් ද ආබ්‍රහම්ගේ උරුමක්කාරයෙක් වන බව සැකයෙන් තොර ව පැහැදිලි වන්නේ ය.

මෙම බයිබල් වාක්‍යයන් කියවා බලන්න:

> **"තව ද, ස්වාමීන් වහන්සේගේ දූතයා: නුඹේ වංශය ගණන් කළ නොහැකි තරම් සමූහයක් වන පිණිස බොහෝ සෙයින් වැඩිකරන්නෙමියි ඇට කී සේක."**[199]

198. බයිබලයේ, උත්පත්ති 15:4

199. බයිබලයේ, උත්පත්ති 16:10

"මම ඉෂ්මායෙල් ගැනත් නුඹේ බස් ඇසීමි. බලව, ඔහුට ආශිර්වාද කෙළෙමි, ඒහු සඵලකරමින් අතිශයින් වැඩිකරන්නෙමි: ඔහුට දව අධිපතීන් දෙළොස් දෙනෙක් උපදින්නෝ ය, මම ඔහු මහත් ජාතියක් කරන්නෙමි."[200]

"දසියගේ පුත්‍රයා නුඹේ බීජය බැවින්, ඔහුගෙන් ද ජාතියක් කරන්නෙමියි ආබ්‍රහම්ට කීසේක."[201]

"නැඟිට ළමයා ඔසවා නුඹේ අතින් අල්ලා ගනින්න. මක්නිසාද මම ඔහු මහත් ජාතියක් කරන්නෙමියි කීසේක."[202]

"මනුෂ්‍යයෙකුට ප්‍රිය වූ තැනැත්තියක් ද අප්‍රිය වූ තැනැත්තියක් ද වන භාර්යාවන් දෙදෙනෙක් ඇත්නම්, ප්‍රිය වූ තැනැත්තීත් අප්‍රිය වූ තැනැත්තීත් දෙන්නා ම ඔහු නිසා දරුවන් වැදුවෝ නම්, අප්‍රිය වූ තැනැත්තී ගේ පුත්‍රයා කුලුදුලා වන්නේ නම්, ඔහු තමා සන්තක දේපල තමාගේ පුත්‍රයන්ට උරුම කරදෙන කල්හි කුලුදුලා ව සිටින අප්‍රිය වූ භාර්යාවගේ පුත්‍රයා වෙනුවට ප්‍රියවූ භාර්යාවගේ පුත්‍රයා කුලුදුලා මෙන් නියම නොකළ යුතු ය. අප්‍රිය වූ තැනැත්තීගේ පුත්‍රයාට තමා සන්තක සියල්ලෙන් දෙකොටසක් දීමෙන් ඔහු කුලුදුලා කොට පිළිගත යුතු ය. මක්නිසාද ඔහුගේ ශක්තියේ පටන්ගැන්ම ඔහු ය: කුලුදුලාගේ වාසි කොටස ඔහුට අයිතිය."[203]

ඉස්ලාමය, 'ඊසාක්ට සහ ඔහුගෙන් පැවත එන්නන්ට දෙවියන් වහන්සේගේ ආශිර්වාද තිබේ ය' යන්න ප්‍රතික්ෂේප නොකරයි. නමුත්, දෙවියන්වහන්සේගේ (මහ ජාතියක් කරන්නෙමියි) පොරොන්දුව තිබුනේ ඉෂ්මායෙල්ට ය. පසුකලෙක සියලු ම වක්තෘවරුන්ගෙන් අවසාන වක්තෘවරයා වූ මුහම්මද් (සල්) තුමා ජන්මය ලැබුවේ ද එතුමාගේ පරම්පරාවෙහි ය.

**දෙ. මුස්.:** එහෙත්, ක්‍රිස්තියානීන් සහ යුදෙව්වන්, ඉෂ්මායෙල් නීත්‍යානුකූල නොවූ, අවජාතක පුත්‍රයෙක් බවට වාද කරති.

**පළ. මුස්.:** ඔවුහු එසේ වාද කළ හැක: පැවසිය හැක. නමුත්, බයිබලය එසේ වාද නොකරයි: නොපවසයි. ආබ්‍රහම් වැනි ඉතා ශ්‍රේෂ්ඨ උතුම්

200. බයිබලයේ, උත්පත්ති 17:20
201. බයිබලයේ, උත්පත්ති 21:13
202. බයිබලයේ, උත්පත්ති 21:18
203. බයිබලයේ, ද්විතීය කථාව 22:15-17

වක්තෘවරයෙක් නීති විරෝධි ලෙස භාර්යාවක් තබාගන්නේ කෙසේ ද? විවාහයට පිටතින් දරුවෙක් ලබාගන්නේ කෙසේ ද? මෙය කෙතරම් අසික්කිත වාදයක් ද?

බයිබලය පවසන්නේ මෙයයි:

> **"…. සාරයි තමාගේ දසී වූ මිසරිය හාගර් ගෙන තමාගේ පුරුෂයා වූ ආබ්‍රහම්ට භාර්යාවක් කොට (සරණ) පාවා දුන්නා ය.'[204]**

කල්දීන් පුරුෂයෙක් සහ මිසරයේ ස්ත්‍රියක් වන විදේශිකයින් දෙදෙනෙකුගේ මෙම විවාහය, එක් මනුෂ්‍යයෙක් සහ ඔහුගේ පියාගේ දියණිය (එනම් එම මනුෂ්‍යයාගේ සහෝදරිය) අතර වන විවාහයට වඩා නීත්‍යානුකූල නොවෙයි ද? බයිබලයේ වාක්‍යයක් ආබ්‍රහම් එතුමාගේ සහෝදරිය විවාහ කරගත් බව පවසයි. පුදුමාකර පුවතක් වන මෙය ආබ්‍රහම්ගේ ඇත්තක් හෝ බොරුවක් විය හැකි ය; නමුත් බයිබලයෙ හි ඇත, කියවන්න:

> **"ඇරත් ඈ (සාරා) ඇත්තෙන් ම මාගේ සහෝදරිය, මාගේ පියාගේ දුවය; නුමුත් මාගේ මවුගේ දුව නොවේ ය; ඈ මාගේ භාර්යාව වූවා ය."[205]**

තව ද, 'ඉෂ්මායෙල්' යන නම ද තෝරාගනු ලැබුවේ අල්ලාහ් විසින් ය: බයිබලය මේ ගැන මෙසේ පවසයි:

> **"ස්වාමීන් වහන්සේගේ දූතයා: (හාගර්ට) බලව, නුඹ ගර්භණීව සිටියි, පුත්‍රයෙකු වදන්නීය; ස්වාමීන් වහන්සේ නුඹේ පීඩාව ඇසූ හෙයින් ඔහුට ඉෂ්මායෙල් යන නාමය තබාපන්න."[206]**

'ඉෂ්මායෙල්' යන නමේ තේරුම වනාහි, 'දෙවියන් වහන්සේ ඇහුම්කන් දෙන්නේ ය' යනු වේ. ඉෂ්මායෙල් අවජාතක පුත්‍රයෙක් බව බයිබලයෙහි කොතැනක සටහන් වී තිබේ ද?

---

204. බයිබලයේ, උත්පත්තිය 16:3
205. බයිබලයේ, උත්පත්ති 20:12
206. බයිබලයේ, උත්පත්ති 16:11

**දෙ. මුස්.:** බයිබලයේ කොතැනකවත් සටහන් වී නැත!

**පළ. මුස්.:** ඉෂ්මායෙල් සහ ඊසාක් ඉපදීමට බොහෝ කලකට පෙර අල්ලාහ් ආබ්‍රහම් සමග ගිවිසුමක් කළේ ය. එය ගැන බයිබලය මෙසේ සඳහන් කරයි:

> **"...... මිසරයේ ගංගාව පටන් මහත් ගංගාව, එනම්, ප්‍රාත් ගංගාව දක්වා තිබෙන්නා වූ කේනිවරුන් ද කෙනිස්සිවරුන් ද කද්මොනි වරුන් ද හිත්තීවරුන් ද පෙරිස්සිවරුන් ද රෙඵාවරුන් ද අමෝරිවරුන් ද කානානිවරුන් ද ගිර්ගාෂිවරුන් ද යෙබුසිවරුන් ද සත්තක මේ දේශය නුඹේ වංශයට දුනිමියි කීසේක."[207]**

(ආබ්‍රහම්ගේ පුත්‍රයා වූ) ඉෂ්මායෙල්ගේ පරම්පරාවට අයත් සියල්ලෝ ම පසුකලෙක පදිංචි කරනු ලැබුවේ මෙම නයිල් ගඟ පටන් යූප්‍රටීස් ගඟ දක්වා වූ අරාබියේ මහත් භූමි ප්‍රදේශයේ නොවෙයි ද?

**දෙ. මුස්.:** ඊසාක් සහ ඔහුගෙන් පැවත එන්නන්ට කිසිදු භූමියක් පොරොන්දු නොවූ බව ද ඔබ අදහස් කරන්නේ?

**පළ. මුස්.:** ඊසාක් ද දෙවියන් වහන්සේගේ ආශිර්වාද ලත් කෙනෙකු බව මුස්ලිම්වරුන් වන අපි පිළිගනිමු: ඒ හැර, එය අපි ප්‍රතික්ෂේප කරන්නේ නැහැ.

බයිබලයේ මෙම වාක්‍යයන් කියවන්න:

> **"නුඹ විදේශී ව වාසය කරන දේශය වන මුළු කානාන් දේශය නුඹට සහ නුඹෙන් පසුව නුඹේ (ඊසාක්ගේ) වංශයටත් සදාකාල උරුමයක් කොට දෙන්නෙමි; මම ද ඔවුන්ගේ දෙවියන් වහන්සේ ව සිටින්නෙමියි කීසේක."[208]**

මෙම වාක්‍යයෙහි, ආබ්‍රහම් කානාන් දේශයේ වාසය කරන '**විදේශිකයෙක්**' ලෙස සඳහන් වී ඇති බව පෙනෙනවා නේ ද? නමුත්, නයිල් සහ යූප්‍රටීස්

---

207. බයිබලයේ, උත්පත්ති 15:18:21

208. බයිබලයේ, උත්පත්ති 17:8

ගංහා අතර එතුමා '**විදේශිකයෙක්** ලෙස සඳහන් නොවෙයි. එබැවින්, කල්දීන් කෙනෙක් වශයෙන් එතුමා '**යුදෙව්වන්** යනුවෙන් සඳහන් කිරීමට වඩා '**අරාබිකරයෙක්** යනුවෙන් සඳහන් කිරීම උචිත වේ.

**දෙ. මුස්.:** නමුත් බයිබලයේ, උත්පත්ති හි 17 වෙනි පරිච්ඡේදයේ 21 වෙනි වාක්‍යය අනුව දෙවියන් වහන්සේ ඊසාක් සමග ගිවිසුමක් ඇතිකරගත් බවයි මට වැටහෙන්නේ!

> **"එහෙත් මාගේ ගිවිසුම එන අවුරුද්දේ නියම කාලයේදී සාරා තුඹට වදන්නාවූ ඊසාක් සමග පිහිටුවන්නෙමියි කීසේක."**

**පළ. මුස්.:** මෙයින්, ඉෂ්මායෙල් බැහැරකර ඇති බව ඔබ අදහස් කරන්නේ ද? අල්ලාහ් කිසිදු ගිවිසුමක් ඉෂ්මායෙල් සමග නොකරන බවට බයිබලය කොතැනක හෝ පවසන්නේ ද?

**දෙ. මුස්:** බයිබලයේ කොතැනකවත් මෙවැනි පැවසීමක් නොමැත.

**පළ. මුස්:** දැන්, මගේ අදහසට අදළ තවත් සාක්ෂි රැසක් බයිබලයෙන් උපුටා පෙන්වනු කැමැත්තෙමි.

# 2 - වක්තෘවරයෙක් පිළිබඳ වූ යෙරෙමියාගේ මිම්ම!

බයිබලයේ, යෙරෙමියා මෙසේ පවසයි:

> **"සමාදනය ගැන අනාගත වාක්‍ය කියන අනාගත වක්තෘ කෙනෙක් ඇද්ද, ඒ අනාගත වක්තෘගේ වචනය ඉෂ්ටවුනා ම ඔහු සැබවින් ස්වාමීන් වහන්සේ විසින් එවූ අනාගත වක්තෘකෙනෙකු බව පෙනීයන්නේ යයි අනාගත වක්තෘ වූ යෙරෙමියා කීවේ ය."[209]**

ඉස්ලාම් යනු ශාන්තිය හා සමාදනය - මැවුම්කාරයා සහ ඔහුගේ මැවීම් අතර සමාදනය යන අර්ථය වෙයි. යෙරෙමියාගේ මෙම අනාවැකිය

209. බයිබලයේ, යෙරෙමියා 28:9

යේසුස් වහන්සේට ගැළපෙන්නේ නැත. මක්නිසාද, යේසුස් වහන්සේ ම තමා සමාදනය වෙනුවෙන් නොපැමිණි බව පවසා ඇති බව බයිබලය සඳහන් කරයි:

"පොළොවට සමාදනය දෙන පිණිස මම ආවෙමියි තුඹලා සිතුවද? එසේ නොව, භේද උපදවන පිණිසයයි තුඹලාට කියමි. මක්නිසාද මෙවක් පටන් එක ගෙයක සිටින පස්දෙනෙකුගෙන් දෙදෙනෙකුට විරුද්ධ ව තුන්දෙනෙක් ද තුන්දෙනෙකුට විරුද්ධ ව දෙදෙනෙක් භේද ව සිටින්නෝ ය. පියා පුත්‍රයාටත් පුත්‍රයා පියාටත් මවු දුවටත් දුව මවුටත් නැන්ද යෙහෙළිටත් යෙහෙළි නැන්දටත් විරුද්ධ ව භේද වන්නේයයි කීසේක."[210]

"පොළොවෙහි සමාදනය දෙන්ට මම ආවෙමියි නොසිතල්ලා. සමාදනය නොව කඩුවක් දෙන්ට ආවෙමි."[211]

# 3 - ෂිලෝ (SHILOH) පැමිණෙන තෙක් .......

යාකොබ් මරණයට පත්වීමට පෙර තම පුත්‍රයන්ට දුන් පණිවුඩය මෙයයි.

"එවිට යාකොබ් තමාගේ පුත්‍රයන් කැඳවා: මතු කාලයේදී තුඹලාට පැමිණෙන්ට තිබෙන දේ තුඹලාට දන්වන පිණිස රැස්වෙයල්ලා."[212]

"ෂිලෝ එනතෙක් යුද කෙරෙන් ජයකොන්තයවත් ඔහුගේ පාද අතරෙන් ආණ්ඩුකාරයාගේ සැරයටියවත් පහනොවන්නේ ය. මනුෂ්‍ය වර්ගයන්ගේ කීකරුකම ඔහුට වන්නේ ය."[213]

ෂිලෝ යනු නගරයක නමක් ය. එහෙත්, එහි නියම තේරුම සමාදනය, ශාන්තිය හා සාමය නම් වේ. වෙනත් ආකාරයකින් පවසන්නේ නම් එය ඉස්ලාම් වේ. එසේනම්, මෙය කිසිසේත් නගරයකට අයත් නමක් බව කිව නොහැකිය: එසේ කීම උචිත නොවේ. එය යම් කෙනෙක් වෙනුවෙන් භාවිතාකරන්නේ නම් 'සලූවාහ් (shaluah) (Elohim - ඉලෝහිම්) යන වචනයෙන් බිහිවූවක් වනු ඇත. ඊට (අල්ලාහ්ගේ) වක්තෘවරයා යැයි කියනු ලැබේ.

210. බයිබලයේ, ශු. ලූක් 12:51-53
211. බයිබලයේ, ශු. මතෙව් 10:34
212. බයිබලයේ, උත්පත්ති 49:1
213. බයිබලයේ, උත්පත්ති 49:10

එබැවින්, ඊසාක්ගේ පරම්පරාවෙන් පැමිණි ඊශ්‍රායෙල් වක්තෘවරුන්ගේ පෙළපත ෂිලෝ පැමිණි විගස නැවතිය යුතුයි මෙම අදහස පහත සඳහන් කුර්ආන් වාක්‍යයට එකඟ ව ඇත:

> **යෑකුබ්ගේ මරණ මොහොතේ දී ඔබ එහි සිටියේ ද? ඔහු සිය දරුවන්ගෙන්, "මගෙන් පසු ඔබ අදහන්නේ කවරෙක්දැ"යි ඇසීය. ඔවුහු සියල්ලෝම "ඔබත් ඔබගේ මීමුත්තන් වන ඉබ්‍රාහිම්, ඉස්මාඊල් සහ ඉස්හාක් තමන්ගේ දෙවියන් ලෙස පිළිගත් ඒ අල්ලාහ් පමණක් ම අපිත් අදහමු. අපි මුස්ලිම්වරුන් වශයෙන් ඔහුට අවනත වෙමු."[214]**

බයිබලයේ, යෙරෙමියා 31 වෙනි පරිච්ඡේදයේ 36 වෙනි වාක්‍යයෙහි වක්තෘභාවය තවත් සමාජයකට වෙනස් කළ හැකි බව අනතුරු ඇඟවීමක් කොට ඇත්තේ ය. එය මෙසේය:

> **"ඒ නියෝග මා ඉදිරියෙන් පහවුණොත් ඉශ්‍රායෙල් වංශයත් කවදවත් මා ඉදිරියෙහි ජාතියක් ව නොසිටින ලෙස පහවෙනවා ඇතැයි ස්වාමීන් වහන්සේ කියන සේක."**

මෙම අදහස ම යේසුස් වහන්සේ ද ප්‍රකාශ කොට ඇත:

> **"එබැවින් තුඹලාට මම කියමි - දෙවියන් වහන්සේගේ රාජ්‍යය තුඹලාගෙන් අහක් කොට එහි ඵල උපදවන ජාතියකට දෙනු ලබන්නේය."[215]**

# 4 - බක්කා* යනු මක්කාව වේ!

ආබ්‍රහම් සහ එතුමාගේ පුත්‍රයා වූ ඉෂ්මායෙල් දෙදෙනා විසින් නිර්මාණය කරන ලද ශුද්ධ වූ කෑබාව මක්කාවෙහි ඇත. 'මක්කා' යන නම කුර්ආනයෙහි (48 වෙනි පරිච්ඡේදයේ 24 වෙනි වාක්‍යයෙහි) එක් වරක් පමණක් සඳහන් වී ඇත. මක්කාවට යෙදෙන තවත් නමක් නම් 'බක්කා' වේ. මෙය ද කුර්ආනයේ 3 වෙනි පරිච්ඡේදයේ 96 වෙනි වාක්‍යයෙහි මෙසේ සඳහන් වී ඇත.

214. අල්කුර්ආන් 2:133
215. බයිබලයේ, ශු. මතෙව් 21:43

* මෙම සිංහල (බයිබල්) වාක්‍යයෙහි 'Baca' යනු වචනය නැත. ඒ වෙනුවට ඇත්තේ 'හැලපීමේ' යනු වචනය වේ. මෙම වාක්‍යය 'The Holy Bible (king james version 1611) හි මෙසේ ඇත. "Who passing through the vally of BACA make it a well; the rain also filleth the pools." - බලන්න: Psalms 84:6

"(දෙවියන් නැමදුම් කිරීම පිණිස) මිනිසුන් උදෙසා වෙන් කරන ලද ප්‍රථම මැදුර සැබැවින් ම බක්කා වේ (මක්කාවේ) පිහිටා තිබේ. එය භාග්‍ය සම්පන්න ය. සකල ලෝ වැසියන්ට ම ඍජු මඟ ද වන්නේ ය."

විශ්ම ජනක සිද්ධියක් නම් මෙම 'බක්කා' යන වචනය වක්තෘවරයාණන් වූ දාවිත් (අලෛ) තුමා විසින් බයිබලයේ, ගීතාවලිය 84:6 හි සඳහන් කොට තිබීම ය.

"ඔව්හු වැලපීමේ (Baca) මිටියාවත මැදින් යමින් එය උල්පත් ඇති ඉඩමක් කරගනිති; එසේ ය, ප්‍රථම වර්ෂාව එය ආශිර්වාදවලින් වසයි."*

මෙහි සඳහන් වන දිය උල්පත (ළිඳ) 'සම් සම්' (Zum Zum) යන නමින් අදත් ශුද්ධ වූ කඃබාව අසල තිබේ.

# 5 - මගේ කීර්තය ලොවට දන්වන මාළිගය !

අපි බයිබලයේ, යෙසායා හි 60 වෙනි පරිච්ඡේදයේ

1) "නැඟිට බැබළියන්න, මක්නිසාද නුඹේ ආලෝකය පැමිණුණේය, ස්වාමීන් වහන්සේගේ තේජස ද නුඹ කෙරෙහි උදවිය."[216]

මෙම බයිබල් වාක්‍යය අල් කුර්ආනයේ 74 වෙනි පරිච්ඡේදයේ වාක්‍ය 1 - 3 සමග සංසන්දනය කොට බලන්න:

("සළුවෙන්) පොරවගෙන ඉන්නා තැනැත්තාණෙනි, ඔබ අවදි වී (ජනයන්ට) අනතුරු හඟවනු මැනවි. තව ද ඔබගේ දෙවියන් (මහත්මා කොට) විභූතිමත් කරනු මැනවි."

2) "එසේය, පොළොව අන්ධකාරයෙන් ද ජනයෝ ඝන අන්ධකාරයෙන් ද වසනු ලබන්නෝ ය. නුමුත් නුඹ කෙරෙහි ස්වාමීන් වහන්සේ උදවන සේක.

216. බයිබලයේ, යෙසායා 60:1

**උන්වහන්සේගේ තේජස ද නුඹ කෙරෙහි පෙනෙන්නේ ය."[217]**

ආබ්‍රහම් ද යේසුස් වහන්සේ ඇතුළු ව අනෙක් සියලු ම වක්තෘවරුන් ද කරුණා දයාවෙන් යුතුව ලොවට දේශනා කළ ඒකදේවත්වය ලෝවැස්සෝ අමතක කළ හ; එබැවින් ලොව පුරා ආධ්‍යාත්මික අන්ධකාරයක් පැතිර තිබුණි. එවැනි අවධියක අවසාන වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා පැමිණිය හ.

3) **"ජාතීන් නුඹේ ආලෝකයට ද රජවරුන් නුඹේ උදාවීමේ දීප්තියට ද එනවා ඇත."[218]**

4) **"නුඹේ ඇස් ඔසවා වටකර බලාපන්න. ඔවුන් සියල්ලෝම රැස් වී නුඹ ළඟට එති ......."[219]**

වසර විසිතුනකටත් අඩු කෙටි කාලයක් තුළ මුළු අරාබිකරය ම 'අල්ලාහ් හැර වෙන දෙවිකෙනෙක් නැත; මුහම්මද් (සල්) තුමා ඔහුගේ වක්තෘවරයා වෙයි' ධජය යටතේ එක්රැස් විය.

5) **".... මුහුදේ සම්පත් නුඹ වෙත හැරී එන්නේ ය. ජාතීන්ගේ වස්තු ද නුඹ ළඟට පැමිණෙන් ය."[220]**

ශතවර්ෂයක් ගතවන්නට පෙර ඉස්ලාමය බටහිරයේ ස්පාඤ්ඤයට ද, නැගෙනහිරයේ ඉන්දියාව හා චීනය දක්වා ද පැතිර ගියේ ය. ක්‍රිස්තියානි (මිථ්‍යා ලබ්ධික) ආධිපත්‍යයේ වැදගත් ප්‍රමුඛ ස්ථානයක් වූ උතුරු අප්‍රිකාව ද ඉස්ලාමය පිළිගත්තේ ය.

6) **"ඔටු සමූහයකින් ද මිදියන් සහ ඒපාහි තරුණ ඔටුවන්ගෙන් ද නුඹේ ස්ථානය පිරෙන්නේ ය; ෂෙබායෙන් ඔවුන් සියල්ලන් එනවා ඇත. ඔවුන් රන් ද කට්ටකුමංචල් ද ගෙනවුත් ස්වාමීන් වහන්සේගේ ප්‍රශංසා ප්‍රකාශ කරනවා ඇත."[221]**

---

217. බයිබලයේ, යෙසායා 60:2
218. බයිබලයේ යෙසායා 60:3
219. බයිබලයේ, යෙසායා 60:4
220. බයිබලයේ, යෙසායා 60:5
221. බයිබලයේ, යෙසායා 60:6

7) **"කේදර් හි සියලු එළු බැටළු රැළවල් නුඹ වෙතට රැස්කරනු ලැබේත්. නෙබායොත් හි බැටළුවෝ නුඹට සේවය කරත්. උන් මාගේ පූජාසනය පිටට පැමිණ පිළිගනු ලැබේත්. මම ද මාගේ තේජසේ ගෘහය අලංකාර කරන්නෙමි."[222]**

(අරාබිකරයේ) කේදර්ගේ බෙදී පිරිහී ගොස් සිටිය ගෝත්‍රිකයන් මුහම්මද් (සල්) තුමා විසින් සමගි කරනු ලැබූ හ. "මාගේ තේජසේ ගෘහය" යැයි මෙහි සඳහන් වන්නේ මක්කාවෙහි ඇති අල්ලාහ්ගේ ගෘහය වෙයි. ඒ හැර ක්‍රිස්ත්‍රියානි අර්ථ කථිකාචාර්යවරු සිතා සිටින යේසුස් වහන්සේගේ දේවස්ථානය (church) නොවෙයි. කේදර්ගේ ගම්බද ප්‍රදේශ වලින් සමන්විත රට (දැනට සවුදි අරාබියාව) පමණය අද ලොවෙහි ම (ක්‍රිස්ත්‍රියානි) දේවස්ථානයේ ආනුභාවයට යටත් නො වී ඇත්තේ.

8) **"ජාතීන්ගේ වස්තු නුඹ ළඟට ගෙනෙන පිණිස ද ඔවුන්ගේ රජුන් පෙරටුව එන පිණිස ද නුඹේ දොරටු රෑ දවල් නොවසා නිතරම ඇරී තිබේ."[223]**

මක්කාවෙ හි පිහිටි ශුද්ධ වූ කෑබාව අවට මස්ජිදය (Mosque) වසර 1400කට පෙර සියලු ම පිළිම ඉවත්කොට, මුහම්මද් (සල්) තුමා විසින් ශුද්ධ පවිත්‍ර කොට ඇත. දැන් එම මස්ජිදය රෑ දවල් දෙකෙහි ම විවෘත ව ඇත. එය වෙත පාලකයන් ද නොයෙකුත් භාෂා කථා කරන නානා ජාතීන්ට අයත් ජනයින් ද පැමිණීම අදත් දක්නට ලැබේ.

# 6 - කොටළුවන්ගේ රථය සහ ඔටුවන්ගේ රථය !

බයිබලයේ, යෙසායා හි සඳහන් වන දෙවර්ගයකට අයත් මිනිස්සුන් ගැන අපගේ සැලකීම යොමු කරමු.

> **"තව ද ඔහු රථයක් සමග අශ්වාරෝහකයින් දෙන්න දෙන්නා ද කොටළුවන්ගේ රථයෙහි හා ඔටුවන්ගේ රථයෙහි මනුෂ්‍යයන් නැඟී එනවා දකින කල ඉතා ඕනෑකමින් ම ඇහුම්කන් දෙන්නේ යයි කීසේක."[224]**

---

222. බයිබලයේ, යෙසායා 60:7
223. බයිබලයේ, යෙසායා 60:11
224. කරුණාකර මෙම පොතේ අධෝලිපි අංක. 39 බලන්න.

මෙම වාක්‍යයෙහි සඳහන් වන කොටළුවන්ගේ රථයෙහි නැගී පැමිණියේ කවුද? ඉරුදින පාසල් ශිෂ්‍යයින් සියලු දෙනා ම ඔහු කවු ද් යි දනිති. ඒ වෙන කෙනෙක් නොව යේසුස් වහන්සේ ය. මේ පිළිබඳ ව බයිබලයේ, ශු. යොහන් 12 වෙනි පරිච්ඡේදයේ 14 හා 15 වෙනි වාක්‍යයයන් පැහැදිලි ලෙස පවසයි:

> **"සියොන් දියණියනි, භය නොවව. බලව, නුඹේ රජ කොටළු පැටවෙකු පිට නැගී එන සේකැයි ලියා තිබෙන හැටියට යේසුස් වහන්සේ කොටළු තරයෙකු ලැබ ඌ පිට හිඳගත් සේක."**

එසේ නම්, පොරොන්දු වූ පරිදි එම ඔටුවන්ගේ රථයෙහි නැගී පැමිණියේ කවුද? මෙම ශ්‍රේෂ්ඨවත් වක්තෘවරයා කවරහුද යනු බයිබල් පාඨකයෝ නොබලා ම ගියහ; ඇත්තෙන් ම ඔවුන්ට එතුමා නොපෙනුණේ ය. ඒ වෙන කෙනෙක් නොව වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා ය. මෙසේ නිගමනයකට පැමිණීම එතුමාට නොයෙදෙයි නම්, මෙම අනාවැකිය තවමත් ඉටු නොවුන බව අදහස් වෙයි.

තවද, බයිබලයේ, යෙසායා 21:13 හි **"අරාබිය ගැන දිව්‍ය ප්‍රකාශනයය"** නමින් සඳහන් කොට තිබීම අපි කල්පනා කළයුතු කරුණකි. මෙම දිව්‍ය ප්‍රකාශනය නම්, අරාබිකරයේ වෙසෙන මුස්ලිම්වරුන්ගේ ද දැන් මුළු ලොවම වෙසෙන මුස්ලිම්වරුන්ගේ ද වැදගත් වගකීමක් ව ඇත්තේ, ඉස්ලාමයේ පණිවිඩය ලොව අස්සක් මුල්ලක් නැර ගෙන යෑම ය.

බයිබලයේ මෙම වාක්‍යය කියවන්න:

> **"තේමා දේශයේ වැසියෝ පිපාසා ඇත්තාගේ පෙරමගට වතුර ගෙනාවෝය. පලායන අය වෙතට කෑම රැගෙන ආවෝය."[225]**

මෙහි සඳහන් වන තේමා දේශය වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා තම අනුගාමිකයන් සමග (මක්කාවෙන් නික්ම) පදිංචියට ගිය මදීනා දේශය විය හැකිය. මෙසේ එහි ගිය සියලු දෙනාට ම, එක්

---

225. බයිබලයේ, යෙසායා 21:14

එක්කෙනාට ම මදීනාවේ වාසය කරන්නෙක් සහෝදරයෙක් කරනු ලැබීය: ඔවුන්ට කෑම් බීම් හා ඉඳුම් හිටුම් ද සපයන ලදී.

තව ද බයිබලයේ මෙම වාක්‍යයත් කියවන්න:

> **"මක්නිසාද ඔව්හු කඩු ඉදිරියෙන් ද ඇදගත් කඩුව ඉදිරියෙන් ද නැත් කැවූ දුන්න ඉදිරියෙන් ද යුද්ධයේ තදකම ඉදිරියෙන් ද පලාගියෝ ය."[226]**

මෙම වාක්‍යය, වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා සහ එතුමාගේ අනුගාමිකයන් කෙතරම් භයානක හිංසා පීඩාවන්ට ලක් වී මක්කාව හැර මදීනාවට ගියේ ද යනු විස්තර කරයි.

මෙම බයිබල් වාක්‍යය කියවන්න:

> **"මක්නිසාද ස්වාමීන් වහන්සේ මට කථාකොට: කුලීකාරයෙකුගේ අවුරුදු ලෙස තව අවුරුද්දකින් කේදාර් හි මුළු තේජස නැති ව යන්නේ ය."[227]**

(මක්කාව හැර ද මදීනාවට නික්ම ගිය) 'හිජ්රාහ්' ගමනට හරියට ම වසරකට පසු මිථ්‍යා දෘෂ්ටිකයන් වූ අරාබීන් (කේදාර්ගේ ගෝත්‍රිකයන්) 'බද්ර්' හි ඇති වූ යුද්ධයක දී මුස්ලිම්වරුන් විසින් අන්ත පරාජයට පත් කරනු ලැබූ හ: ඊට පසුව දිනෙන් දිනම ඔවුන්ගේ ශක්තිය බිඳ වැටෙන්නට වූයේ ය.

අවසාන වශයෙන් බයිබලයේ යෙසායා හි මෙසේ සඳහන් වෙයි:

> **"කේදාර් පුත්‍රයන්ගේ බලවන්තයන් වූ දුනුකාරයන්ගේ ගණනෙන් ඉතිරි අය ස්වල්ප වන්නෝ ය. මක්නිසාද ඉශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ එසේ වදාළසේකැයි කීවේ ය."[228]**

කේදාර් ඉෂ්මායෙල්ගේ දෙවෙනි පුත්‍රයා ය.[229] මොහුගේ පරම්පරාවෙන් අවසාන ව පැමිණියේ වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාණෝ

226. බයිබලයේ, යෙසායා 21:15
227. බයිබලයේ, යෙසායා 21:16
228. බයිබලයේ, යෙසායා 21:17
229. බයිබලයේ, උත්පත්ති 25:13

ය. මුහම්මද් (සල්) තුමා තම පණිවුඩය ඉදිරිපත් කළ ප්‍රථම අවස්ථාවේ හි දී, කේද්ර්ගෙන් පැවත එන්නන් ඊට විරුද්ධ ව නැගී සිටිය හ: මුහම්මද් (සල්) තුමාට සහ එතුමාගේ අනුගාමිකයන්ට නොයෙකුත් හිංසා පීඩා කළ හ. එහෙත්, ඔවුන්ගෙන් ඉතා අධික පිරිසක් ඉස්ලාමය පිළිගැනීම නිසා එම කේද්ර්ගේ පරම්පරාවේ සිටි ඉස්ලාමයට විරුද්ධ ව කටයුතු කළවුන් බොහෝ සේ අඩු වූහ.

සමහර බයිබල් වාක්‍යයන් හි 'කේද්ර්' යන නම අරාබීන් සඳහන් කර පෙන්වීමට යොදගන්නා සාමාන්‍ය නමක් ද ඇත. නිදසුනක් වශයෙන් පහත සඳහන් බයිබල් වාක්‍යය සඳහන් කළ හැකි ය:

> **"අරාබිය සහ කේද්ර් හි සියලු අධිපතීහු ..........."[230]**

# 7 - මෝසෙස්ට සමාන වූ වක්තෘවරයා!

දෙවියන් වහන්සේ මෝසෙස් (මූසා - අලෛ) ට කථාකොට මෙසේ පැවසූ බව බයිබලය සඳහන් කරයි:

> **"මම ඔවුන්ගේ සහෝදරයන්ගෙන් නුඹ සමාන අනාගත වක්තෘ කෙනෙකු ඔවුන්ට නැගුටුවා දී මාගේ වචන ඔහුගේ මුඛයෙහි තබන්නෙමි. මා ඔහුට අණ කරන සියල්ල ඔහු ඔවුන්ට කියන්නේ ය."[231]**

1. (ඊසාක්ගෙන් පැවත එන ආබ්‍රහම්ගේ පරම්පරාව වන) ඉශ්‍රායෙල්වරුන්ට (ඉෂ්මායෙල්ගෙන් පැවත එන ආබ්‍රහම්ගේ පරම්පරාව වන) ඉෂ්මායෙල්වරු සහෝදරයෝ වන්නා හ. යේසුස් වහන්සේ ඉශ්‍රායෙල්වරයෙක් වන හෙයින් - බයිබලයේ, ද්විතීය කථාව 18:18 වාක්‍යයෙහි දෙවියන් වහන්සේ නැගුටුවා දීමට පොරොන්දු වන වක්තෘවරයෙක් විය නොහැකි ය. උන්වහන්සේ සඳහන් කොට පෙන්වන්නේ නම්, මෙම වාක්‍යයෙහි, "නුඹ වෙතින් වක්තෘවරයෙක් නැගුටුවා දී...." යනුවෙන් සඳහන් විය යුතු ය.

---

230. බයිබලයේ, එසකියෙල් 27:21

231. බයිබලයේ, ද්විතීය කථාව 18:18

2. මුහම්මද් (සල්) තුමා මෝසෙස් වගේ නොවෙයි ද? "නොවේ යැ"යි' යනු කියන්නේ නම් බයිබලයේ මෙම පොරොන්දුව තවමත් ඉටුනොවී ඇති බව අදහස් වෙයි. පහත සඳහන් ලේඛනය අල් **ඉත්තිහාද්, ජනවාරි/මාර්තු 1982,** සහරාවේ 41 වෙනි පිටුවෙන් උපුටාගන්නා ලද්දකි. මෙහි වැදගත් විස්තරයක් ඇත.

මෙම ලේඛනය වනාහි මෝසෙස්, මුහම්මද්, යේසුස් යන තිදෙනා අතර ඇති ඉතා විශේෂ ගුණාංගයන් සහ ලක්ෂණයන්ගේ සංසන්දනය කිරීමක් වේ. මෙයින් මෝසෙස්ට සමාන වූ වක්තෘවරයා කවරෙක් ද යන්න පැහැදිලි වෙයි.

**උපත:** මෝසෙස්ගේ උපත සාමාන්‍ය ව තිබුණි: මුහම්මද්ගේ උපත ද සාමාන්‍ය ව තිබුණි. එහෙත්, යේසුස්ගේ උපත සාමාන්‍ය ව නොතිබුණි. එය සිදුවූයේ යම් විශේෂ ආකාරයකින් ය!

**පවුල් ජීවිතය :** මෝසෙස් විවාහ වී පවුල් ජීවිතයක් ගත කළ හ: එතුමාට දරුවන් ද වූහ. මුහම්මද් ද විවාහ වී පවුල් ජීවිතයක් ගත කළ හ: එතුමාට ද දරුවන් වූහ. එහෙත්, යේසුස් විවාහ වූයේ නැත: එහෙයින් දරුවන් ද නැත!

**මරණය :** මෝසෙස් සාමාන්‍ය ලෙස මරණයට පත් විය. මුහම්මද් ද සාමාන්‍ය ලෙසම ය මරණයට පත්වූයේ. එහෙත්, යේසුස්ගේ මරණය සිදුවූයේ නැත. අල්ලාහ් ඔහු ව තමා වෙත ගත්තේය.

**ක්‍රියාව :** මෝසෙස් සාමකාලීන ව වක්තෘවරයෙකු ව ද උසස් දේශපාලකයෙකු ව ද කටයුතු කළේය. මුහම්මද් ද සමකාලීන ව වක්තෘවරයෙකු ව ද උසස් දේශපාලකයෙකු ව ද කටයුතු කළේය. එහෙත්, යේසුස් වක්තෘවරයෙක් ව පමණක් කටයුතු කළේය.!

**නික්මයාම :** මෝසෙස් තම වයස්ගත කාලයේ දී තමා ජීවත් වූ ප්‍රදේශයෙන් ඇත් වී මිදියන් නගරයට යැමට සිදු විය: මුහම්මද් ද තම වයස්ගත කාලයේ දී තමා ජීවත් වූ ප්‍රදේශයෙන් ඇත් වී මදීනා නගරයට යැමට සිදුවිය. එහෙත්, යේසුස්ට එවැනි කිසිවක් නොසිදු විය!

**සතුරන් සමග සටන් කිරීම :** මෝසෙස් ඝාතනය කිරීම සඳහා එතුමාගේ සතුරන් විසින් ලුහුබැඳ යනු ලැබූ හ. තම සතුරන්ට විරුද්ධ ව සටන් කළ හ: මුහම්මද් ද ඝාතනය කිරීම සඳහා එතුමාගේ සතුරන් විසින් ලුහුබැඳ යනු ලැබූ හ. තම සතුරන් සමග කීප වතාවක් ම සටන් කළ හ. එහෙත්, යේසුස්ට එවැනි තත්ත්වයකට මුහුණ දීමට සිදුවූයේ නැත!

**සටන්වලින් ලද ප්‍රතිඵල:** මෝසෙස් සතුරන් සමග කළ ලෞකික සටනින් ද ආධ්‍යාත්මික සටනින් ද ජය ගත්තේය. මුහම්මද් ද තම සතුරන් සමග කළ ලෞකික හා ආධ්‍යාත්මික සටනින් සාර්ථක ජයක් අත්පත් කර ගත් හ. එහෙත්, යේසුස් ලැබුවේ ආධ්‍යාත්මික ජයක් පමණි!

**දේව අනාවරණය ලේඛනගත කිරීම:** මෝසෙස්ට අනාවරණය කළ දේව ග්‍රන්ථය 'තෝරාහ්' (පරණ ගිවිසුම) වෙයි. මෙය එතුමාගේ ජීවිත කාලය තුළ දී ම ලේඛන ගතකරන ලදී; මුහම්මද් ට අනාවරණය කළ දේව ග්‍රන්ථය 'අල් කුර්ආන්' වෙයි. මෙය ද එතුමා ජීවත් ව සිටියදී ම ලේඛන ගතකරන ලදී. එහෙත්, යේසුස්ට අනාවරණය කළ දේව ග්‍රන්ථය 'ඉන්ජීල්' (අලුත් ගිවිසුම) වෙයි. මෙය එතුමාගේ මරණයෙන් පසුවයි ලේඛනගත කරනු ලැබුවේ!

**ඉගැන්වීම් හි ස්වභාවය:** මෝසෙස් ආධ්‍යාත්මික ව ද නීතිය අතින් අලුත් ව්‍යවස්ථාවක් ඇතිකරලීමෙන් ද තම සත්‍ය ව්‍යාපාරය කරගෙන ගිය හ: මුහම්මද් ද ආධ්‍යාත්මික ව හා අලුත් ව්‍යවස්ථාවකින් යුත් නීති ක්‍රමයක් ද ඇතිකර, තම සත්‍ය ව්‍යාපාරය කරගෙන ගිය හ. එහෙත්, යේසුස් ප්‍රධාන වශයෙන් කරගෙන ගියේ ආධ්‍යාත්මික ව්‍යාපාරයක් බව පැහැදිලි ය!

**නායකත්වය පිළිගැනීම:** මෝසෙස් පළමුව එතුමාගේ ජනතාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ, පසුව පිළිගනු ලැබූ හ: මුහම්මද් ද පළමුව එතුමාගේ ජනතාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ, පසුව පිළිගෙන තම නායකයා ලෙස පත්කර ගත් හ. එහෙත්, යේසුස් බොහෝ ඊශ්‍රායෙල්වරුන් විසින් අන්තිම දක්වා ම නොපිළිගනු ලැබූ හ.

3. බයිබලයේ, ද්වීතීය කථාව 18:18 හි "**මාගේ වචන ඔහුගේ මුඛයෙහි තබන්නෙමි**"යි දෙවියන් වහන්සේ පවසා ඇත. මෙය මුහම්මද් (සල්) තුමාගේ ජීවිතයේ සිදු වී ඇත. එනම්, දෙවියන් වහන්සේගේ වචන දේවදූත ගේබ්‍රියෙල්ගේ මාර්ගයෙන් මුහම්මද් (සල්) තුමාට ලැබුණේ ය. එතුමා එලෙස තමා වෙත අනාවරණය වූ (දෙවියන්ගේ වචන) කිසිදු අඩු වැඩි කිරීමක් හෝ අක්ෂරයක වෙනස්වීමක් හෝ තම අනුගාමිකයන්ට කියා දුන් හ.

තව ද, බයිබලයේ, ද්වීතීය කථාව 18:19 හි මෙසේ දෙවියන් වහන්සේ පවසන සේක:

> **"මාගේ නාමයෙන් ඔහු කථාකරන මාගේ වචනවලට ඇහුම්කන් නො දෙන කිසිවෙක් ඇද්ද මම ඔහුගෙන් පිළිගන්නෙමි."**

මෙම වාක්‍යයෙහි සඳහන් වන, "**මාගේ නාමයෙන්**" යන වදන අපි බොහෝ දුරට කල්පනා කළ යුතු ව තිබේ.

අල්කුර්ආනයේ පරිච්ඡේද 114 න් 113 ක් ම පටන් ගනු ලබන්නේ "**මහා දයාන්විත මහා කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි**" යනුවෙනි. තව ද, මුස්ලිම්වරුන් තම දෛනික වැඩ කටයුතු පටන් ගන්නේ ද මෙම වාක්‍ය ය මුවින් පවසාගෙන ය. ඒ හැර, මුස්ලිම්වරුන් කිසිවිටක, යම් කටයුත්තක් කිරීමට යනවිට "දෙවියන්ගේ නාමයෙන්" යනු පවසන්නේ නැත. බයිබලයේ ද්වීතීය කථාව 18:19 හා අණකොට ඇත්තේ "මාගේ නාමයෙන්" යනු පවසන ලෙස ය; "දෙවියන්ගේ නාමයෙන්" යනුවෙන් පැවසීම වැරදි බව මෙයින් පෙනෙනවා නේ ද?

"**මාගේ නාමයෙන්**" යනු දෙවියන් වහන්සේ පැවසීමෙන්, ඔහුට නියමිත නමක් ඇති බව පැහැදිලිව ම වැටහෙයි. එම නම '**අල්ලාහ්** ය. '**අල්ලාහ්** යන නම අල්ලාහ්ට ම-දෙවියන්ට ම-ආවේණික වූ නමක් හෙයින් 'දෙවියන් 'දෙවි දූ' යන ලිංග භේදයක් මෙම නාමෙහි නොමැත. එමෙන් ම, 'දෙවියා' 'දෙවිවරුන්' යන බහු වචන ඇමතීමක් ද මෙම නමට නොමැත. ක්‍රිස්තියානීහු " පිය, පුතු, හා ශුද්ධ වූ ආත්මයෙන්" යැයි අමතති.

තව ද, බයිබලයේ. ද්විතීය කථාව 18:19 වාක්‍යයෙහි, දෙවියන් වහන්සේ, "මාගේ නාමයෙන් ඔහු කථා කරන මාගේ වචනවලට ඇහුම්කන් නොදෙන කිසිවෙක් ඇද්ද මම ඔහුගෙන් පිළිගන්නෙමි" යි පවසයි. මෙයින්, දෙවියන් වහන්සේ ද්විතීය කථාව 18:18 වාක්‍යයෙහි පොරොන්දු වූ වක්තෘවරයාට කීකරු නොවන්නා, දඬුවම් ලබන බව පැහැදිලි වෙයි. කුර්ආනය මීට අනුකූල ව කරුණු දක්වයි :

> **"නියත වශයෙන් ම ඉස්ලාම් (ජීවන ප්‍රතිපදාව) පමණි අල්ලාහ් විසින් පිළිගනු ලැබූ දහම වන්නේ."[232]**

> **"තවද ඉස්ලාමය විනා අන් දහමක් යමෙක් ප්‍රිය කළ ද (එය) කිසිවිටකත් ඔහු (අල්ලාහ් විසින්) පිළිගනු නොලැබේ. තව ද, එවැන්නෝ පරමාන්ත විනිශ්චය දිනයේ දී අලාභ වූවන් සමග සිටින්නා හ."[233]**

# 8 - මගේ මෙහෙකරුවා, පණිවිඩකරුවා හා තෝරාගනු ලැබූ තැනැත්තා !

මුහම්මද් (සල්) තුමා වක්තෘවරයෙක් බව වූ ඉතා පැහැදිලි අදහස් රැසක් රැගත් වාක්‍යයන් බයිබලයේ, යෙසායා 42 වෙනි පරිච්ඡේදයෙහි ඇත. කියවන්න :

1) **"මා විසින් උසුලන මාගේ මෙහෙකරුවා මොහු ය; මාගේ සිතට ප්‍රිය වූ මාගේ තෝරාගත් තැනැත්තා මොහු ය. මාගේ ආත්මය ඔහු කෙරෙහි තැබීමි. ඔහු ජාතීන්ට විනිශ්චය ගෙන එන්නේ ය."[234]**

තවද. ඔහු **"මාගේ පණිවිඩකාරයා"**[235] යනුවෙන් ද බයිබලයේ අමතයි.

වක්තෘවරුන් සියල්ලෝ ම අල්ලාහ්ගේ මෙහෙකරුවන් පණිවිඩකරුවන් සහ අල්ලාහ් විසින් තෝරාගනු ලැබූ තැනැත්තන් බවට සැකයක් නැත. එහෙත්, මුළු ලොවට ම පොදු වූ ආකාරයෙන් මුහම්මද් (සල්) තුමා හැර වෙන කිසි ම වක්තෘවරයෙක් මෙලෙස විශේෂයෙන්

---

232. අල් කුර්ආන් 3:19
233. අල් කුර්ආන් 3:85
234. බයිබලයේ, යෙසායා 42:1
235. බයිබලයේ, යෙසායා 42:19

සඳහන්කොට අමතා නැත. එතුමා, "අබ්දුහු ව රසූලුහුල් මුස්තපා" යැයි අමතනු ලබා ඇත. මෙයින් අදහස්වන්නේ, "ඔහු (අල්ලාහ්ගේ) දාසයා වූ ද මෙහෙකරුවා වූ ද පණිවිඩකරුවා වූ ද" යනු ය.

ඉස්ලාමය පිළිගන්නා කෙනෙකුගේ සාක්ෂිය, "අල්ලාහ් හැර (නැමදීමට, අවනත වීමට, නීති සම්පාදනය කිරීමට) වෙන දෙවි කෙනෙක් නැත: මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දාසයෙකු හා වක්තෘවරයෙක් වෙයි" යනුවෙන් විය යුතුය. ඉස්ලාමයේ මූලික ඇදහීම ගැබ් වී ඇති මෙම වචන මාලාව, ලොව පුරා ඇති මස්ජිද් (මුස්ලිම් දේවස්ථානයන්) හි ඇති 'මිනාරා' වලින් පිටවෙන අදානය (සලාතය වෙනුවෙන් කෙරෙන කැඳවීම) තුළින් දිනකට පස්වරක් ම පිටවෙයි: තවද, දිනපතා ම පස්වේලෙහි ඉටුකරන සලාතය පටන් ගැනීමට පෙර ද මෙම වචනමාලාව නැවතත් කියනු ලැබේ. එපමණක් නොව දිනපතා ඉටුකරන අනිවාර්ය සලාත් හි කරන 'තෂහ්හුද්' නම් වූ ප්‍රාර්ථනාවෙහි ද දිනකට නව වරක් ම මෙම වචන මාලාව කියනු ලැබේ. මේ හැර මුස්ලිම්වරයෙක් කොපමණ අනිවාර්ය නොවන (සුන්නත්) සලාත් ඉටු කරන්නේ ද, ඒ සෑම සලාතයකම මෙම වචන මාලාව කියනු ලැබේ. මෙසේ නැවත නැවතත් කීමෙන්, ලොව පුරා (සෑම දේශයක ම රටක ම නගරයක ම ගමක ම) ද්‍රෝංකාරය දෙන විශේෂ වචන මාලාවක් ව මෙය ඇත. වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාගේ ඉතා ප්‍රකට, එතුමාගේ පදවිය අභවන නාමය 'රසූලුල්ලාහ්' නම් වේ. මෙහි තේරුම 'අල්ලාහ්ගේ පණිවිඩකරුවා' යන්න ය.

2) "ඔහු මොර නොගසන්නේ ය. ස්වකීය හඬ නොනගන්නේ ය. වීථියෙහි එය ඇසෙන්ට නොදෙන්නේ ය."[236]

වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා සෑම අවස්ථාවක ම ඉතාමත් මෘදු ව පහත් හඬින් කථාකරන බව වාර්තාකොට ඇත. තව ද, අනෙක් මුස්ලිම්වරුන්ට ද මහත් හඬින් කථා නොකරන ලෙස අවවාද කොට ඇත.

3) "........ඔහු සැබෑවෙන් විනිශ්චය ප්‍රකාශ කරන්නේ ය."[237]

---

236. බයිබලයේ, යෙසායා 42:2

237. බයිබලයේ, යෙසායා 42:3

එකල විසූ මිථ්‍යා දෘෂ්ටික අදහස් දැරූ අරාබීන් පවා, ඔවුනතර වූ මුහම්මද් (සල්) තුමා ඉතාමත් විශ්වාසවත් කෙනෙක් ලෙස පිළිගත්හ. තව ද මදීනාවෙහි විසූ යුදෙව්වන් මුහම්මද් (සල්) තුමා ඉතා අවංක, ඍජු විනිශ්චයකාර වරයෙක් ලෙස සැලකූ හ: එහෙයින්, ඔවුන්ගේ ප්‍රශ්න රාශියක් ම විසඳා ගැනීමට, නියම තීන්දුවක් ලබා ගැනීමට එතුමා වෙත ගෙන පැමිණිය හ. මුස්ලිම්වරුන් සහ යුදෙව්වන් අතර ඇති වූ බොහෝ ප්‍රශ්නයන් හි යුදෙව්වන්ට නීත්‍යානුකූල ව ලැබිය යුතු තීන්දුව දුන් බවට සාක්ෂි රැසක් ඇත. මුහම්මද් (සල්) තුමා ජීවතුන් අතර සිටින කල නජ් රාන් දේශයෙන් (දැනට දකුණු අරාබියාව) ක්‍රිස්තියානි දූත පිරිසක් මදීනාවට පැමිණිය හ. එවිට මුස්ලිම්වරුන්ගේ ගති ගුණ, අවංකභාවය, නීතියට බැඳී සිටින විලස, වරදක් දුටුවිට ඊට එරෙහි ව නැගී සිටින එඩිතරභාවය යනාදිය දැක පැහැදී, තම ප්‍රදේශයට ද මුස්ලිම් භක්තිකයෙක් විනිශ්චයකාරවරයෙක් ලෙස නියම කරන මෙන් වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාගෙන් ඉල්ලා සිටිය හ!

4) **"පොළොවෙහි විනිශ්චය පිහිටුවන තුරු ඔහු දුර්වල නොවන්නේ ය: අධෛර්ය නොවන්නේ ය. ද්වීපයෝ ඔහුගේ ව්‍යවස්ථාව ගැන බලා සිටින්නෝ ය."[238]**

මෙය යේසුස් වහන්සේගේ ක්‍රියා මාර්ගය සමග සසඳා බැලීම අවශ්‍ය ය. එවිට මෙය යේසුස් වහන්සේ පිළිබඳ ව නොව මුහම්මද් (සල්) තුමා පිළිබඳ ව පවසා ඇති අනාවැකියක් බව මනාව වැටහෙනවා ඇත. යේසුස් වහන්සේ තම සතුරන්ට විරුද්ධ ව කළ කටයුතුවල දී ජයගත්තේ නැත. ඉශ්‍රායෙල්වරුන් එතුමාගේ දූත මෙහෙය ප්‍රතික්ෂේප කිරීම නිසා එතුමා දෙමිනසට පත් වූහ. මුහම්මද් තම ජීවිත කාලය තුළදී ම සතුරන් ජය ගත්තේ ය: ඔවුහු සියල්ලෝ ම එතුමාගේ ජීවිත කාලය තුළදී ම ඉස්ලාමය පිළිගත් හ!

5) **"ස්වාමීන් වහන්සේ වන මම ධර්මිෂ්ඨකමින් නුඹ අඬගසා ගතිමි. මම නුඹේ අත අල්ලාගෙන, නුඹ ආරක්ෂාකොට, සෙනගගේ ගිවිසුමක් සහ ජාතීන්ගේ එළියක් ද කොට නියම කරන්නෙමි."[239]**

---

238. බයිබලයේ, යෙසායා 42:4

239. බයිබලයේ, යෙසායා 42:6

මෙම වාක්‍යයෙහි "නුඹ ආරක්ෂාකොට" යැයි පැවසීමෙන් අදහස් වන්නේ එතුමාට පසු තවත් වක්තෘවරයෙක් නොපැමිණෙන බවත්, අවිශ්වාසකයෝ එතුමාට හිංසා පීඩා නොකරන බවත් ය. ඇත්තෙන් ම ඉතා කෙටිකාලයක් තුළ බොහෝ මිථ්‍යා ලබ්ධිකයින් ඉස්ලාමය වෙත මග පෙන්වනු ලැබූහ.

6) **"එසේ කරන්නේ අන්ධ වූ ඇස් අරින්නටත් හිරකාරයන් හිරගෙයින් ද අන්ධකාරයෙ හි ඉන්නන් ඇදිරි ගෙයින් ද පිටතට ගෙනෙන්නටත් ය."**[240]

මෙම වාක්‍යයෙහි "අන්ධ වූ ඇස්" යන්න ද "අන්ධකාරයේ ඉන්නන්" යන්න ද සඳහන් වන්නේ මිථ්‍යා දෘෂ්ටිකයන්ගේ අයහපත් ජීවිතය වෙයි.

7) **"මම ස්වාමීන් වහන්සේ ය: මාගේ නාමය ඒක ය. මාගේ ගෞරවය අන් කෙනෙකුටවත් මාගේ ප්‍රශංසාව රූපවලටත් නොදෙන්නෙමි."**[241]

වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා, වක්තෘවරුන්ගෙන් අවසාන ව පැමිණි කෙනෙක් ව හැඳිනෙන මුද්‍රාවක් ව සිටින හේතුව නිසා, එතුමා අනෙක් සියලු ම වක්තෘවරුන්ට වඩා ශ්‍රේෂ්ඨමත් කෙනෙකු ලෙස සැලකෙන්නා හ. එතුමාගේ ඉගැන්වීම් අදත් විකෘති නොකොට ප්‍රවේශම් සහිත ව ඇත. ක්‍රිස්තියානි දේවාලයන් හි දෙවියන්ගේ බවත්, වක්තෘවරුන්ගේ බවත් පවසමින් ප්‍රතිමා හා පින්තූර ඇතත්, එවැනි කිසිවක් මුස්ලිම්වරුන්ගේ මස්ජිද් (දේවස්ථානයන්) හි නැත.

8) **"......ස්වාමීන් වහන්සේට අළුත් ගීතිකාවක් ද පොළෝ සීමාවේ සිට උන්වහන්සේගේ ප්‍රශංසාව ද ගායනා කරව්."**[242]

මෙම වක්තෘවරයා වෙත ලැබෙන දේව අනාවරණය අලුත් ගීතිකාවක් (භාෂාවක්) වෙයි. එය හෙබ්‍රෙව් භාෂාව හෝ අරමයික් භාෂාව හෝ නොවෙයි: අරාබි භාෂාව වෙයි. අල්ලාහ් ප්‍රශංසා කිරීම ද ඔහුගේ වක්තෘ වූ මුහම්මද් (සල්) තුමාගේ විශිෂ්ඨත්වය හා ගුණ කීම ද අද ලොව ඇති

240. බයිබලයේ, යෙසායා 42:7
241. බයිබලයේ, යෙසායා 42:8
242. බයිබලයේ, යෙසායා 42:10

ලක්ෂ සංඛ්‍යාත මස්ජිද්වල ඇති මිනරා වලින් දිනකට පස් වතාවක් ම නොවෙනස් ව කරගෙන යනු ලැබේ.

9) **"කාන්තාරය සහ එහි නුවරවල් ද කේදාර්වරුන් වාසය කරන ගම් ද ශබ්ද නගත්වා; පර්වතවල වැසියෝ ඔල්වරහඬදෙත්වා. කඳු මුදුන් වල සිට මොර ගසත්වා."** [243]

හජ් කර්තව්‍යය ඉටු කිරීමට මක්කාවට යන්නන්, මක්කාවේ පිහිටි 'අරෆාත්' කන්දේ දී, සෑම වසරක් ම හඬ නගා මෙසේ කියති:

> **"මම පැමිණියෙමි: යා අල්ලාහ් මම පැමිණියෙමි. මම පැමිණියෙමි: ඔබට කොටස්කරුවෙක් නැත; මම පැමිණියෙමි. නියත වශයෙන් ම ප්‍රශංසා සියල්ල, වරප්‍රසාද සහ ආධිපත්‍යය ඔබ සතු ය: (නැවතත් කියමි.) ඔබට කොටස්කරුවෙක් නැත."**

තවද මෙම වාක්‍යයෙහි සඳහන් වන කේදාර් ඉෂ්මායෙල්ගේ දෙවෙනි පුත්‍රයා[244] වන හෙයින්, බයිබලයේ, යෙසායා 42 වෙනි පරිච්ඡේදය ඉශ්‍රායෙල්වරුන් වෙත පැමිණි කිසිදු වක්තෘවරයෙකුට ගැළපෙන්නේ නැත.

10) **"ඔව්හු ස්වාමීන් වහන්සේට ගෞරවය දී, උන්වහන්සේගේ ප්‍රශංසාව දිවයින්වල ප්‍රකාශ කෙරෙත්වා."**[245]

අල්ලාහ් ප්‍රශංසා කිරීම මූලික කරගත් ඉස්ලාමය ඉන්දුනීසියාවෙහි ද කැරිබියන් මුහුදෙහි ද පිහිටි ඉතා කුඩා දූපත් දක්වා පැතිර ගිය බව නොරහසකි.

11) **"......උන්වහන්සේ කෑ ගසා, එසේය තදින් මොරගසා, තමන්ගේ සතුරන්ට විරුද්ධ ව බලවත්කම් කරන සේක."**[246]

මුහම්මද් (සල්) තුමාණෝ පැමිණ, ඉතා සුළු කාල සීමාවක් තුළ දෙවියන්ගේ රාජධානිය පොළොව මත පිහිටවූහ.

243. බයිබලයේ, යෙසායා 42:11
244. බයිබලයේ, උත්පත්ති 25:13
245. බයිබලයේ, යෙසායා 42:12
246. බයිබලයේ, යෙසායා 42:13

අවංක ව පවසන්නේ නම්, බයිබලයේ, යෙසායා හි 42 වෙනි පරිච්ඡේදය වනාහි වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාගේ දූත මෙහෙය නිවැරදි ව විස්තර කරන වාක්‍යවලින් යුක්ත වූවක් වන්නේ ය.

## 9 - දවිත් රජු ඔහු ව ඇමතුවේ "මාගේ ස්වාමීනි" යනුවෙන් ය!

> **"ස්වාමීන් වහන්සේ මාගේ ස්වාමීන්ට කථාකොට: මා විසින් නුඹේ සතුරන් නුඹේ පාපුටුව කරනතෙක් මාගේ දකුණු පැත්තෙහි හිඳින්නැයි කී සේක."[247]**

මෙම වාක්‍යයෙ හි 'ස්වාමීන්' යනුවෙන් දෙවියන් දෙදෙනෙක් ගැන සඳහන් වෙයි. පළවෙනි 'ස්වාමීන්' (කථා කරන්නා) දෙවියෙක් වේ නම්, දෙවෙනි 'ස්වාමීන්' (කථා කරනු ලබන්නා) දෙවියෙක් විය නොහැකි ය. එහෙත්, දවිත් දැන සිටින්නේ එක ම එක දෙවියෙක් පමණි. එහෙයින්, මෙම වාක්‍යය ආරම්භ විය යුත්තේ, **"දෙවියන් වහන්සේ මාගේ ස්වාමීන්ට කථාකොට"** යනුවෙන් ය. 'දවිත් 'මාගේ ස්වාමීන්' යැයි ඇමතුවේ යේසුස් වහන්සේ ය" කියා ක්‍රිස්තියානි මහාසභාව පවසයි. එහෙත්, යේසුස් වහන්සේ ම මෙය බයිබලයේ, ශු. මතෙව් 22:45, ශු. මාර්ක් 12:37, ශු. ලූක් 20:41-44 යනා දී වාක්‍ය තුළින් ඉතා පැහැදිලි ව ප්‍රතික්ෂේප කොට ඇත. යේසුස් වහන්සේ දවිත්ගේ පුත්‍රයෙක් (එතුමාගේ පරම්පරාවෙන් පැවත එන්නෙක්) ව සිටින හෙයින් මෙසේ නොඅමතා තමා ව බේරා ගත් හ: එතුමා දවිත්ගේ පුත්‍රයෙක් ව සිටින කල, දවිත් 'මගේ ස්වාමීනි!' යැයි අමතන්නේ කෙසේ දැ'යි යේසුස් වහන්සේ තර්ක කළ හ.

යේසුස් වහන්සේ බයිබලයේ, ශු. ලූක් හි මෙසේ පවසයි:

> **"ක්‍රිස්තුස් වනාහි දවිත්ගේ පුත්‍රයායයි ඔවුන් කියන්නේ කෙසේ ද? මක් නිසාද: මා විසින් නුඹේ සතුරන් නුඹේ පාපුටුව කරන තෙක් මාගේ දකුණු පැත්තේ හිඳගනින්නැයි ස්වාමීන් වහන්සේ මාගේ ස්වාමීන් වහන්සේට කීසේකැයි දවිත්ම ගීතිකා පොතේ කියා තිබේ. මෙසේ දවිත් උන්වහන්සේට: ස්වාමීන් වහන්සේයයි කියයි. ඉදින් උන්වහන්සේ ඔහුගේ පුතුවන්නේ කෙසේදැයි කීසේක."[248]**

---

247. බයිබලයේ, ගීතාවලිය 110:1

248. බයිබලයේ, ශු.ලූක් 20:41-44

යේසුස් වහන්සේ මේ පිළිබඳ ව පැහැදිලි පිළිතුරක් දෙන්නට ඇත. එම පිළිතුර බයිබලයේ ගිවිසුම් හතරෙහි ම සටහන් නොකරන්නට ඇත. එහෙත්, යේසුස් වහන්සේගේ එම පිළිතුර බාර්නබස් තම ගිවිසුමෙහි පැහැදිලි ව සටහන් කොට ඇත. ඒ අනුව මෙම පොරොන්දුව දී ඇත්තේ ඉෂ්මායෙල් ට මිස ඊසාක්ට නොවන බව වෙයි. එහෙයින්, මෙහි දවිත් 'ස්වාමීනි' යනු අමතන්නේ මුහම්මද් (සල්) තුමාට ය. දවිත් එතුමාව ආධ්‍යාත්මික ව දැක ඇත.

මුහම්මද් (සල්) තුමා ඉටුකළාට වැඩියෙන් යමක් වෙනත් වක්තෘවරයෙක් ඉටුකර නොමැත. මුහම්මද් (සල්) තුමා අවුරුදු 23 ක් වූ කෙටි කාලය තුළ ඉටුකළ මහඟු කාර්යයන් අනෙක් වක්තෘවරුන් සියලු දෙනාගෙන් ඉටු වූ කාර්යයන් සමග සසඳා බලන කවරෙකු හෝ, මුහම්මද් (සල්) තුමාගෙන් ඉටු වූ කාර්යයන් කෙතරම් විශාල ද, අනෙක් සියලු ම වක්තෘවරුන්ගෙන් ඉටු වූ කාර්යයන් කෙතරම් සුළුපටුද, යනු වටහා ගනියි. මුහම්මද් (සල්) තුමාගේ විප්ලවීය සේවයට සමාන සේවයක් තවත් කෙනෙකුගෙන් ඇති නොවූ තරම් ය: එය අදත් නො වෙනස් ව පවතියි.

# 10 - ඒ වක්තෘවරයා ඔබ ද?

යොහන් බව්තීස්ම කවරෙක් ද යැයි දැනගැනීම පිණිස යුදෙව්වන් තම පූජකයන් ද ලෙවී වරුන් ද ඔහු වෙත යැවූ හ.

> **"(එවිට) ඔහු නොසඟවා ඇත්ත කියමින්: මම ක්‍රිස්තුස් වහන්සේ නොවෙමියි කීවේ ය. ඔව්හු ද: එසේ නම් මොක ද? නුඹ එලියාදැයි ඔහුගෙන් ඇසුවෝ ය. එසේ නොවේයයි ඔහු කීය. නුඹ අනාගත වක්තෘදැයි ඇසූ කල, නැතැයි ඔහු උත්තර දුන්නේ ය."[249]**

මෙම වාක්‍යයෙහි ඇති ඉතා වැදගත් ප්‍රශ්නය "නුඹ අනාගත වක්තෘ ද?" යැයි ඔවුන් විමසීම ය. එසේ නැතිවිට, යේසුස් වහන්සේටත්, යොහන් බව්තීස්මටත් පසුව පැමිණෙන බව දිගුකලක් බලාපොරොත්තු වන එම වක්තෘවරයා කවු ද? එම වක්තෘවරයා බයිබලයේ, ද්වීතීය කථාව 18:18

249. බයිබලයේ, ශු. යොහන් 1:20,21

හි පවසන පරිදි, මොසෙස් වැනි වූ (මෝසෙස්ට සමාන ගුණාංගයන් ඇති) මුහම්මද් (සල්) තුමා නොවෙයි ද?

# 11 - ශුද්ධ වූ ආත්මයෙන් සහ ගින්නෙන් බව්තීස්ම කිරීම!

"(යොහන් බව්තීස්ත වන) මම වනාහි පසුතැවිල්ල පිණිස තුඹලා වතුරෙන් බව්තීස්ම කරමි. තුමුත් මට පසුව එන තැනැත්තේ මට වඩා බලවත් ය. මම උන්වහන්සේගේ වහන් ගෙනයන්ටවත් නොවටිමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් ද ගින්නෙන් ද තුඹලා බව්තීස්ම කරන සේක." [250]

මෙම වාක්‍යයෙහි ඇඟවීමකින් පෙන්වනු ලබන්නේ යේසුස් වහන්සේ නම්, යොහන් බව්තීස්ත වනාන්තරයෙහි ජීවත් වීම සඳහා ආපසු නොයා සිටිය යුතුයි. ඒ වෙනුවට යේසුස් වහන්සේගේ ගෝලයන්ගෙන් කෙනෙක් වී එතුමා සමග ම සිටීමට අධිෂ්ඨාන කරගත යුතුයි. එහෙත්, ඔහු මේ කිසිවක් කළේ නැත.

එබැවින් යේසුස් වහන්සේ නොවන වෙනත් කවර කෙනෙක් හෝ, බලසම්පන්න වක්තෘවරයෙක් ලෙස අභවන්නට ඇත. තව ද, යොහන් බව්තීස්ත ඇඟ වූ තැනැත්තා නියත වශයෙන් ම යේසුස් නොවෙයි. ඒ දෙදෙනා ම සමකාලයට අයත් වන්නන් වන හෙයින් ය. තවත් කරුණක් නම්, යොහන් බව්තීස්ත පැවසුවේ මෙම වක්තෘවරයා ඔහුට පසු පැමිණෙන බව ය. එසේ නම්, යොහන් බව්තීස්ත මෙහි අභවා පෙන්වන්නේ වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා නොවෙයි ද?

# 12. ස්වර්ග රාජ්‍යයේ කුඩා තැනැත්තා !

යේසුස් වහන්සේ පැවසූ බව බයිබලය මෙසේ කියයි:

'සැබවක් තුඹලාට කියමි: ස්ත්‍රීන්ගෙන් උපන්නවුන් අතරෙන් යොහන් බව්තීස්තට වඩා උතුම් කෙනෙක් නොනැඟුවුණේ ය. තුමුත් ස්වර්ග රාජ්‍යයෙහි කුඩා තැනැත්තේ ඔහුට වඩා උතුම් ය." [251]

---

250. බයිබලයේ, ශු මතෙව් 3:11

251. බයිබලයේ, ශු. මතෙව් 11:11

යොහන් බව්තීස්ත - ආදම්, නෝවා, ආබ්‍රහම්, මෝසෙස්, දවිත් සහ තවත් වක්තෘවරුන් බොහෝ දෙනෙකුට වඩාත් ශ්‍රේෂ්ඨවත් තැනැත්තෙක් බවට ඔබට විශ්වාස කළ හැකි ද? ඔහු විසින් මිථ්‍යා දෘෂ්ටිකයන් කී දෙනෙක් ආගමට හරවා ගනු ලැබුවේ ද? කොපමණ අනුගාමිකයන් ඔහුට සිටියේ ද?

මෙවැනි ප්‍රශ්න නගන්නට මෙම වාක්‍යය මග පාදන මුත්, දැන් මෙහි ඇති ප්‍රධාන ප්‍රශ්නය මෙවැන්නක් නොවෙයි. එම ප්‍රශ්නය මෙයයි: ස්වර්ග රාජ්‍යයෙහි යොහන් පව්තීස්තට වඩා ඉතාමත් ශ්‍රේෂ්ඨ වූ කුඩා තැනැත්තා කව් ද?

නියත වශයෙන් ම එම තැනැත්තා යේසුස් වහන්සේ නොවන්නා හ. මක්නිසාද, එකල ස්වර්ග රාජ්‍යය ඇති නොවී තිබීම ය. තවද, යේසුස් වහන්සේ, තමා කුඩා තැනැත්තෙක් ලෙස හෝ වයසින් බාල ම තැනැත්තෙක් ලෙස හෝ කිසිවිටක පැවසුවේ නැත. ස්වර්ග රාජ්‍යය වනාහි සර්ව බලධාරී ව වැජඹෙන දෙවියන් ඇතුළු ව වක්තෘවරුන් සියල්ලන්ගෙන් ම යුක්ත වූ ස්ථානයකි. එහි, වක්තෘවරුන් සියල්ලන්ගෙන් ම කුඩා තැනැත්තෙක් ව, එනම් වයසින් බාල තැනැත්තෙක් ව සිටින ශ්‍රේෂ්ඨ වන්තයා වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාණන් ය.

# 13 - සමාදනය කරන්නෝ ආශිර්වාද ලද්දෝ ය!

කන්ද උඩ දේශනයෙ හි යේසුස් වහන්සේ මෙසේ සඳහන් කළ බව බයිබලය පවසයි:

> **"සමාදනය කරන්නෝ ආශිර්වාද ලද්දෝ ය: මක්නිසාද ඔව්හු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝයයි කියනු ලබන්නෝ ය."[252]**

---

252. බයිබලයේ, ශු මතෙව් 5:9

ඉස්ලාම් යනු ශාන්තිය හා සමාදනය වන්නේ ය: එනම්, මැවුම්කරු වූ දෙවියන්ටත් ඔහුට නැමදුම් ඉටුකරන තැනැත්තාටත් අතර වූ සමාදනය වේ. යේසුස් වහන්සේ සමාදනය ඇතිකිරීමට නොපැමිණි හෙයින්, එතුමාගේ දූත මෙහෙය සමාදනය කරන්නෙකුගේ බව කිව නොහැකි ය. "පොළොවෙහි සමාදනය දෙන්ට මම ආවෙමියි නොසිතල්ලා. සමාදනය නොව කඩුවක් දෙන්ට ආවෙමි. මක්නිසාද මනුෂ්‍යයෙකු තමාගේ පියා සමග ද දුව ඇගේ මවු සමග ද යෙහෙළී ඇගේ නැන්දා සමග ද භේද කරවන පිණිස ආවෙමි. මනුෂ්‍යයෙකුගේ සතුරෝ නම් ඔහුගේ ම ගෙයි වැසියෝ ය."[253]

.තව ද, බයිබලයේ, ශු. ලූක් 12:49-53 වාක්‍ය ද කියවන්න.

# 14 - සැනසුම ගෙනදෙන්නා!

යේසුස් වහන්සේ මෙසේ පැවසූ හ:

> **"මම පියාණන් වහන්සේගෙන් ඉල්ලන්නෙමි, එවිට උන්වහන්සේ නුඹලා සමග සදකල් ම සිටින පිණිස වෙන සැනසිලිකාරයෙකු නුඹලාට දෙනසේක."** [254]

'comforter - සැනසිලිකාරයෙක්' යන වචනයට සමාන ව, යේසුස් වහන්සේ භාවිතා කළ නියම 'අරාමයික්' වචනය කුමක් ද යනු අපි හරියට ම නොදනිමු. වෙනත් ඉංග්‍රීසි භාෂා බයිබල් හි 'Consoler - කොන්සෝලර්', 'advocate - ඇඩ්වොකේට්', Helper - හෙල්පර්' යන වචන ද ඇත. මෙම වචනයට, 'ශුද්ධ වූ ආත්මය', 'වදන', 'පුද්ගලයෙක්' යනාදී එකට එක වෙනස් අදහස් ද දෙනු ලැබ ඇත.

යේසුස් වහන්සේ මෙම සැනසිලිකරුගේ නම 'අහ්මද්' යනු පැහැදිලි ව ම පැවසූ බව අල් කුර්ආනය පවසයි:

> **"තව ද, මර්යම්ගේ පුතනුවන් වූ ඊසා: "ඉශ්‍රායෙල්ගේ දරුවනි මට පෙර (අනාවරණය වූ) තෝරාහ් ව ස්ථිර කරන්නෙක් ව ද, මට**

253. බයිබලයේ, ශු. මතෙව් 10:34-36

254. බයිබලයේ, ශු. යොහන් 14:16

**පසු පැමිණීමට ඇති 'අහ්මද්' යනු නමැති වක්තෘවරයා ගැන සුභාසිංසක පවසන අල්ලාහ්ගේ වක්තෘවරයෙක් ව ද මම පැමිණියෙමි......"[255]**

මෙහි යේසුස් වහන්සේ සඳහන්කොට ඇත්තේ වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාගේ දෙවෙනි නම ය. මෙම නමේ තේරුම වනාහි, 'වෙනත් කාටත් වඩා අදික ව අල්ලාහ් ප්‍රශංසා කරන්නා' යනු වේ.

'සැනසිලිකරුවා' යන වචනයට වෙනත් කුමන අර්ථයන් ඇතත්, යේසුස් වහන්සේ නිම නොකළ වැඩ කොටසක් තබාගොස් ඇති බවත්, එම වැඩ කොටස (දූත මෙහෙය) සම්පූර්ණ කිරීමට තවත් කෙනෙක් පැමිණීමට ඇති බවත් අපි නිගමනයකට පැමිණිය හැකි ය. දැන්, මෙම සැනසිලි කරුවාට අදාළ ගුණාංග වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාට තිබෙන්නේදැයි අපි බයිබලය තුළින් බලමු.

1 - **"වෙන සැනසිලිකාරයෙක්"[256]** මෙයින් අදහස්වන්නේ බොහෝ සැනසිලිකාරයන් පැමිණ ඇති බවත්, තවත් සැනසිලිකාරයෙක් පැමිණීමට ඇති බවත් ය.

2 - **"උන්වහන්සේ නුඹලා සමග සදකල් ම සිටින පිණිස."[257]** මක්නිසාද එතුමාට පසු කිසිවෙකුගේ අවශ්‍යතාවක් නැත. එතුමා වක්තෘවරුන්ගේ පෙළපත නිමාවට පත්කරන මුද්‍රාවක් ව සිටින්නා හ. තව ද, එතුමාගේ ඉගැන්වීම් කිසිදු වෙනසක් නොවී සදකල් පවතින්නේ ය. ඇත්ත වශයෙන් ම අල් කුර්ආනය සහ මුහම්මද් (සල්)තුමාගේ ඉගැන්වීම් සියල්ලම වසර 1400ට පෙර තිබුණු එලෙස ම කිසිදු වෙනසක් නොමැති ව අදත් තිබෙන්නේ ය.

3 - **"උන්වහන්සේ ආකල, පාපය ගැන ද ධර්මිෂ්ඨකම ගැන ද විනිශ්චය ගැන ද ලෝකයාට අහවා දෙනසේක."[258]** ආබ්‍රහම්, මෝසෙස්, දවිත්, සාලමොන් ඇතුළු ව සියලු ම වක්තෘවරුන් තම අසල්වැසියන්, අසල් වැසි සමාජයන්, අනුගාමිකයන් යනාදීන්ගේ පව් නැති කිරීමට වෙහෙසුන හ. එහෙත්,

255. අල්කුර්ආන් 61:6
256. බයිබලයේ, ශු. යොහන් 14:16
257. බයිබලයේ, ශු. යොහන් 14:16
258. බයිබලයේ, ශු. යොහන් 16:8

මෙම කිසිවෙක් මුළු ලොවෙහි ම තිබුණු පව් නැති කිරීමට, ඒවාට එරෙහි ව මුහම්මද් (සල්) තුමා මෙන් නොවෙහෙසුන හ. එතුමා වසර 23 ක ඉතා කෙටි කාලයක් තුළ ප්‍රතිමා වන්දනය අරාබියාවෙන් තුරන් කළ හ. එපමණක් නොව හිරක්ලියුස්, රෝමානු හා පර්සියානු අධිරාජවරුන්, එතියෝපියාවේ මහ රජු නජාසී, මිසරයේ ආණ්ඩුකාරවර මුකව්කිස් යනාදීන්ට ද තම දූත මෙහෙය රැගත් දූතයන් යවා එය පිළිගන්නා ලෙස පැවසූ හ.

තව ද, 'දෙවියන් එක්කෙනෙකි' යන ඒකදේවත්වය ත්‍රිත්වයක් බවට භේද කිරීම ද, යේසුස් වහන්සේ දෙවියන්ගේ පුත්‍රයා ලෙසත් දෙවියන් ලෙසත් හඳුන්වා දීම ද කළ ක්‍රිස්තියානීන්ගේ ක්‍රියාව තදින් ම හෙළා දැක්කා හ. මෙතෙකින් නොනැවතී, යුදෙව්වන් හා ක්‍රිස්තියානීන් තම තමන්ගේ ශුද්ධ වූ දේව ග්‍රන්ථ වෙනස් කොට, අඩු වැඩි කොට, ඒවායේ මුල් පවිත්‍ර තත්ත්වය කෙලසීම ඉතා බරපතල වරදක් බව මුහම්මද් (සල්) තුමා ප්‍රකාශ කළ හ. එතුමා ඉෂ්මායෙල් (අලෛ) තුමාගේ සහජ උරුමය සැකයෙන් තොරව ඔප්පු කළ හ. උතුම් වක්තෘවරුන් මත්පැන් පානය කළ බවත්, ස්ත්‍රීන්ට බලහත්කාරකම් කළ බවත්, දුරාචාරයේ හැසුරුණු බවත්, ප්‍රතිමා වන්දනය කළ බවත් බොරු චෝදනා නගා අවමන් කළ යුදෙව්වන් හා ක්‍රිස්තියානීන්ගේ පාපොච්චාරණ ක්‍රියාවන් වැරදි බව පෙන්වා දුන් මුහම්මද් (සල්) තුමා, එම උතුම් ඇත්තන්ගේ නිර්මලත්වය ලෝ වැස්සන්ට පහදා දුන් හ.

4 - **"විනිශ්චය ගැනයයි කීවේ මේ ලෝකයේ අධිපතියා විනිශ්චය කරනු ලැබ සිටින නිසා ය."**[259] මෙම වාක්‍යය ශු. යොහන් 12:31 හි ද ශු. යොහන් 14:30 හි ද සඳහන් වන සාතන් ට යෙදෙයි. වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා විනිශ්චය දිනය පිළිබඳ ව ලොවට අනතුරු අඟවන්නට පැමිණියහ.

5 - **"සැබෑකමේ ආත්මයාණන් වහන්සේ.."**[260] වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා ඉතා කුඩා කල පටන් 'අල් අමීන්' නමින් අමතනු ලැබූ හ. මෙහි තේරුම 'සත්‍යවාදී හා විශ්වාසදායක පුරුෂයා' වෙයි. **"උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මඟ පෙන්වන සේක"**[261] යැයි ය්සුස් වහන්සේ පවසා ඇත.

---

259. බයිබලයේ, ශු. යොහන් 16:11

260. බයිබලයේ, ශු. යොහන් 16:13

261. බයිබලයේ, ශු. යොහන් 16:13

**6 - "උන්වහන්සේ තමන්ගේ ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා"[262]** ශුද්ධ වූ කුර්ආනයෙහි ඇත්තේ අල්ලාහ්ගේ වදන් ය. එහි වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාගේ හෝ එතුමාගේ අනුගාමිකයන්ගේ හෝ වචනයකුදු අඩංගු වී නැත. මලාඉකාවරයා වන ගේබ්‍රියෙල් එතුමාට කුර්ආනය කියවූහ: එතුමා එය කටපාඩම් කරගත් හ. පසු ව එතුමාගේ ලිපිකරුවන් එය ලේඛනගත කළ හ. එතුමාගේ ස්වකීය වදන් සහ ඉගැන්වීම් හදීස් (නබිවදන්) ග්‍රන්ථයන් හි අඩංගු වී ඇත.

බයිබලයේ, ද්විතීය කථාව 18:18 හි ඇති "**.....මාගේ වචන ඔහුගේ මුඛයෙහි තබන්නෙමි. මා ඔහුට අණ කරන සියල්ල ඔහු ඔවුන්ට කියන්නේ ය.**" යන වාක්‍යය, අල්කුර්ආනයේ 53:2-4 හි ඇති පහත සඳහන් වාක්‍ය සමග සසඳා බලන්න. එවිට මෙම වාක්‍ය අතර යම් සමානත්වයක් ඇති බව ඔබට පෙනෙයි.

> **"ඔබගේ සහායයා (මුහම්මද්-(සල්)) නොමඟෙහි ද වරදෙහි ද නොවන්නෙක් වෙයි. ඔහු ස්වෙච්ඡාවෙන් (තමන් සිතූ පරිදි) කථා කරන්නෙක් ද නොවෙයි. (ඔහුගේන් පිටවෙන කථා වූ) ඒවා 'වහී' (දේව වාක්‍ය) මාර්ගයෙන් ප්‍රකාශිතයන් හැර (වෙනකක්) නැත."**

**7-උන්වහන්සේ .... පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශ කරන සේක."[263]** පර්සියාවෙ හි රෝමයට ජය ලැබීම. අබූලහබ් මුස්ලිම්වරයෙක් නොවී මරණයට පත් වීම, ඉස්ලාමයේ ව්‍යාප්තය වැනි කුර්ආනයේ අනාවැකි සියල්ල එලෙස ම ඉටු විය.

**8 - "උන්වහන්සේ මා ගෞරවයට පමුණුවන සේක."[264]** බයිබලය සහ ක්‍රිස්තියානීන්ට වඩා කුර්ආනය සහ වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමා යේසුස් වහන්සේ කෙරෙහි මහත් ගෞරවයක් දැක්වීම රහසක් ව නැත.

පහත සඳහන් කරුණු මෙම අදහස පැහැදිලි කරයි:

අ - යේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසා මරණයට පත්කළ බව ඇදහීම එතුමාගේ වක්තෘභාවයට අපකීර්තියක් ඇති කිරීමක් වෙයි. මෙම

262. බයිබලයේ, ශු. යොහන් 16:13
263. බයිබලයේ, ශු. යොහන් 16:13
264. බයිබලයේ, ශු. යොහන් 16:14

අපකීර්තිය බයිබලයේ, ද්වීතීය කථාව 13 : 5 වෙනි වාක්‍යයෙහි, "**ඒ අනාගත වක්තෘ හෝ ස්වප්නකාරයා මරනු ලැබිය යුතු යි**" යි කීමෙන් ඇතිකර ඇත. තව ද, "**එල්ලනු ලබන තැනැත්තේ දෙවියන් වහන්සේගෙන් ශාප ලද්දෙක්** යැ.'යි බයිබලයේ, ද්වීතීය කථාව 21:23 හි පැවසීමෙන් එතුමාට ශාප කර ඇත. (අල්ලාහ් මෙවැනි කථාවලින් අපව බේරාගනිත්වා!)

ආ - "**මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අතහැරියේ මක්නිසාද?** යි යේසුස් වහන්සේ අඩා වැලපී විමසූ බව බයිබලයේ, ශු. මතෙව් 27:46 වාක්‍යයෙහි සඳහන් වෙයි! යේසුස් වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ වක්තෘවරයෙක් මෙලෙස විමසූ බව පිළිගත හැකි ද? වක්තෘවරයෙක් නොවන සාමාන්‍ය මනුෂ්‍යයෙක් පවා, මෙම මරණය තමාට 'දෙවියන් වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කළ කෙනෙක් බව හා උසස් පදවියක් ලබාදෙන බව දැනගෙන ඉවසීමෙන් සිටියි: මෙයින් ලබන වේදනාවන් ඉදිරියේ සිනාමුසු ව සිටියි.

එහෙත්, මෙම බයිබල් වාක්‍යය යේසුස් වහන්සේගේ දේව විශ්වාසය ඉතා අඩුවෙන් තක්සේරු කර එතුමාට අපහාස කරනවා නොවෙයි ද? නිග්‍රහ කරනවා නොවෙයි ද? මෙය එතුමාගේ තත්ත්වය පහත හෙළීමේ ප්‍රයත්නයක් නොවෙයි ද?

ඇ - යේසුස් වහන්සේ සාමාන්‍ය ජනතාව හා වෙනත් සමාජීයයින් අපහාස කරන ආකාරයෙන් 'බල්ලෝ' 'ඌරෝ' යැයි ඇමතූ බව හෝ තම ආදර මෑණියන් 'ගැහැණිය' යැයි ඇමතූ බව හෝ මුස්ලිම්වරුන් වන අපට අදහන්න නොහැකි ය. ඊට හේතුව අල්කුර්ආනයේ 19:32 වාක්‍යයෙහි යේසුස් වහන්සේ, තමාගේ මෑණියන් ගැන මෙසේ පැවසූ බව සඳහන් වී තිබීම ය:

**"(අල්ලාහ් මා) මගේ මෑණියන්ට උවටැන් කරන්නෙකු ද කෙළේ ය. මා උඩඟු කෙනෙකු ද කාල කන්නියෙකු ද නොකෙළේ ය."**

යේසුස් වහන්සේගේ අපහාසයට අනෙක් අය ලක් වූ බව බයිබලයේ, ශු. මතෙව් 7:6 වෙනි වාක්‍යය කියයි:

**"ශුද්ධ දේ බල්ලන්ට නොදෙල්ලා. නුඹලාගේ මුතු ඌරන් ඉදිරියෙහි නොදමල්ලා. සමහරවිට උන් ඒවා පයින් පාගා හැරී නුඹලා ඉරාදමන්ට පුළුවන."**

තව ද, බයිබලයේ, ශු. යොහන් 2:4 වාක්‍යයෙහි මෙසේ ඇත.

**"යේසුස් වහන්සේ ද (තම මව අමතා) ස්ත්‍රිය ! නුඹෙන් මට කම මොක ද?"**

වක්තෘවරයෙක් මෙසේ කථාකරන බව කවරෙකුට විශ්වාස කළ හැකි ද?

# 15 - වක්තෘවරයාණන් වූ මුහම්මද් (සල්) තුමාට අනාවරණය වූ දේව වාක්‍ය !

අල්ලාහ්, මලාඉකාවරයා වූ ගේබ්‍රියෙල් ගේ මාර්ගයෙන් මුහම්මද් (සල්) තුමාට අනාවරණය කළ පළමු වදන "ඉක්රඃ"[265] නම් වේ. මෙම වදනෙහි තේරුම "පාරායනා කරන්න" යන්න ය. මුහම්මද් (සල්) තුමා අකුරු නොදන්නා කෙනෙකු හෙයින් "මම පාරායනා කිරීමට නුපුළුවන් කෙනෙක් මි" යි පිළිතුරු දුන් හ. මෙම පළමු අනාවරණය පිළිබඳ අනාවැකියක් බයිබලයෙ හි ඇත.

එම අනාවැකිය මෙසේ ය:

**"අකුරු නොදන්නා කෙනෙකුට ලියවිල්ල දී : මේක කියවාපන් නැයි කීවා ම-මම අකුරු නොදනිමියි ඔහු කියන්නේ ය."[266]**

දේව වාක්‍ය අනාවරණය වූ පිළිවෙළ, දැනට අල්කුර්ආනයෙහි පෙනෙන්නට ඇති පිළිවෙළින් වූයේ නැත. මෙය වෙනත් ආකාරයකින් කියන්නේ නම්, පළමු ව අනාවරණය වූ කොටස පළමු පිටුවෙහි ද අවසාන වශයෙන් අනාවරණය වූ කොටස අවසාන පිටුවෙහි ද නොතිබේ. මෙම දේව වාක්‍ය කොටස් වශයෙන් අනාවරණය කරනු ලැබූ අතර අල්ලාහ් නියම කළ පරිදි යම් විශේෂ පිළිවෙලකට කුර්ආනයෙහි සකස්කොට ඇත. මේ පිළිබඳව ද බයිබලය සඳහන් කරයි:

265. අල්කුර්ආන් 96:1

266. බයිබලයේ, යෙසායා 29:12

**"මක්නිසාද අණ පිට අණය, අණ පිට අණය: පනත පිට පනතය, පනත පිට පනතය: මෙහි ටිකක් ය, එහි ටිකක් ය, එසේ ය, උන්වහන්සේ වියවුල් තොල්වලින් ද වෙන භාෂාවකින් ද මේ සෙනගට කථා කරනවා ඇත."[267]**

මෙම වාක්‍යයෙහි 'වෙනත් භාෂාවක්' යැයි සඳහන් කරනු ලබන්නේ 'හෙබ්‍රෙව්' භාෂාව හෝ 'අරමයික්' භාෂාව හෝ නොවෙයි: අරාබි භාෂාව ය.

ලොවෙහි එක් කොණක සිට අනෙක් කොණ දක්වා වෙසෙන කෝටි සංඛ්‍යාත මුස්ලිම් ජනයා එක ම සත්‍ය දෙවියන් අමතන විටත්, ඔහුට යාච්ඤා ඉටුකරන විටත්, හජ් කර්තව්‍යය ඉටුකරන විටත්, එකිනෙකා අතර ආමන්ත්‍රණය කරන විටක් එක ම භාෂාවක් - එනම් අරාබි භාෂාව භාවිතා කරති.

මෙම භාෂා සමගිය පිළිබඳ ව ද බයිබලයෙහි අනාවැකියක් සඳහන් වී ඇත.

**"එකල සියලු ජනයන් ස්වාමීන් වහන්සේගේ නාමයට යාච්ඤාකොට, එක්සිත් ව උන්වහන්සේට සේවය කරන පිණිස, ඔවුන්ට පවිත්‍ර භාෂාවක් දෙන්නෙමි."[268]**

අවසාන වශයෙන්, දැන් සත්‍යය අරාබි භාෂාවෙන් ලැබී ඇත. (එහි විශ්වාසය නොතබා) වක්තෲවරයාණන් වූ යේසුස් වහන්සේ දෙවෙනි වතාවත් පැමිණ, මානව සංහතිය එක ම විශිෂ්ඨ භාෂාවකින් අල්ලාහ් ට නැමදීම ඉටුකරන්න උගන්වන බවට සමහරු බලාපොරොත්තු වෙති.

එහෙත්, වක්තෲවරයාණන් වූ යේසුස් වහන්සේ නැවතත් මෙලොව පැමිණි විට මුස්ලිම්වරුන් සමග එක් වී මස්ජිදයෙහි (මුස්ලිම් දේවස්ථානයෙ හි) යාච්ඤාවෙහි යෙදෙන බවත්, මුස්ලිම්වරුන් මෙන් චර්මඡේදනය කරගන්නා බවත්, ඌරුමස් අනුභව නොකරන බවත්, වුළු දෝවනය කොට සිටගෙන ද, හිස නමා ද, හිස පොළොවෙහි තබා ද, සලාත් ඉටුකරන බවත් මුස්ලිම්වරුන් වන අපි තරයේ විශ්වාස කරන්නෙමු.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★

267. බයිබලයේ, යෙසායා 28: 10,11

268. බයිබලයේ, ශෙපනියා 3:9

මෙම පොතේ අනේක තැන් හි ඊමාන්, ඊමාන්ධාරීන්, මුඃමින්වරු යන වචන ඇත. ඊමාන්" යන්නෙ හි තේරුම "විශ්වාසය" නම් වේ. ඊමාන්ධාරීන් හෝ මුඃමින්වරු හෝ කියන්නේ 'විශ්වාසකයෝ' යන අදහසිනි.

ඉස්ලාමීය ඉගැන්වීම් අනුව පහත සඳහන් ප්‍රධාන කරුණු හයම විශ්වාස කිරීම 'ඊමාන්' යැයි කියනු ලැබේ; එම විශ්වාසය ඇත්තා මුඃමින් වෙයි.

| | | | |
|---|---|---|---|
| | අරාබි භාෂාවෙන් කියවෙන මෙය සිංහලට නහා මෙසේ කියන්න. | | මේවායේ තේරුම |
| 1. | ආමන්තුබිල්ලාහි | - | අල්ලාහ්ගේ ඒකීයභාවය |
| 2. | ව මලාඉක්කතිහී | - | (ඔහුගේ) මලාඉකාවරු |
| 3. | ව කුතුබි හී | - | (ඔහුගේ) ධර්මග්‍රන්ථ |
| 4. | ව රුසුලිහී | - | (ඔහුගේ) නබි (වක්තෘ) වරු |
| 5. | වල් යව්මිල් ආ හිර් | - | විනිශ්චය දිනය |
| 6. | වල්කද්රි හයිරිහී වසර්රිහි මිනල්ලාහි තආලා | - | හොඳ නොහොඳ සියල්ලම අල්ලාහ්ගේ පෙරම්නුම අනුව සිදුවෙයි. |

මෙම පොතේ වරහන් තුළ යොදා ඇති කෙටි අක්ෂර මුළුමනින් උච්චාරණය කළයුතු ආකාරය හා ඒවායේ තේරුම පහත සඳහන් වෙයි.

1. **(සල්) සල්ලල්ලාහු අලෛහි වසල්ලම්**
   (අල්ලාහ්ගේ ශාන්තිය හා ආශිර්වාද එතුමාට ලැබේවා!)

2. **(අලෛ) අලෛහිස්සලාම්**
   (අල්ලාහ්ගේ ශාන්තිය එතුමාට ලැබේවා!)

3. **(රලි) රලියල්ලාහු අන්හු (පිරිමින්)**

4. **(රලි) රලියල්ලාහු අන්හා (ස්ත්‍රීන්)**
   (අල්ලාහ්ගේ කරුණාව එතුමාට/ එතුමියට ලැබේවා!)

5. **(රහ්) රහ්මතුල්ලාහි අලෛහි**
   (අල්ලාහ්ගේ කරුණාව එතුමාට ලැබේවා!)

# REFERENCES


1. *Explanatory English Translation of Holy Qur 'an by Dr' Mohammad Taqui-Din Al-Hilali and Dr. Muhammad Muhsin Khan.*
2. *The Holy Bible, King James Version, authorized 1611*
3. *The Holy Bible, Revised Standard Version*
4. *New World Translation of the Holy Scriptures : Jehovah's Witnesses Church*
5. *New American Standard Bible.*
6. *The Myth of the Cross, by A. D. Ajijola*
7. *The Cross and the Crescent. by Maulana Muhammad Imran.*
8. *Davis dictionary of the Bible, 1980*
9. *The International Standard Bible Encyclopedia*
10. *Smith's Bible Dictionary. 1980*
11. *Encylopedia Britanica, 1980*
12. *Muhammad in the Bible, by Prof, Abdu'L-Ahad Dawud*
13. *uhammad in the Bible, Ahmed Deedat*
14. *Jesus, A Prophet of Islam, by Sulainman Shahid Mufassir*
15. *Biblical Studies from Muslim Perspectives, by S. Mufassir*
16. *Muhammad in the Bible, by Jamal Badawi Al lttihad january - March, 1982*

ⓒ المكتب التعاوني للدعوة والإرشاد بالبديعة ، ١٤١٦هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

باقل ، محمد

حوار بين مسلم ونصراني/ ترجمة شريف الدين محمد
منصور.
١٣٤ ص ؛ ١٤ × ٢١ سم
ردمك ٣ - ٢٦ - ٧٩٩ - ٩٩٦٠
النص باللغة السنهالية
١. الإسلام والمسيحية ٢. الديانات المقارنة
٣. الوعظ والإرشاد أ. محمد منصور،
شريف الدين (مترجم) ب. العنوان

ديوي ٢١٤.٢٧ ١٦/١٠٢٣

رقم الايداع : ١٦/١٠٢٣
ردمك: ٣ - ٢٦ - ٧٩٩ - ٩٩٦٠

# حوار بين مسلم ونصراني

تأليف

## حســـن باقـــل

ترجمة للسنهالية

**شريف الدين محمد منصور**

حقوق الطبع ميسرة لكل مسلم يريد توزيعه لوجه الله
أما من أراد بيعه فعليه الإتصال بالمكتب هاتف : ٤٣٣٠٤٧٠ - ٤٣٣٠٨٨٨

سنهالي - ٢٠٧

# حوار بين مسلم ونصراني

تأليف

حسن باقل

ترجمة

شريف الدين محمد منصور

ردمك: ٩٩٦٠-٧٩٩-٢٦-٣

The Co-operative office for Call & foreigners Guidance at Sult...

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف: ٤٢٤٠٠٧٧ ناسوخ: ٤٢٥١٠٠٥ ص ب ٩٢٦٧٥ الرياض ١١٦٦٣ بريد إلكتروني E.mail : Sultanah22@hotmail.com